

# නෙත්තිප්‍රදීපය

# NETTIPPRADEEPAYA.

# නෙත්තිප්‍රදීපය,

බුද්ධශාසන මහාසුර සෙනාපති
ඇම්. ධර්මරත්න ලක්මිණිපහන් කතෘතුමන්ගේ
වාචනාමාගෞපනිශ්‍රයෙන්
පරමධම්මචෛතිය පරිවෙණාධිපති
ආචාර්ය්‍ය ධර්මානන්ද ස්ථවිරයන්වහන්සේගේ
ධර්මාන්තේවාසිවූ
මිහිරිපැන්නේ අරියාකර විහාරාධිපතිව වැඩවිසූ
පරමකවිතිලක ශ්‍රී සුමනතිස්සාභිධාන
ගණනායක ස්ථවිරපාදයන්ගේ
ප්‍රධානාන්තේවාසිවූ
රත්මලාණේ ධර්මාරාම ස්වාමීන් විසින්
සඞ්ග්‍රහකරණලදී.

මාදම්පේ සිරිවඩ්ඪනාරාමාධිපති
ආචාර්ය්‍ය ධම්මතිලක මහාස්වාමිපාදයන් විසින්
ස මා රා ධි ත යි.

ආර්. ජ්. ජොහැන්නැස් ප්‍රනාන්දු විසින්
කොළඹ ලක්මිණිපහන් යන්ත්‍රාලයේ
මුද්‍රණය කරවනලදී.

බුද්ධ වර්ෂ 2444
ක්‍රිස්තු වර්ෂ 1900.

# අනුක්‍රමණිකා.


| පිට | පෙළ | කාරණය. |
|---|---|---|
| 1 | 1 | නිදානගාථා |
| 2 | 11 | නිදානගාථා සන්නය |
| 21 | 12 | නෙත්තිශබ්දයෙහි නිර්වචන හා නෙත්ති නිදානකථාව |
| 30 | 1 | සොළසහාරය |
| „ | 19 | ආශ්වාද විභාගය |
| 31 | 1 | ආදීනව විභාගය |
| „ | 28 | නිඃස්සරණ විභාගය |
| 32 | 19 | ඵල විභාගය |
| 33 | 7 | උපාය විභාගය |
| „ | 16 | ආණත්ති විභාගය |
| „ | 23 | දෙශනාහාරය |
| 36 | 6 | විචයහාරය |
| 39 | 25 | යුත්තිහාරය |
| 40 | 20 | පදට්ඨානහාරය |
| 41 | 30 | ලක්ඛණහාරය |
| 42 | 20 | චතුබ්‍යූහහාරය |
| 46 | 15 | ආවට්ටහාරය |
| 47 | 11 | විභත්තිහාරය |
| 48 | 17 | පරිවත්තනහාරය |
| 49 | 1 | වෙවචනහාරය |
| „ | 18 | පඤ්ඤත්තිහාරය |
| 50 | 17 | ඔතරණහාරය |
| 51 | 5 | සොධනහාරය |
| „ | 32 | අධිට්ඨානහාරය |
| 52 | 22 | පරික්ඛාරහාරය |
| 53 | 22 | සමාරොපනහාරය |
| 55 | 33 | නන්ද්‍යාවර්තන්‍යාය |
| 58 | 1 | තිපුක්ඛලන්‍යාය |
| 59 | 23 | සීහවික්කීළිතන්‍යාය |
| 60 | 36 | දිසාලොචනන්‍යාය හා අංකුසන්‍යාය |
| 61 | 27 | සාසනපට්ඨානනය |
| 63 | 32 | හාරානු ක්‍රමහෙතුව |
| 65 | 1 | වාක්‍යාවයවපඤ්චකය |
| 68 | 16 | ත්‍රයත්‍රිංශත් තන්ත්‍රයුක්තීහු |
| 71 | — | දෙශනා, විචය, යුත්ති |
| 72 | — | පදට්ඨාන, ලක්ඛණ, චතුබ්‍යූහ |
| 73 | — | ආවට්ට, විභත්ති, පරිවත්තන, වෙවචන |
| 74 | — | පඤ්ඤත්ති, ඔතරණ, සොධන |
| 75 | — | අධිට්ඨාන, පරික්ඛාර, සමාරොපන |
| 76 | — | නන්ද්‍යාවර්ත, තිපුක්ඛල, සීහවික්කීළිත |
| 77 | — | දිසාලොචන, අංකුස, ශුද්ධිපත්‍රය |

# නෙත්තිප්‍රදීපවිඥප්තිය.

වෛදූන්තයාගේ ලීනාර්ථාවබෝධය පිණිස ගෞතම මහර්ෂීනු විසින් රචනා කරණලද බාහිර න්‍යාය ශාස්ත්‍රයමෙන් සූත්‍රාන්තයාගේ ලීනාර්ථාවබෝධය පිණිස මහා ශ්‍රාවකොත්තම මහා කාත්‍යායන සර්විරයන්වහන්සේ විසින් රචනා කරණලද ධර්ම ශාස්ත්‍රය බෞද්ධ න්‍යාය ශාස්ත්‍රයි ඒ මේ බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය නෙත්ති පෙටකොපදෙශ යන ප්‍රකරණවයකින් හා මිහියාර්ථකථාචාර්‍ය්‍ය බදරතීර්ථ ධර්මපාල මහා ස්වාමිපාදයන් විසින් කරණලද නෙත්ති අර්ථකථාවෙන්ද ඥාණාභිවංශ ධම්මසෙනාපති සංඝරාජ මහාස්ථවිරපාදයන් විසින් රචනාකරණලද සඞ්ඛෙපසුදනී නම් ටීකාවකින්ද ආචාර්‍ය්‍යවරයන් විසින් කරණලද නෙත්ති පදයොජනාදි ග්‍රන්ථරාශියකින්ද සමුපෙතයි.

“සාසනස්ස සදානන්තා නවඞ්ගස්සත්ථ වණ්ණනා,,

යන අර්ථකථාචාර්‍ය්‍ය වචනයෙන් සූත්‍රගෙය්‍යාදී නවාඞ්ග ශාසනයාගේ අර්ථවර්ණනාව හැම්කල්හිම නෙත්ති න්‍යාය අයත්කොට ඇතිබව පෙණේ එබැවින් නෙත්ති න්‍යාය නොදන්න යමෙක් නවාඞ්ග ශාස්තෘ ශාසනයාගේ අර්ථවර්ණනා කරන්ට උත්සාහකරන්නේනම් හාස්‍යසින්ම ඒ උත්සාහය ව්‍යර්ථවේ සාසනාවචර කුලපුත්‍රයන් විසින් පළමුකොට යහපත් ගුරු ආශ්‍රයෙන් කාත්‍යායනාදියෙන් ව්‍යාකරණ ශාස්ත්‍රයත් සද්දසාරත්ථජාලිණී ආදියෙන් නිරුක්ති ශාස්ත්‍රයත් අභිධර්මාර්ථ සඞ්ග්‍රහා දියෙන් අභිධර්ම ක්‍රමයත් මනාකොට ඉගෙණ තදනන්තරව නෙත්තිප්‍රකරණයෙන් බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය ඉගෙණ ඊට අනතුරුව නවාඞ්ග ශාස්තෘ ශාසන සංඛ්‍යාත සූත්‍රාන්තයාගේ අර්ථවර්ණනාව කටයුතුයි. මෙම පිළිවෙළ ඉක්මවා කෙබඳු ඉගෙණීමකින්වත් සර්වඥභාෂිතයාගේ අර්ථවර්ණනාව නොකළහැකිවේ, සාරාසඞ්ඛ්‍යකල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි පුරණලද පාරමිතා සම්භාර ඇත්තාවූ සර්වඥතාඥානය අවබෝධකරගත් සර්වඥවරයන්ගේ නානානය විචිත්‍ර පරමගම්භීර ශ්‍රීසද්ධර්මය පාළි සංස්කෘතාදී භාෂා මාත්‍රයක් ඉගෙණගත් ශක්තියෙන් අර්ථවර්ණනා නොකළහැකිබව ප්‍රත්‍යක්‍ෂ කාරණයකි, සර්වඥයන්වහන්සේගේ දෙශණාව අනාවිලොදකයෙහි ගම්භීරස්ථානයක් මෙන් ශ්‍රවණ මාත්‍රයකින් උත්තානාර්ථයයි හැඟෙතුදු නානා නයින් අර්ථවර්ණනාකරන්ට පටන්ගත්කල්හි මන්ද බුද්ධීන්ට අවිෂයවූ ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි ප්‍රඥාසම්පන්න සුධිජනයන්ටම විෂයවූ ගම්භීර ධර්මයක් බව හැගේ අර්ථකථාචාරීන් වහන්සේ පළමුකොට සීලසමාධි ප්‍රඥා යන ස්කන්ධත්‍රයට අයිති සකල අර්ථරාශිය විසුද්ධිමාර්ගයෙන් වර්ණනාකොට නිකායාර්ථවර්ණනාවන්ට බැස ඒ ඒ අර්ථයන් විසුද්ධිමාර්ගයෙන් දතයුතුයයි. අර්ථය ලී බැවින් ත්‍රිපිටකඅර්ථකථාවන්ගේ ග්‍රන්ථබාහුල්‍ය දෝෂයෙන් මුක්තකොට අර්ථ පාඨ ලීවාක්මෙන් නවාඞ්ග ශාස්තෘ ශාසනයාගේ සාධාරණ අර්ථවර්ණනා ක්‍රමය මම නෙත්තිප්‍රකරණයෙහිම ඇතුළත්කොට මහා කාත්‍යායන ස්ථ

ථෙරයන් විසින් මේ නෙත්තිප්‍රකරණය වදාරණලදී මෙසේ නොකොට
ධර්මස්කන්ධයක් පාසා නෙත්ති න්‍යාය ක්‍රමය යොදා අර්ථකථාටීකා ලිවා
හුනම් ඒ පොත් රාශිය වෛපුල්‍ය පර්වතය තරම්වූ පොත් රාශියක්වේ
එබැවින් සූත්‍රාන්තයාගේ අර්ථවර්ණනා කරණු කැමති කුලපුත්‍රයන්
විසින් නෙත්ති න්‍යාය මනාසේ ඉගෙණ එකෙකී ධර්ම පදයක් පාසා
සොළස හාර පඤ්චවිධනය ක්‍රමය එළවමින් අර්ථවර්ණනා කටයුතුයි,
අපේ මේ නෙත්තිප්‍රදීප ප්‍රකරණය මරම්මදෙශවාසී අවිච්ඡින්න මහාවි
හාරවංශානුයාත ත්‍රිපිටකධාරී මහා සව්විරොතනාමයන් විසින් නෙ
ත්ති න්‍යාය ඉගැන්වීම පිණිස මුඛමාත්‍රයක් දක්වීම් වශයෙන් ව්‍යව
හාරකාරගෙණ එන්නාවූ ක්‍රමයට අනුව සියළු දෙනා අතර ප්‍රකටවූ
මඞ්ගල සූත්‍රයෙහි "පූජාච පූජනීයානං" යන එකම ධර්මපදයක් උදාහ
රණකොට සොළස හාරයන්ගේ හාරසම්පාතවාරය හා පඤ්චවිධනය
ක්‍රමයද ඉතා සංක්ෂේපකොට දක්වූයෙමු සියළු හාරනය ක්‍රමයන් එක
ම ධර්මපදයක් උදාහරණකිරීමෙන් සියළු ධර්මපදයක් පාසා සියළුහාර
නය ක්‍රමයන් යෙදෙනබව සැළකියයුතුයි එහෙයින් පළමුකොට මේ
නෙත්තිප්‍රදීපයෙහි ආනයින් සොළසහාර පඤ්චවිධනය ක්‍රමයන් ඉ
ගෙණ ඊට අනතුරුව නෙත්තිප්‍රකරණය ඉගෙණ ගන්නෝ වීනම්
නිරායාසයෙන් නෙත්තිප්‍රකරණය ඉගෙණගත හැකිවේ. විනය පිට
කයට උභයමාතෘකාවත් අභිධර්ම පිටකයට අභිධර්මාර්ථ සංග්‍රහයත්
ඒ පිටකයන්ගේ නය ක්‍රමය සැකෙවින් දැණගැණීමට උපකාරවන්
නාක් මෙන් මේ නෙත්තිප්‍රදීපය ද නෙත්තිනය දැනගැණීමට උප
කාරවේ ප්‍රඥසම්පන්නයන්ට මේ "නෙත්තිප්‍රදීපය" ඉගෙණ මෙම නය
මුඛය දැනගැණීමෙන්ම ආචාර්යෝපනිශ්‍රය විරහිතව නෙත්තිප්‍රකර
ණය ඉගෙණීමට පවා උපනිශ්‍රය ලැබේ යයි සිතමු මේ නෙත්තිප්‍රදීප
නෙත්තිප්‍රකරණයන්ගේ අර්ථාවබොධයකළවුන්ට පෙටකොපදෙශ
යෙහි නොතේරෙණ අර්ථනොලැබෙන හෙයින් පුරාතනාචාර්ය වර
යන් විසින් ඊට අටුවාටීකා නොලියන ලද්දේය. නවාඞ්ග ශාස්තෘ ශා
සනයාගේ අර්ථවර්ණනාව නෙත්තිනය අයත්කොට ඇතැයි කිනමුත්
වර්තමානකාලයෙහි මේ ක්‍රමය හාත්පසින් ලක්දිව අතුරුදන්වීගොස්
තිබෙන බැවින් ලඞ්කාද්වීපවාසී සියළු නිකායික ආචාර්යවරයින්ව
හන්සේලා විසින් මේ සංක්ෂේප ක්‍රමය උපනිශ්‍රයකොට ගෙණ තම
තමන්ගේ අතවැසියන්ට සොළසහාර පඤ්චවිධනය ක්‍රමයන් ඉගැන්වී
ම ආරම්භකරණ මෙන් යාඥාකරමහ මේ ක්‍ෂුද්‍ර ප්‍රකරණයෙන් සොළ
ස හාරනය ක්‍රමයන් ඉගැන්වීමට උත්සාහගන්නා සැපිබලා නැවත
නෙත්තිප්‍රකරණයටද විශිෂ්ට අර්ථව්‍යාඛ්‍යානයක් මෙසේම අපගේ
ආචාර්ය මතාවලම්බනයෙන් ලියා ප්‍රසිද්ධකරවන්නටද උත්සාහකර
ණ බව දතයුතුයි. මම්වගට

මිකිරිපැන්නේ අරියාකර විහාරාධිවාසී
රත්මලානේ ධම්මාරාම උන්නාන්සේය.

# නෙත්තිප්‍රදීපය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1 මහාකාරුණිකං නාථං ඤෙය්‍යසාගරපාරගුං,
වන්දෙ නිපුණගම්භීරවිචිත්‍රනයදෙසනං.

2 විජ්ජාචරණසම්පන්නා යෙන නීයන්ති ලොකතො,
වන්දෙ තමුත්තමං ධම්මං සම්මාසම්බුද්ධපූජිතං.

3 සීලාදිගුණසම්පන්නො ඨිතො මග්ගඵලෙසු යො,
වන්දෙ අරියසඞ්ඝං තං පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං.

4 වන්දනා ජනිතං පුඤ්ඤං ඉති යං රතනත්තයෙ,
හතන්තරායො සබ්බත්ථ හුත්වාහං තස්ස තෙජසා.

5 ඨිතිමාකඞ්ඛමානෙන චිරං සද්ධම්මනෙත්තියා,
ධම්මරක්ඛිතනාමෙන ථෙරෙන අභියාචිතො.

6 පදුමුත්තරනාථස්ස පාදමූලෙ පවත්තිතං,
පස්සතා අභිනීහාරං සම්පත්තං යස්ස මත්ථකං.

7 "සංඛිත්තං විභජන්තානං එසො අග්ගො" ති තාදිනා,
ඨපිතො එතදග්ගස්මිං යො මහාසාවකුත්තමො.

8 ඡළභිඤ්ඤො වසිප්පත්තො පභින්නපටිසම්භිදො,
මහාකච්චායනො ථෙරො සම්බුද්ධෙන පසංසිතො.

9 තෙන යා භාසිතා නෙත්ති සත්ථාරා අනුමොදිතා,
සාසනස්ස සදායත්තා නවඞ්ගස්සත්ථවණ්ණනා.

10 තස්සා ගම්භීරඤාණෙහි ඔගාහෙතබ්බභාවතො,
කිඤ්චාපි දුක්කරා කාතුං අත්ථසංවණ්ණනා මයා.

11 සහසංවණ්ණනං යස්මා ධරතෙ සත්ථුසාසනං,
පුබ්බාචරියසීහානං තිට්ඨතෙව විනිච්ඡයො.

12 තස්මා තං උපනිස්සාය ඔගාහෙත්වාන පඤ්ච පි,
නිකායෙ පෙටකෙනාපි සංසන්දිත්වා යථාබලං.

13 සුවිසුද්ධමසංකිණ්ණං නිපුණත්ථවිනිච්ඡයං,
මහාවිහාරවාසීනං සමයං අවිලොමයං.

14 පමාදලෙඛං වජ්ජෙත්වා පාළිං සම්මා නියොජයං,
උපදෙසං විභාවෙන්තො කරිස්සාමත්ථවණ්ණනං.

15 ඉතිඅත්ථං අසංකිණ්ණං නෙත්තිප්පකරණස්ස මෙ,
විභජන්තස්ස සක්කච්චං නිසාමයථ සාධවො.

යනුවෙන් නෙත්තිප්‍රකරණාර්ථකථාචාර්‍ය්‍යවූ විශුද්ධබුද්ධීන් ප්‍රසිද්ධ ආචාර්‍ය්‍ය ධර්‍මපාල මහාස්වාමිපාදයෝ පළමුකොට රත්නත්‍රය ප්‍රණාම යකොට තදනන්තරව නෙත්තිනයාර්ථවර්ණනාව ආරම්භකළෝ.

(1) මහාකාරුණිකං, මහාකරුණාසමාපත්තියක් ඇත්තාවූ; ඤෙය්‍යසාගරපාරගුං—ඤෙය්‍යසාගර, පඤ්චවිධඥෙයමණ්ඩලසඞ්ඛ්‍යාත නයසාගරයාගේ ( හෙවත් අටළොස් නිෂ්පන්නරූපය එකුන්අනූවක් චිත්තය දෙපණස්චෛතසිකය යන මොවුන්ගේවශයෙන් එක්සැත් තෑවක්ප්‍රභේදඇති සංස්කාරධර්‍මයෝය. කායවිඥප්තිරූපය වාග්විඥප්තිරූපය ලඝුතාරූපය මුදුතාරූපය කර්‍මණ්‍යතාරූපය යනපඤ්චප්‍රකාර විකාරධර්‍මයෝය. ජාතිජරා මරණසංඛ්‍යාත ත්‍රිවිධලක්‍ෂණධර්‍මයෝය. ශාන්තිපදසංඛ්‍යාත නිර්‍වාණධර්‍මය. පුද්ගල ස්ත්‍රීපුරුෂාදී ඒ ඒ ව්‍යවහාර සංඛ්‍යාත ප්‍රඥප්තිධර්‍මය. යනමේ සංස්කාර විකාරලක්‍ෂණ නිර්‍වාණප්‍රඥප්ති සංඛ්‍යාත පඤ්චවිධඥෙයමණ්ඩලනැමති නයසාගරයාගේ ) පාරගුං, පරතෙරටගියාවූ; නිපුණගම්භීරවිචිත්‍රනයදෙසනං, සූක්‍ෂ්මාතිසූක්‍ෂ්මතර ගම්භීරවිචිත්‍රනය ක්‍රමයෙන්යුත් දෙශනාඇත්තාවූ; විජ්ජාචරණසම්පන්නං, විද්‍යාචරණධර්‍මයෙන් සමන්වාගතවූ(හෙවත් භයභෙරවසූත්‍ර තිකණ්ණසූත්‍ර ජාණුස්සොණිසූත්‍රාදියෙහි ආක්‍රමයෙන් පූර්‍වෙනිවාසානුස්මෘතිඥානය දිව්‍යචක්‍ෂුරභිඥානය ආශ්‍රවක්‍ෂයකරඥානය යන ත්‍රිවිද්‍යාවෙන්හා අම්බට්ඨසූත්‍රාදියෙහි ආක්‍රමයෙන් විදර්ශනාඥානයෙන් හා "ඉධ භික්ඛු ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං" ‡ යනාදීක්‍රමයෙන් ආවාවූ මනොමය ඍද්ධියෙන් හා ෂඩ්අභිඥාවෙන්ද යන අෂ්ටවිද්‍යාවෙන්හා සීලසංවරය ඉන්ද්‍රියසංවරය භොජනයෙහි මාත්‍රඥතාවය ජාගරියානුයොගය ශ්‍රද්ධාය හිරි ඔත්තප්පය බාහුසච්චය වීර්‍ය්‍යය ස්මෘතිය ප්‍රඥාය සතරඅරූපධ්‍යාන

‡ අහිනින්ද්‍රියං ඊ කලකපටන් වරදවාගෙණ ආයේය.

යෝය යන පසළොස්චරණධර්මයෙන්ද අභිඥාශීලාභයෙහි පටන් මොනමටයුක්තවූ ) නාථං, අසරණසරණවූ සර්වඥයන්වහන්සේ; වන්දෙ, නමස්කාරකෙරෙමි.

( 2 ) යෙන, යම් නවලොකොත්තර ශ්‍රීසද්ධර්මයක් කරණකොට ගෙණ; ලොකතො, ලුජ්ජනපලුජ්ජනාර්ථයෙන් ලොකනම්වූ උපාදාන ස්කන්ධසංඛ්‍යාත ලොකයෙන්; නීයන්ති, සංසාරනිමග්නවූ සත්වප්‍රජාව නිර්වාණසංඛ්‍යාත අභයපුරයට පමුණුවද්ද; සම්මාසම්බුද්ධපූජිතං, සම්‍යක් සම්බුද්ධයන්විසින් පුදනලද; තං උත්තමං ධම්මං, ඒ උතුම්වූ නවලොකොත්තර ශ්‍රී සද්ධර්මයද; වන්දෙ, නමස්කාර කරමි ( මෙහි සත්වයාගේ සංසාර තරණය කිරීමට හෙතුවන්නේ සතරමාර්ග ධර්මයයි, එහෙයින් "යෙනනීයන්ති ලොකතො" යන පදයෙන් සතරඵලය හා නිර්වාණයද පර්යාප්තියද නොගැණේ එහෙයින් ඛුද්දකපාඨ අටුවාවෙහි "ධම්මං සරණං ගච්ඡාමි" යන පෙදින් සරණගතවන්නේ සතරමාර්ග ධර්මයයි කියනලදී එහෙයින් සතරමාර්ග ධර්ම නිෂ්පර්යාය වශයෙන් හා සතර ඵලය හා නිර්වාණ පර්යාප්ති ධර්මයෝ පර්යාය වශයෙන්ද ධර්මනම් වෙත්යයි දතයුතුයි. )

( 3 ) සීලාදිගුණ සම්පන්නො, සීලස්කන්ධ සමාධිස්කන්ධ ප්‍රඥා ස්කන්ධ යන ස්කන්ධත්‍රයෙහි සංගෘහීත ගුණ සමූහයෙන් යුක්තවූ; මග්ග ඵලෙසුඨිතො, සතරමග සතරඵලයෙහි පිහිටියාවූ; යො, යම් අෂ්ටාර්‍ය පුද්ගල සඞ්ඝරත්නයක් වේද; තං අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං, ඒ නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රවූ; අරියසංඝං, ආර්‍ය සඞ්ඝරත්නය; වන්දෙ, නමස්කාර කරමි.

ග්‍රන්ථාරම්භයට අනුකූලවූ යම් මේ ථොමනාවක් වේද ඒ වනාහි පුරාතනාචාර්‍යවරයන්ගේ ප්‍රකෘතියකි ඒ එසේමැයි විනය දෙශනා සංවර්ණනාරම්භයෙහි-

"යො කප්පකොටීහිපි අප්පමෙය්‍යං කාලං කරොන්තො අතිදුක්කරානි ඛෙදං ගතො ලොකහිතාය නාථො නමො මහාකාරුණිකස්ස තස්ස"

යනුවෙන් කාරුණ්‍ය ප්‍රධාන වශයෙන්ද අභිධර්ම දෙශනා සංවර්ණනාරම්භයෙහි-

"කරුණා වියසත්තෙසු පඤ්ඤා යස්ස මහෙසිනො,
ඤෙය්‍යධම්මෙසු සබ්බෙසු පවත්තිත්ථ යථාරුචි"

යනුයෙවන් ප්‍රඥාප්‍රධාන වශයෙන්ද සූත්‍රාන්තදේශනා සංවර්ණනා රම්භයෙහි–

"කරුණාසීතලහදයං පඤ්ඤාපජ්ජෝතවිහතමොහතමං
සනරාමර ලෝකගරුං වන්දේ සුගතං ගතිවිමුත්තං"

යනුයෙවන් කරුණා ප්‍රඥා දෙකෙහි ප්‍රධානවශයෙන්ද යොමනය කෙරෙත් විනය දේශනාව වනාහි මහා කාරුණිකවූ භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණාවෙන් මෙහෙයන ලද සිත් ඇතිව ශික්ෂාපද පැණවූ හෙයින් විනය දේශනාවට කරුණාව ප්‍රධාන වන්නීය, අභිධර්ම දේශනාව වනාහි පරමාර්ථ ධර්මයන්ගේ යථාස්වභාව ප්‍රතිවේධයෙහි සමර්ථවූ ප්‍රඥාව ඒ අභිධර්මපිටකයෙහි සාතිශය වශයෙන් පවත්නා හෙයින් අභිධර්මදේශනාතොමෝ කෙවල ප්‍රඥාව ප්‍රධානකොට ඇත්තීය. සූත්‍රාන්ත දේශනාව වනාහි ඒ ඒ සත්ත්වයන්ගේ ආශයානුශයාධිමුක්ති ප්‍රභේදයන් පිරිසිඳීමෙහි සමර්ථවූ ප්‍රඥාව හා සත්ත්වයන් කෙරෙහි පැවති මහා කාරුණාවද ඒ සූත්‍රපිටකයෙහි සාතිශයෙන් පවත්නා හෙයින් සූත්‍රාන්තදේශනා තොමෝ කාරුණාව හා ප්‍රඥාව ප්‍රධානකොට ඇත්තීය. සූත්‍රාන්ත දේශනාවෙහි මහා කරුණා සමාපත්ති බහුලවූ සර්වඥයන්වහන්සේ විනේයජන සන්තානයෙහි තදධ්‍යාශයානුලෝමයෙන් ගම්භීර අර්ථපදයන් පිහිටවාලූහ මෙහි වනාහි මේ නෙත්ති තොමෝ පිටකත්‍රය සන්නිශ්‍රයවූ ඒ පිටකත්‍රයාගේ විචිත්‍රාකාර අර්ථ ප්‍රවෘත්තිය ප්‍රකාශකරන්නී වෙයි. එහෙයින්ම නෙත්තිප්‍රකරණයෙහි 'තස්සායං ආනුපුබ්බීනවවිධසුත්තන්තපරියෙට්ඨි" යනාදිය හා අර්ථකථාවෙහි "සාසනස්ස සදෙසනා නවඞ්ගස්සෙව වණ්ණනා" යනාදිය වක්ෂ්‍යමාණ බැවින් වර්ණනාකටයුතුවූ අර්ථයට අනුකූල පරිද්දෙන් කරුණා ප්‍රඥාවය මුල්කොට ප්‍රණාමය කරණලද්දේයයි ඇතැම් ආචාර්යවරයෝ කියත්. අන්‍යාචාර්යවරයෝ වනාහි මේ නෙත්තිතොමෝ සර්වඥභාෂිතයාගේ අර්ථප්‍රකාශකරන්නීද නොවෙයි මෙහි වනාහි සංවර්ණනා කටයුතු ධර්මයාගේ ප්‍රධාන භාව විචාරණ යද යෝග්‍යනොවන්නීය එහෙයින් කරුණා ප්‍රඥාසම්බන්ධවූ ආද්‍යන්තයන් දැක්වීමෙන් නිරවශේෂ සර්වඥගුණයන් ප්‍රසංගයෙන් දක්වනු පිණිස කරුණා ප්‍රඥාවෙන් යොමනය කරණලද්දේයයි කියත්. ඒ එසේමැයි සියලු බුද්ධගුණයන්ට කාරුණාව ආද්‍යන්ත වන බැවින් කරුණාව ආදියෙහි මාර්ගප්‍රඥාවෙන් මත්තෙහි කටයුත්තෙක් නැතිබැවින් ප්‍රඥාව අන්තයෙහි මෙසේ ආද්‍යන්තයන් දැක්වීමෙන් නිරවශේෂ සර්වඥගුණයෝ දක්වනලද්දාහුමැයි(නොහොත්) කරුණා වචනයෙන්

ශීලස්කන්ධය පූර්වභාගකොට ඇති සමාධිස්කන්ධය දක්වනලදී ශීලය මනාකි කරුණාව නිදානකොට ඇත්තේයයි කුමක් හෙයිනයත් ඒ කරුණාවෙන් ප්‍රාණාතිපාතාදීන්ගේ විරතිය පවත්නා හෙයිනි ඒ කරුණාතොමෝද චතුෂ්කනයෙහි ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයන් හා එක්ව යෙදෙන බැවින් ප්‍රඥාවචනයෙන් ප්‍රඥාස්කන්ධය දක්වනලදී ශීලය වනාහි සියලු බුද්ධගුණයන්ගේ ආදියයි මධ්‍යයෙහි සමාධියයි ප්‍රඥාව අන්තයයි මෙසේද ආදිමධ්‍ය පර්යවසාන කල්‍යාණයන් දක්වීමෙන් නිරවශේෂ සර්වඥගුණයෝ දක්වනලද්දාහුමැයි න්‍යායවශයෙන් දක්වනලද හෙයින් මේ ක්‍රමය සියලු බුද්ධගුණයන් දක්වන උපාය වේ යම් මේ නයග්‍රහණයක් වේද ඒ නයග්‍රහණයෙන් සියලු සර්වඥ ගුණයන් සඞ්ග්‍රහනොකොට අනික් ප්‍රකාරයකින් භගවත් හුගේ අනන්තාප්‍රමේය ගුණසමූහය වර්ණනාකිරීමට කවරෙක් නම් පොහොසත්වේද නොවේමැයි.

කිරසිනිපරදුක්ඛං විකම්පතී අපනෙතීති කරුණා-යනුද, කරුණායනියුත්තො කාරුණිකො-යනුද, මහන්තො කාරුණිකොති මහාකාරුණිකො-යනුද, (නොහොත්) මහතී කරුණා යස්සාති මහාකාරුණිකො-යනුද, සමාසවාක්‍යයි,

එහෙයින් ඛීන පටිසම්භිදාමාර්ගයෙහි මහාකරුණා සමාපත්තිඥාණ විභඞ්ගයෙහි "කතමං තථාගතස්ස මහාකරුණා සමාපත්තියා ඤාණං බහුකෙහි ආකාරෙහි පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති ආදිත්තො ලොකසන්නිවාසොති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තෙසු මහාකරුණා ඔක්කමති" යි.

නාථති වෙනෙය්‍යානං හිතසුඛං මෙත්තායනවසෙන ආසිංසති පත්ථෙතීති නාථො-යනුද, නොහොත් නාථති වෙනෙය්‍යගතෙ කිලෙසෙ උපතාපෙතීති නාථො-යනුද, ඤාතබ්බන්ති ඤෙය්‍යං-යනුද, සංගරණං වා සමන්තාගතාලානං ඤෙය්‍යානං උදකෙන කරොතීති සාගරො-යනුද, ඤෙය්‍යං එව නං සාගරං චාති ඤෙය්‍යසාගරං-යනුද ඤෙය්‍යසාගරස්ස පාරං පරියන්තං ගතොති ඤෙය්‍යසාගරපාරගූ-යනුද, සමාසවාක්‍යයි. කල්පවිනාශ කාලයෙහි සමුද්‍ර ජලය ගැලීමෙන් ලෝකවිනාශකාරණ හෙයින් සාගරනමැයි කියත් වෛදිකයෝ වනාහි ප්‍රථම කල්පයෙහි සගරනම් රජහුගේ පුත්‍රවූ සාගරනම් රජකුමරුවන් විසින් කණිනලද බැවින් පූර්වසාගරය සාගරනම්විය තත්සම්බන්ධයෙන් අන්‍ය සාගරයෝද රූඪිවශයෙන් සාගරනම් වෙතියි කියත් පඤ්චවිධ ඥෙය ධර්මයන්ගේ නයමනන්තතාවයෙන් ඤෙය්‍යසාගරය නාශ

සාගරයයි කියත්. ඥෙයසාගරයාගේ පාරංගමිතය සම්බුදුන්ට ඉතා ස්වල්පකාලයකින් කළහැකිවුවත් නයසාගර සංඛ්‍යාත ඥෙයසාගර යාගේ පාරංගමිතය සර්වඥයන්වහන්සේටමුත් අනිකෙකුට නොකළ හැක්කේමැයි මෙහි වනාහි ඒකාන්තයෙන් පඤ්චවිධ ඥෙය මණ්ඩල යාගේ අනන්තභාවයෙන්ද භාගවතුන්ගේ සර්වඥතාඥානයාගේ අනන්තගාමියෙන්ද ඥෙයසාගරපාරං ගමිතය දතයුතුයි එහෙයින් වදාළහ ආයුෂ්මත් ධර්මසේනාපති සාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේ පටි සම්භිදාමාර්ගයෙහි "යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං යාවතකං ඤා ණං තාවතකං ඤෙය්‍යං ඤෙය්‍යපරියන්තිකං ඤාණං ඤාණපරියන්ති කං ඤෙය්‍යං ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති ඤාණං අතික්ක මිත්වා ඤෙය්‍යපථො නප්පවත්තති අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා යථා ද්වින්නං සමුග්ගපටලානං සුඵුසිතානං හෙට්ඨිමං සමුග්ගපටලං උපරිමං නාතිවත්තති උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො එවමෙවං බුද්ධස්සභගවතො ඤෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා" යනාදියයි.

මෙහි වනාහි චොදකතෙමේ මෙසේ කියයි–කුමක්ද මේ සර්වඥ තාඥානය පවතිනුලබනුයේ සියලු විෂයෙහි එක්වරම පවත්නේද නොහොත් ක්‍රමයෙන් එකී එකී විෂයෙහි පවත්නේද වැලින් මෙයි ඉදින් එකවරම සියලු විෂයෙහි පවත්නේනම් අතීතානාගත වර්තමා න අධ්‍යාත්මිකබාහිරාදී භෙද භින්නාවූ සඞ්ඛත ධර්මයන් හා අසඞ්ඛත සම්මුති ධර්මයන්ද එකවිට ඤාණපථයෙහි එලඹ සිටීමක් ඇති කල්හි දුරසිට දක්නාවූ සිතුවම් පටක්මෙන් ප්‍රාග්භානාකාරයෙන් (හෙවත්) ඡායාකාරයෙන්ම අවබොධවන්නේයයි එසේ ඇතිකල්හි "සබ්බෙ ධම්මා අනත්තා" යනුවෙන් විදර්ශනාකාරන්තවුන්ට අනාත්මාකාරයෙන් වැටහීමක්මෙන් සර්වධර්මයෝ අනිරූපිත රූපයෙන් (හෙවත්) අඳුකට ස්ව රූපයෙන් භගවත්නුන්ගේ ඤාණයට ගොචරවෙතියි යන දොෂ ප්‍රසඞ්ග ය වේ.

යම්හෙයකින් වනාහි සකල ඥෙය ධර්මයන්ගේ ස්ථිතිලක්ෂණය අරමුණුකොට විකල්ප රහිතව සියලුකල්හි බුදුවරයන්ගේ ඤාණය පවත්නේය එහෙයින් ඒ බුදුවරයෝ සර්වඥයයි කියනුලැබේ එසේ සිත්ම "චරං සමාහිතො නාගො තිට්ඨන්තොපි සමාහිතො" යනාමේ ව චනයද මනාකොට කියනලද්දේවෙයි, ඔවුන්ගේ මනසද සවිකල්පනාල ද දොෂය ඉක්ම නොපවත්නේවෙයි ස්ථිතිලක්ෂණය අරමුණුකොට ප වත්නා බැවින්ද අතීතානාගත සර්වධර්මයන්ගේ ස්ථිතිලක්ෂණය නැති

බැවින් භගවත්නුගේ ඥානය එක දෙශයකින් අරමුණු කරන්නේ වේද? එහෙයින් එකවර සර්වධර්මයන්හි ඥානය පවත්නේය යන මහාද්, නොහොත් දෙසි ජාති භූමි ස්වභාවාදි වශයෙන්ද දිශාදෙශකාලාදි වශයෙන්ද අනෙක භෙද භින්නවූ ඥෙය ධර්මයන් අනුක්‍රමයෙන ගණු ලබනකල්හි ඒ ඥෙයමණ්ඩලයාගේ අනවශෙෂ ප්‍රතිවෙධය සම්භව නොවන්නේයි කුමක්හෙයින යත්? ඥෙයමණ්ඩලයාගේ අසීමිතා භාවය ඇතිහෙයිනි සර්වසාමාන්‍යක වනාශ අනිත්‍යය නොවරදවා ගැණීම වශයෙන් ඥෙයමණ්ඩලයාගේ එක දෙශයක් ප්‍රත්‍යක්ෂකොට සෙස සෙසත් මෙසේමයයි නිශ්චයකොට නියමකරණ හෙයින් භගවත්හට මේ සර්වඥතාව වේනම් එ ඥානයද සංශයාභාවයෙන් අනුමානික නොවේයි ලෝකයෙහි සංශයානුබද්ධ ඥානයම අනුමානික ඥානයයි කියද්ද ඔවුන්ගේ ඒ මතයද යුක්ත නොවන්නේයි සියලු ඥෙයමණ්ඩලයාගේ ප්‍රත්‍යක්ෂබවක් ඇතිකල්හි අර්ථය නොවරදවා ගැණීමෙන් ඥෙයමණ්ඩලයාගේ එක දෙශයක් ප්‍රත්‍යක්ෂකොට සෙස්සෙහිත් මෙසේයයි නිශ්චයකොට නියමකිරීමක් සම්භවනොවන බැවින් යම් ප්‍රදෙශයක් ශෙෂවේනම් ඒ ප්‍රදෙශය අප්‍රත්‍යක්ෂවෙයි තවද ඒ ප්‍රදෙශයත් ප්‍රත්‍යක්ෂවෙයි කියාතම් ඔහුගේ ශෙෂභාවයක්ම නොවන්නේයි.

සියලු වාදීන්ගේ මේ වාද සියල්ලම සර්වඥතාඥානයට කාරණා නොවේයි කුමක්හෙයිනයත්? අචින්ත්‍යධර්මයක් විචාරණයකළ හෙයිනි. ඒ එසේමැයි භගවත්නු විසින් "බුද්ධවිසයො භික්ඛවෙ අචින්තෙය්‍යො නචින්තෙතබ්බො යොචින්තෙය්‍ය උම්මාදස්ස විඝාතස්ස භාගීඅස්ස" යනු වදාරණලද්දැයි මේ මතකයනු ලබන්නේ මේනි විනිශ්චයයි භගවත්නු විසින් සකල ඥෙයමණ්ඩලය හෝ යම් කිසි එකදෙශයක් හෝ දැනගණු කැමැත්තේද? ඒ ඒ විෂයෙහි අප්‍රතිහත ව්‍යාප්තිබලයෙන් හෙවත් නොපැකිළ පැවතීමෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන් බුද්ධඥානය පවත්නේ මෙහි විශෙෂපාභාවයෙන් නිත්‍යසමාධානයද ඇත්තේවේ දැනගණුකැමැත්තවූ සකල ඥෙය ධර්මයාගේ අගොචර භාවය ඒ ඥාණයාගේ ආකාඞ්ක්‍ෂාප්‍රතිබද්ධවෘත්තිත්වය ඇතිහෙයින් නොවන්නේමැයි.

ප්‍රතිසම්භිදාමාර්ගයෙහි "සබ්බධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා ආකඞ්ඛපටිබද්ධා මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා" යි වදාළ බැවින් එකාන්තයෙන්ම බුද්ධඥානයාගේ ආකාඞ්ක්‍ෂාප්‍රතිබද්ධවෘත්තිත්වය කැමතිවිය යුත්තේය අතීතානාගත ධර්මයන් අරමුණුකොට පවත්නාවූද භගවත්හුගේ ඥානය අනුමානාගම තර්කග්‍රහණයෙන් විරහිත බැවින් අතීතානාගත සර්වධර්මයන් සර්වඥතාඥාන

සව ප්‍රත්‍යක්ෂමැයි මේ පක්ෂයෙහි යම්කලක සියල්ල දැනගන්නට කැම ත්වීනම් එකල්හි එකවිටම සකල ධර්මයන් අරමුණුවන බැවින් අතී රූපිත රූපයන් ගැනමත්හුගේ ඥානය පවත්නේය යන අර්ථය ලැබෙන හෙයින් සටිකියනලද දෝෂයාගේ අනතිව්‍යාප්තියම් වන්නේ නොවේදැයි? ඒ දෝෂය ශෝධිත බැවින් නොවන්නේමැයි ඒ එසේ මැයි "බුද්ධවිසයෝ අචින්තෙය්‍යෝ" යන පදයෙන් දෝෂය ශෝධනය කරණලද්දේයි නො එසේවීනම් ප්‍රවුරජන ඥාන සමාන වූහෙයින් යෙන් භාගවත්වූ සර්වඥවරයන්ගේ සර්වඥතාඥානයාගේ අචින්ත්‍යනය තාවය නොවන්නේයි එහෙයින් සකල ධර්මාලම්බණිකාවූද ඒ බුද්ධඥ නය එක ධර්මාලම්බණික ඥානයක්මෙන් ඒ සකල ධර්මයන් මනාවෙස් ව්‍යවස්ථාකොටම පවත්නේය යන මේ කාරණය මෙහි අභිප්‍රායභාව යවේ. දතයුතුවූ ධර්මය යම්තාක්ද ඥානයද ඒතාක් පමණී ඥානය යම් තාක්ද දතයුතු ධර්මද ඒතාක්මවේ දතයුතුවූ ධර්ම අවසන්කොට ඥා නයද ඥානය අවසන්කොට දතයුතුවූ ධර්මයද පවත්නේයයි මෙසේ සියළු ධර්ම එක්රැස්කොට හෝ වෙන වෙනම හෝ එකවිටම හෝ ක්‍ර මයෙන් හෝ භගවත්හුගේ ඉච්ඡානුරූප පරිච්ඡෙදන් ඤෙය්‍යසාගර පා රංගමනසකල හෙයින් ඤෙය්‍යසාගර පාරගූයයි කියනලැබේ. මෙහි ගමනය වනාහි කායගමනය ඥාන ගමනයයි දෙවැදෑරුම්වේ ඒ දෙවැදෑරුම් ගමනයන් අතුරෙන් ඥාන ගමනයම මෙතැන්හි කැම තිවිය යුත්තේයි ඒ ඥානය වනාහි සම්මසීණ ප්‍රතිවෙධ වශයෙන්ද හෙතුඵල වශයෙන්ද දෙවැදෑරුම්වේ ඒ දෙදෙනා අතුරෙන් "කිච්ඡං වතායං ලොකො ආපන්නො" යනාදීන් කරුණා වශයෙන්ම අභිනිවෙ සංකොට අනන්තාකාර වොකාර සංස්කාරයන් සම්මසීණය කරන් නාවූ භගවත්හුගේ සම්මසීණඥානය සතිස්කොටි සතසහස්‍ර මුඛයෙන් ඤෙය්‍යසාගරයට බැස ඒ සාගරයාගේ පාරසංඛ්‍යාත එතෙරට ගියේයි. ඒ මේ ඥානය වනාහි ආශ්‍රවක්ෂය ඥානය ආසන්න කාරණකොට ඇති සර්වඥතාඥානයවේ ඒ මේ ඥානය මනාබෝධියයිද කියනලැබේ. පැරගමනය ඒ ඥානයාගේ කායසිද්ධියෙහි සමර්ථතාවයෙන් දතයුතුයි. එසේම යථොක්ත සම්මසීණ ඥානය හෙතුවෙයි සර්වඥතා ඥානය ඵලයවෙයි දතයුතුයි.

නිපුණගම්භීරාවිචිත්‍රාච නයා එතෙසාන්ති නිපුණගම්භීරවිචිත්‍රනයා යනුද, තාදිසා සෙව දෙසනා මහාකරුණාමූලකත්ත අපරිමෙය්‍යපුඤ්ඤ ප්පභාව ඥාණතෙජෙන පවත්තා යෙසාන්ති නිපුණගම්භීර විචිත්‍රනය දෙසනා-යනුද විඤ්ඤියං කායසුචරිතාදිකං ධම්මානං වා සකලලක්ඛණං

සාමඤ්ඤෙන ගහණං ච විඤ්ඤෙයි යාථාවතො. උපලබ්භන්ති විජ්ජා-යනුද, ච
රන්ති ගච්ඡන්ති අරියසාවකා ගෙ තං දිසං නිබ්බාණමෙතෙනාති චරණානි
යනුද, ඉති ඉමාහි විජ්ජාහි ඉමෙහි චරණෙහි ච සම්පන්නා සමන්නාග
තා පරිපුණ්ණාවා අතිනලාහි විජ්ජාචරණසම්පන්නා-යනුද, උද්ධන
හමත්තා උද්ධන හමකාරණගතා සෙට්ඨතාය උත්තමො-යනුද, අධි
ගතමග්ගෙ සච්ඡිකතනිරොධෙ යථානුසිට්ඨං පටිපජ්ජමානෙ ච සත්තෙ
අපායෙසු අපතමානෙ ධාරෙන්ති ධම්මා-යනුද සම්මා අවිපරීතං
සාමං සෙව සබ්බධම්මෙ අභිසම්බුද්ධාති සම්මාසම්බුද්ධා-යනුද, බුද්ධ
ධාතුව ජාගරණාර්ථයෙහිද පවත්නා බැවින් සම්මාසාමං ච පටිබුද්ධා
අනඤ්ඤපටිබොධිතතානුබො සයමෙව සවාසනාසම්මොහනිද්දය අච්ච
න්තං විගතත්තාති සම්මාසම්බුද්ධා යනුද, එම ධාතුව විකසනාර්ථයෙ
හිද පවත්නා බැවින් “දිනකරකිරණසමාගමෙන පරමරුචිරසිරිසො
භාගප්පත්තියා විකසිතමිව පදුමං අග්ගමග්ගඤාණසමාගමෙන අපරි
මිතගුණගණාලඞ්කාර සබ්බඤ්ඤුතඤ්ඤාණප්පත්තියා සම්මාසාමං ච පටි
බුද්ධා විකසිතා විකාසමනුප්පත්තාති සම්මාසම්බුද්ධා-යනුද, නෙ
තාපූජිතොමානිතොති සම්මාසම්බුද්ධපූජිතො-යනුද, සමාසව්‍යාසයයි
මෙහි භගවත්හු විසින් සද්ධර්මපූජා කරණලදබව “අයං භික්ඛවෙ
සම්මාසමාධිං දෙසිස්සාමි-මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො-යාවතා භික්ඛ
වෙ ධම්මා සඞ්ඛතා අසඞ්ඛතාවා විරාගො තෙසං අග්ගමක්ඛායති-එකාය
නො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා” යනාදී දෙශනා
පාඨවලින් පෙනේ.

සීලසමාධිපඤ්ඤාවිමුත්ති විමුත්තිඤාණදස්සන දීහිචව ජලනිඤ්ඤ
චතුපටිසම්භිදා දීහි ගුණෙහි ච සම්පන්නා පරිපුණ්ණාති සීලාදිගුණසම්
පන්නා-යනුද, ආරකාකිලෙසෙහි අරියා අනයෙන ඉරියනතො අයෙ
ච ඉරියනතොපි අරියා සදෙවකෙන ලොකෙන සරණන්ති අරණීයත
තො උපගන්තබ්බතො උපගතානං ච තදත්ථසිද්ධිතොති අරියා-යනු
ද, අරියානං සංඝා සමූහොති ( නොහොත්) දිට්ඨිසීලසාමඤ්ඤෙන සං
හතොති සංඝා-යනුද, අරියොචසො සඞ්ඝොචාති අරියසඞ්ඝා-යනුද
බීජානං බීජං මහප්ඵලභාවකරණෙන තායති රක්ඛතීති ඛෙත්තං-යනු
ද (නොහොත්) බීජියතිවා විරූහනට්ඨානතා බීජමෙත්ථාති ඛෙත්තං-
යනුද, පුඤ්ඤභාවනිබ්බත්තනතො අත්තසන්තානං විසොධනතො ච
පුඤ්ඤසංඛාතානං කුසලානං ඛෙත්තං ති පුඤ්ඤක්ඛෙත්තං-යනුද, ස
මාසව්‍යාසයයි, එහෙයින් කියනලදී.

ඛෙත්තූපමා අරහන්තො දායකා කස්සකූපමා
බීජූපමං දෙය්‍යධම්මං එත්තො නිබ්බත්තතෙ ඵලං,,

තප්පිළිපන්නතරො බහිද්ධාසීලාදිගුණෙහි එතසමාහිඅනුපත්තතරො ය නුද, සීලාදිගුණසම්පන්නාය කතපුඤ්ඤස්ස මහප්ඵලභාවකරණෙන තව රතිං පෙමං ජනෙතීතිරතනං, අථවා, ඉතිපි සො භගවාති ආදිනා නයෙන යථාභූතගුණෙ ආවජ්ජන්තස්ස අමතාධිගමහෙතුභූතං අ නප්පකං පීතිපාමොජ්ජං රතිං ජනෙතීති රතනං යනුද, රත නානං තයං තීනිසමාහටානි තයොවා අවයවා අස්සාති රතනත්තයං යනුද, සමාසවාක්‍යයි.

(4-5) ඉති, මෙසේ; රතනත්තයෙ, බුද්ධධම්ම සඞ්ඝ සංඛ්‍යාත රත් නත්‍රය විෂයෙහි කරණලද්දවූ; වන්දනාජනිතං, ප්‍රණාමයෙන් හට ගත්තාවූ; යං පුඤ්ඤං, යම් කුශලයක් වේද; තස්ස තෙජසා, ඒ කුශල කර්මයාගේ ( භගවත් වන්දනාව්ය කාමාවචර මහාකුසලචිත්තවීථි සම් බන්ධවූ ප්‍රථම ජවන චෙතනා සහගතවූ දෘෂ්ටධර්ම වෙදනීයකර්මයාගේ ) තෙජසින්; සබ්බත්ථ, සියලුතන්හි; හතන්තරායො හුත්වා, නසනලද උපපීළක කර්මවිපාක සංඛ්‍යාත අන්තරාය ඇතිව; සද්ධම්මනෙත්තියා, විනෙයජන සන්තානයෙහි ආර්යගුණයන් එලවනහෙයින් පර්යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධසංඛ්‍යාත ) සද්ධර්මනෙත්තියගේ; ( නොහොත් ඒ ඒ වස්තු පැමිණවීම් වශයෙන් නෙත්තිසංඛ්‍යාතවූ යොතින් ආර්යගුණ යන් එලවන බැවින් යොතක්වැනිවූ ) සද්ධර්මනෙත්තිසංඛ්‍යාත පර්යාප්ති ශාසනයාගේ; චිරං, බොහෝකාලයක්; ඨිතිං ආකාංඛමානෙන, ස්ථිතිය කැමැත්තාවූ; ධම්මරක්ඛිතනාමෙන ථෙරෙන, ධර්මරක්ෂිතනම් ස්ථවිරයන් විසින්; අභියාචිතො, විශෙෂයෙන් යාඥාකරණලදුයේ; ( අහංකරිස්සාමි අත්ථවණ්ණනං යනු හා සම්බන්ධයි )

පර්යාප්ති සංඛ්‍යාත සද්ධර්මනෙත්තිය බොහෝකල්සිටීමෙන් ප්‍රති පත්ති ප්‍රතිවෙධ දෙදෙනාගේද චිරස්ථිතිය වන්නේයයි දතයුතුයි, ශාසනස්ථිතියම වනාහි පර්යාප්ති ශාසනයම ප්‍රමාණවෙයි. ඒ එසේ මැයි නුවනැති පණ්ඩිතතෙමේ ත්‍රිපිටක පර්යාප්ති ධර්මය අසා තදනුසා රයෙන් ප්‍රතිපත්ති ප්‍රතිවෙධ ශාසනද්වයද සම්පූර්ණකරන්නේයි යම්සේ අපගේ ශ්‍රීමහාබොධිසත්වයෝ අලාරනම් තවුසාකෙරෙහිවැස පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියම පරිකර්ම විචාලකල්හි ඔහු නොදන්නෙම්යි කීයේය. ඉක්බිති මහබෝ සත්වතෝ උද්දකනම් තවුසා කරා එලඹ අධිගත විශෙෂය සංසන්දන යකොට නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට පරිකර්ම විචාළේයි ඉක්බිති ඒ උද්දකනම් තවුසාගේ නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමා පත්තියට පරිකර්ම කීවිට අනතුරුවම මහාබොධිසත්වයෝ ඒ සමා

පර්‍යාප්තිය ඉපැදවූයේය එපරිද්දෙන් පණ්ඩිත භික්ෂුතෙමේ පර්‍යාප්තිය අසා ප්‍රතිපත්ති ප්‍රතිවේධ ශාසනත්‍රයද සම්පූර්ණ කෙරේ එහෙයින් පර්‍යාප්ති ය සිටිකල්හි ත්‍රිවිධ ශාසනයම සිටියේනම් වේ, එහෙයින් සිංහල පුරාතනයෝ.

‘‘පරියත්තිනුබොමූලං සාසනස්සමහෙසිනො
උදගුපටිපත්තීති පරියත්තිනි දීපයෙ
වුත්තං හෙතං භගවතා බුද්ධනාදිච්චබන්ධුනා
පච්චයස්සසඞ්ඝස්සාති සාසනසිරිකාරිනා
යාවතිට්ඨන්තිසුත්තන්තා විනයොයාවදිප්පති
තාවරක්ඛන්තිආලොකං සුරියබ්භුට්ඨිතෙයථා
සුත්තන්තෙසු අසන්තෙසු පම්මුට්ඨෙ විනයම්හිච
තමොභවිස්සති ලොකොසූරියත්ථංගතෙයථා
සුත්තන්තෙරක්ඛිතෙසන්තෙ පටිපත්තීපිරක්ඛිතා
පටිපත්තියං ඨිතො ධීරො යොගක්ඛෙමා නධංසති.

මෙහි අභිප්‍රාය මහර්ෂීවූ සර්වඥයන්වහන්සේගේ ශාසනයට පර්‍යාප්තිය මුල්වන්නේද නොහොත් ප්‍රතිපත්තිය මුල්වන්නේදැයි යමෙක් විචාළේනම් පර්‍යාප්ති ශාසනයම මුල්වන්නේයයි ප්‍රකාශකට යුතුයි. පන්දහසක් හවුරුදු පවත්නාසේ ශාසනයස්ථිතිය කළාවූ සූර්‍ය්‍ය බන්ධුවූ ඒ භගවත්හු විසින් මේ වදාරණලද්දේමැයි යම්තාක් සූත්‍රාන්ත ය සිටීද යම්තාක් විනය දීප්තිමත්වේද ඒතාක් සූර්‍ය්‍යයා උදගිරිපර්වත මස්තකයට නැඟාවූ කලක්මෙන් අභින්මාර්ගඥාන සංඛ්‍යාත ආලෝකය පවත්නේයි, සූත්‍රාන්තය අවිද්‍යමානකල්හි විනයපිටකයද හාත්පසින් මුළාව ගියකල්හි සූර්‍ය්‍යයා අස්තංගත කලක්මෙන් ලෝකය අවිද්‍යාන්ධකාරයෙන් යුක්ත වේය, සූත්‍රාන්තය රක්ෂාකළකල්හි ප්‍රතිපත්තියද රක්ෂාකරණලද්දේනම් වේ ප්‍රතිපත්තියෙහි පිහිටියාවූ ප්‍රාඥතෙමේ යොගක්ෂෙම සංඛ්‍යාතවූ නිර්වාණධර්මය නොනස්නේයි යනුයි.

( 6 ) පදුමුත්තරනාථස්ස, උපන්තැන්පටන් පිරිනිවණ දක්වා වඩනා සෑල්තන්හි ඉදිරියෙන් පොළවපලා ලක්ෂයක් පියුම් පැණනැගි ණ බැවින් පියුමතුරා යන අන්වර්ථ නාමයක් ඇත්තාවූ සර්වඥයන්ව හන්සේගේ; පාදමූලෙ, පාමුල්හි; ( හෙවත් ඒ බුදුන්ගේ සමීපයෙහි) යං, යම් මහා නායකයානාස වීරකෙනෙකුන් විසින්; පවත්තිතං, පවත්වනලද; මත්‍ථකං සම්පත්තං, මුදුන්පත්වූ; අභිනීහාරං, මමද මෙබඳු එතදග්‍රස්ථානාන්තරයක් ලබම්වයි කරණලද ප්‍රාර්ථනාව; පස්සනා, පූර්වනිවාසානුස්මෘති ඥානයෙන් දක්නාවූ.

“එවං නායසන්නාමෙන අරියගුණානං නයනතො නිබ්බානම්පි සද්ධම්මොත්වෙවමෙතන්තිති, සද්ධම්මොනාමාති-සනු හා තං තං වත්ථුස්ස නාය නතාවා නොපාතිසංඛාතෙන යොතෙනාන අරියගුණානං නයනතො චෙන සදිසතා යථාවුත්තා සද්ධම්මා සෙව නොහන්තීති සද්ධම්ම නොනාති”-සනුද, සමාසමිාකායයි.

(7–8) තාදිනා, පඤ්චවිධ තාදීගුණයෙන් යුක්තවූ;(පඤ්චවිධ තාදීගුණනම් කවරයත් එසින් කීහ මහා නිද්දේසයෙහි “ඉට්ඨානිට්ඨෙ තාදී චත්තාවීති තාදී තිණ්ණාවීති තාදී මුත්තාවීති තාදී තන්නිද්දෙසා තාදී, කථං අරහා ඉට්ඨානිට්ඨෙ තාදී අරහා ලාභෙපි තාදී අලාභෙපි තාදී-පෙ-දුක්ඛෙපි තාදී එකං චෙ බාහං ගන්ධෙන ලිම්පෙය්‍යුං එකං චෙ බාහං වාසියා තච්ඡෙය්‍යුං අමුස්මිං නත්ථි රාගො අමුස්මිං නත්ථි පටිඝං අනුනයපටිඝ විප්පහීනො උග්ඝාතිනිග්ඝාතිවීතිවත්තො අනුරොධවිරොධසමතික්කන්තො එවං අරහා ඉට්ඨානිට්ඨෙ තාදී, කථං අරහා චත්තාවීති තාදී අරහා ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා චත්තා වන්තා මුත්තා පහීනා පටිනිස්සට්ඨා එවං අරහා චත්තාවීති තාදී, කථං අරහා තිණ්ණාවීති තාදී? අරහා කාමොඝං තිණ්ණො භවොඝං තිණ්ණො දිට්ඨොඝං තිණ්ණො අවිජ්ජොඝං තිණ්ණො සබ්බසංසාරපථං තිණ්ණො උත්තිණ්ණො නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො සො වුට්ඨවාසො චිණ්ණචරණො ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති, එවං අරහා තිණ්ණාවීති තාදී, කථං අරහා මුත්තාවීති තාදී? අරහතො රාගා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං දොසා—පෙ—මොහා, කොධා, උපනාහා, මක්ඛා, පළාසා, ඉස්සා, මච්ඡරියා, මායා, සාඨෙය්‍යා, ථම්භා, සාරම්භා, මානා, අතිමානා, මදා, පමාදා, සබ්බකිලෙසෙහි, සබ්බදුච්චරිතෙහි, සබ්බදරථෙහි, සබ්බපරිළාහෙහි, සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි, චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං එවං අරහා මුත්තාවීති තාදී, කථං අරහා තන්නිද්දෙසා තාදී? අරහා සීලෙ සති සීලවාති තන්නිද්දෙසා තාදී, සද්ධාය සති සද්ධොති තන්නිද්දෙසා තාදී විරියෙ සති විරියවාති තන්නිද්දෙසා තාදී සතියා සති සතිමාති තන්නිද්දෙසා තාදී සමාධිම්හි සති සමාහිතොති තන්නිද්දෙසා තාදී පඤ්ඤාය සති පඤ්ඤවාති තන්නිද්දෙසා තාදී විජ්ජාය සති තෙවිජ්ජොති තන්නිද්දෙසා තාදී අභිඤ්ඤාය සති ඡළභිඤ්ඤොති තන්නිද්දෙසා තාදී එවං අරහා තන්නිද්දෙසා තාදී” යි. *)

---

* මහාසාමිනෙකාව සොයුණුවිනිශ්චයයාධනුධ උපාතෙමිවාන්. මහාසාමිකුෂුතාමා, සතුතා සම්බන්ධයි.

සර්වඥයන්වහන්සේ විසින්; සංඛිත්තෙන, සංක්ෂෙපයෙන් දේශනා කරණලද්දාවූ අර්ථය; විභජන්තානං, විභාගකිරීමෙන් අර්ථවර්ණනා කරන්නාවුන් අතුරෙන්; එසොඅග්ගොති, මේ ජෙ ම අග්‍රයයි; එතදග්ගාසනං, එතද ග්‍රස්ථානයෙහි; ඨපිතො, තබනලද්දාවූ; ඡළභිඤ්ඤො, ෂඩභිඥලාභීවූ; වසිප්පත්තො, ආවජ්ජනවසී සමාපජ්ජනවසී උට්ඨානවසී අධිට්ඨානවසී පච්චවෙක්ඛණවසී. සංඛ්‍යාත පඤ්චවසී භාවයට හා ආසවක්ෂයයන් උතුම්වූ චිත්තවශී භාවයටද අධිගත බැවින් වශීප්‍රාප්තවූ; පඤිසම්භිදො,(යතානි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො සාරිපුත්තො චතස්සො පටිසම්භිදා සයං අභිඤ්ඤාය සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති යනාදීනයින් ආයුෂ්මත් ධම්මසෙනාපති සැරියුත් මහතෙරුන් කාය ශාක්‍ෂිකොට වදාළාවූ චිත්තයාගේ ලීනත්‍ව ප්‍රශ්නතාදී සප්තාඞ්ගයෙන් සමන්වාගත බැවින් අර්ථධර්ම නිරුක්ති ප්‍රතිභාණයන සිව්පිළිසිඹියාවෙහි විශෙෂ ප්‍රභෙදගත ප්‍රතිසම්භිද ඥානයන් යුක්ත බැවින් ) ප්‍රභෙදාවූ ප්‍රතිසම්භිද ඇත්තාවූ; සම්බුද්ධෙනපසංසිතො, සම්‍යක්සම්බුද්ධයන් විසින් "උද්දෙසවිභඞ්ගපරියායෙ පණ්ඩිතො භික්ඛවෙ මහාකච්චානො මහාපඤ්ඤො භික්ඛවෙ මහාකච්චානො" යනාදීන් ප්‍රසංශාකරණලද්දාවූ. එසේම භද්‍රෙකසූත්‍ර මධුපිණ්ඩික සූත්‍රාදී නොයෙක් තැන්හි "තං ඛො පන භගවන්තං කච්චානං එවං කල්‍යාණො කිත්ති සද්දො අබ්භුග්ගතො පණ්ඩිතො වියත්තො මේධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභානො වුද්ධො චෙව අරහා ච" යනාදීන් ආ බැවින් බොහෝදෙනා විසිනුදු ප්‍රසංශාකරණලද්දාවූ; මහාසාවකුත්තමො, මහාශ්‍රාවකොත්තමවූ (සෙසු මහා ශ්‍රාවකයන් කෙරෙන් උත්තමවූ) සොකච්චායනො මහාථෙරො, (සත්‍යය ධර්මය අහිංසාය සංයමය දමය යන පඤ්ච ස්ථිරගුණයෙන් යුක්තබැවින් ) ස්ථිරභාව ප්‍රාප්තවූ යම් මහා කාත්‍යායන ස්ථවිරකෙනෙක්වීද.

### මෙහි වනාහි මහාකාත්‍යායන ස්ථවිරයන්ගේ පිළිවෙළ කථාව දතයුත්තීය.

හේ සොහෙස්දයන්-මේ ස්ථවිරයන්වහන්සේ වනාහි පෙර බුදුවරයන් හමුයෙහි කරණලද අධිකාරඇත්තෝ ඒ ඒ භවයෙහි විවෙකාප නිශ්‍රයවූ බොහෝ පින්දස්කරන්නේ පියුමුතුරා නම් බුදුන් සමයෙහි ගැහැව්මහසල්කුලයක ඉපිද වැඩිවිය පැමිණියේ එක්දවසක් ශාස්තෲන්ගේ සමීපයෙහි බණඅසනුයේ ශාස්තෲනු විසින් සංක්ෂෙපයෙන් දේශනාකරණලද අර්ථය විස්තරවශයෙන් අර්ථවිභාගකරන්නාවුන් කෙරෙන් අග්‍රස්ථානී තබනු ලබන්නාවූ එක් භික්ෂුවක් දැක තමාත් ඒ

හනතුර පනම්හින් දනාදී නොයෙක් පින්කම් කොට දිව්‍ය මනුෂ්‍ය දෙග තියෙහි සැරිසරන්නුයේ සුමෙධනම් බුදුන් සමයෙහි විද්‍යාධරයෙක්ව අහසින් යනුයේ. එක් වනලැහැබෙක වැඩහුන් සුමෙධනම් බුදුන් දැ ක පහන්සිත් ඇතියේ කිණිහිරිමලින් පුදගියේයි හෙතෙම ඒ පුණ්‍ය කර්මයෙන් මතුමත්තේහි ස්වර්ගයෙහිම අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ඉපිද කසුප් බුදුන් සමයෙහි බරණැස කුලගෙයක ඉපිද ඒ කසුප් බු දුන් පිරිනිවිකල්හි උන්වහන්සේගේ අඛණ්ඩධාතු ශරීරය නිධාන කොට ගණරන්සැය කරණ තැනට ලක්‍ෂයක් අගණා රන්උළුකින් පුදා මේ කුසලකර්මයාගේ බලයෙන් උපනුපන් තැන මාගේ ශරීරය ස්වර්ණවර්ණ වේවයි ප්‍රාර්ථනා කෙළේයි. ඉක්බිති දිවි ඇතිතාක් කුසල් කොට එයින් සැව දිව්‍යමනුෂ්‍ය දෙගතියෙහි සැරිසරා මේ බුද්ධොත්පාද කාලයෙහි උදෙනි නුවර චණ්ඩප්‍රද්‍යෝත නම් රජහුගේ පුරෝහිත බ්‍රාහ්මණයාගේගෙහි උපන්නේයි ඔහුට නම්තබන දවස්හි මව්පියෝ අපගේ පුත්‍රතෙම ස්වර්ණවර්ණයෙන් යුක්තය තමාගේ නාමය තුමූම ගෙණ ආයේයයි කියා කචන මාණවකයයි නම් කළාහුය ඒ කචන මාණවක තෙම වැඩිවිය පැමිණ වෙදත්‍රය ඉගෙණ පියහුගේ ඇවෑ මෙන් පුරෝහිත තනතුර ලැබූයේය ඔහු වනාහි ගොත්‍ර වශයෙන් කාත්‍යායනයයි ප්‍රසිද්ධවිය චණ්ඩප්‍රද්‍යෝත රජ්ජු වනාහි බුදුන් ලෝ පහළවූ බව අසා ඇදුරනි තොප ඒ බුදුන් කරා ගොස් උන්වහන්සේ මෙහි කැඳවාගෙණ එවයි පිටත්කෙළේයි ඒ කාත්‍යායන පුරෝහිත බ්‍රාහ්මණතෙමේ තමන්පිරිවර බමුණන් සත්දෙනෙක් සමග ශාස්තෘන් වහන්සේ සමීපයට ගියේයි ශාස්තෘන්වහන්සේද ඔවුන්ට ධර්මදේශනා කෙළේයි දේශනාවගේ කෙළවර ඒ කාත්‍යායන පුරෝහිත තෙමේ පිරි වර බමුණන් සත්දෙනා හා සමග සිව්පිළිසිඹියාවෙන් යුත් රහත්ඵල යෙහි පිහිටියේයි ඉක්බිති ශාස්තෘන්වහන්සේ මෙසේ එව මහණෙනියි සිවුරුගැබින් දකුණු ශ්‍රී හස්තය නිකුත්කොට අඬනා වදාළේයි එක ණෙහිම ඔවුන් අටෑදන දැහුල් පමණ හිසකේ රැවුල් ඇත්තාහු සෘද්ධිමය පාසිවුරු දරන්නාහු සැටවස්හිය මහතෙරුන්මෙන් වූවාහු ය මෙසේ ඒ කාත්‍යායන ස්ථවිරයන්වහන්සේ ස්වාර්ථනිෂ්පාදනය කො ට ස්වාමීනි ප්‍රද්‍යෝත රජතෙමේ තුබවහන්සේගේ ශ්‍රී පතුල් වඳනේය හෙතෙම ධර්මයද අසනු කැමැත්තේයයි ශාස්තෘන්වහන්සේට දැන්වූ යේය ශාස්තෘන්වහන්සේ මහණ තෝම එහි යව ඒ ප්‍රද්‍යෝත රජ තෙමේ පහදින්නේයයි වදාළේයි කාත්‍යායන ස්ථවිරතෙමේද පිරිවර තෙ රුන් සත්දෙනාත් සමග උදේනි නුවරට ගොස් ප්‍රද්‍යෝතරජ්ජු තුනු

රුවන් කෙරෙහි පහදවා අවන්තිරට ශාසනය පිහිටුවා නැවත ශාස්
තෲන්වහන්සේ සමීපයටම ආයේය මෙසේ ඒ කාත්‍යායන ස්ථවිරයන
මේ පැමිණෙනලද අග්‍රඵල ඇත්තේ පියුමතුරුනම් බුදුන් හමුයෙහි
කරණලද ප්‍රාර්ථනාව මස්තකප්‍රාප්තවූ බව දැක වදරා සිව්පිරිස් මධ්‍ය
යෙහි "එතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛූනං සංඛිත්තේන
භාසිතස්ස විත්ථාරෙන අත්ථං විභජන්තානං යදිදං කච්චානො" යි යනු
වෙන් එතදග්‍රස්ථානයෙහි තබා වදාළේයි මේ කාත්‍යායන ස්ථවිරයන්
වහන්සේ වනාහි සියළු ශ්‍රාවකයන් අතුරෙන් රූපශ්‍රීයෙන් අග්‍රතැන්
පත්වූ දුටුවන් සිත් පැහැරගන්නා රූප සෞන්දර්‍ය්‍යයකින් යුක්තවූ
සේක් ඒ එසේමැයි, එක්සමයෙක්හි සොරෙය්‍යකනම්රට සොරෙය්‍යක
සිටානන්ගේ පුත්‍රතෙමේ යහළුවන්සමග මහත් පිරිවරින් නහනුතොට
ට යන්නානු සිවුරු ගැටවවුගන්වමින් නුවරින්පිටත වැඩසිටිමහාකා
ත්‍යායන ස්ථවිරයන් දැක උන්වහන්සේගේ රන්වන්වූ ශරීර වර්ණයෙහි
විසම ලෝභ උපදවා ඉදින් මුන්වහන්සේ මට භාර්‍ය්‍යා වීනම් හෝ
මාගේ බිරිඳගේ ශරීරවර්ණය මෙබඳු වීනම් හෝ යෙහෙකැයි සිතුයේ
ය ඔහුගේ ඒ සිත හා සමග පුරුෂලිංගය අන්තර්ධානවී ස්ත්‍රී ලිංගය
පහළවීය ඉක්බිති ලජ්ජාවට පැමිණියාවූ ඕතොමෝ යානාවෙන්බැස
පෙරලා ගෙටනොගොස් තක්සලාවට පලාගියේය ඒ තක්සලානුවර
එක්තරා සිටුපුත්‍රයෙක් දැක පිළිබඳ සිත්ඇත්තේ තමාගේ ගෙට කැ
ඳවාගෙණ ගොස් භාර්‍ය්‍යාකොට පාවාගත්තේය ඈ වනාහි ඔහුසමග
වැස පුත් දෙදෙනෙකු වැදූහ මෙසේ ඇගේ කුස උපන්දරු දෙදෙ
නෙක සොරෙය්‍යක නුවර තමහටදුව උපන්දරු දෙදෙනෙකැයි ද
රු සතරදෙනෙක් ඇතිවූහ මෑතභාගයෙහි සොරෙය්‍යකනම් නුව
රින් ගැල් පන්සියයෙක බඩු පටවා වෙළඳාම් පිණිස තක්සලාවට ආ
තමාගේ යහළු සිටුපුත්‍රයෙක් දැක සියළු පවත් කියා ඔහුගේ වචන
යෙන් මහා කාත්‍යායන ස්ථවිරයන් නිමන්ත්‍රණයකොට ගෙට කැඳවා
සත්කාර පෙරටුකොට ඇති මහදන්දී මහතෙරුන් ක්ෂමාකරවිය
උන්වහන්සේද ක්ෂමාවූයෙමියි කී පමණින්ම ස්ත්‍රී ලිංගය අන්තර්ධාන
වී පුරුෂලිංගය පහළවූයේයි ඉක්බිති හෙතෙම දරු දෙදෙනා පියා
නන්ට පාවාදී මහාකාත්‍යායන ස්ථවිරයන්ලඟ පැවිදිව නොබෝකල
කින් විදර්ශනාවඩා සිව්පිළිසිඹියා සමග රහත්ඵලයට පැමිණියේයි
මෙසේ මේ කාත්‍යායන ස්ථවිරයන්වහන්සේ සියල්ලන් කෙරෙන් අග්‍ර
ප්‍රාප්ත රූපශ්‍රීන් යුක්තවූහ.

තවද එක්සමයෙක්හි මේ මහාකාත්‍යායන ස්ථවිරයන්වහන්සේ
ගිජුකුළුපව්වෙහි වසනුසේ එක්දවසක් උදැසන ගිජුකුළුපව්වෙන්

බස්නහු දැක වස්සකාරනම් බ්‍රාහ්මණතෙමේ මොහු විදුරෙකු මෙන් දමිළයෙන් බස්නේයයි කීය මෙම කථාප්‍රවෘත්තිය භාග්‍යවතුන්වහන්සේ අසාවදාරා ඉදින් වස්සකාරතෙමේ සැමාකෙළේනම් යමෙහෙක සමා නොකෙළේනම් මෙම වේළුවනයෙහිම රිළා වඳුරෙක්ව උපදනේයයි වදාළේයි වස්සකාර තෙමේ එපවත් අසා භවත් ගෞතමයන්ගේ දෙබසෙක් නම් නැත්තේයි පසුව රිළා වඳුරුව උපදනා මට මේ වේළුවනය ගොචරස්ථාන වන්නේයයි නොයෙක් පළතුරු හිඳුවා රුකවල් ලූහ මෑතභාගයෙහි වස්සකාරතෙමේ කළුරියකොට එහිම රිළා වඳුරුව උපන්නේයි වස්සකාරයයි අඬගාලූ කල්හි ඔහු දිවාවිත් ලඟ සිටින්නේයි මේ කථාවස්තුදෙක වනාහි සමානොකළ ආර්‍ය්‍යොපවාද අකුසල කර්මයන්ට උදාහරණ වශයෙන් දක්වාන්නේබ. විස්තර කැමැත්තවුන් විසින් ධම්මපදට්ඨකථාවෙන් හා ගෝපකමොග්ගල්ලාන සූත්‍ර වර්ණනාවෙන්ද දතයුතුයි. )

( 9 ) යෙන, ඒ මහාකාත්‍යායන ස්ථවිරයන් විසින්; භාසිතා, දෙසනලද්දවූ; සත්ථාරා, ශාස්තෘන්වහන්සේ විසින්; අනුමොදිතා, සතුටුවැයි අනුමෝදන්වනලද්දවූ; සාසනස්ස, පර්‍යාප්ති ශාසනයට; සදාතනා, හැමකල්හි අයත්වූ; ( සෙවත් සර්වප්‍රකාරයෙන් අයත්වූ ) නවඞ්ගස්සවණ්ණනා, සූත්‍රාදී නවාඞ්ගයාගේ අර්ථවර්ණනාවවූ; යා නෙත්ති, යම් නෙත්තිප්‍රකරණයක්වීද;(ජම්බුනම් වනලැහැබෙහි වැඩවසන්නාවූ මහාකාත්‍යායන ස්ථවිරයන්වහන්සේ තමන්ගේ සන්තිකාවචරභික්ෂුන්ට නවාඞ්ගශාස්තෘ ශාසනයාගේ හාරනය සාසන පට්ඨානවශයෙන් අර්ථවර්ණනාගතිවිභාවනය පිණිසද ගම්භීර විචිත්‍රාර්ථ පරිදීපනාය පිණිසද මේ නෙත්තිය වදාළේයි, ඒ එසේමැයි පෙටකොපදෙසය සඞ්ගායනා කරන්නාවූ ධර්මසඞ්ගාහක ස්ථවිරයන් විසින් එහි ආරම්භයෙහි "ථෙරස්ස මහාකච්චානස්ස ජම්බුවනසණ්ඩවාසිනො" යි කියනලදී එහෙයින් මේ නෙත්තියද ජම්බුවනෂණ්ඩයෙහිදී දෙශනාකරණලදයි දතයුතුයි එක්සමයෙක්හි ආයුෂ්මත් මහාකාත්‍යායනස්ථවිරයන්වහන්සේ ජම්බුවනෂණ්ඩයෙහි වැඩවසනුයේ තමන්ගේ සන්තිකාවචරභික්ෂුන්ට හාරනය ශාසන පට්ඨාන ක්‍රමයෙන් ප්‍රතිමණ්ඩිතවූ මේ නෙත්ති ප්‍රකරණය දෙශනාකෙළේයි ඉක්බිති භාග්‍යවතුන් සමීපයට එළඹ බුදුන්ට නමස්කාරකොට එකත්පසෙක හිඳ තමන් විසින් දෙසනාකරණලද මේ ප්‍රකරණය භාග්‍යවතුන්වහන්සේට දැන්වූහ භාග්‍යවතුන්වහන්සේද "සාධු සාධු කච්චාන සාධු ඛො ත්වං කච්චාන ඉමං සද්ධම්මසංවණ්ණනං අභාසි" යනුවෙන් අනුමෝදනාකොට "තස්මාතිහ ත්වං කච්චාන ඉමං සද්ධම්මසංවණ්ණනං ධම්මනෙත්තිත්වෙව ධාරෙහි" යනුවෙන් නාමග්‍රහණයකර වදාළේයි. )

(10-11) ගම්භීරඤාණෙහි, ගැඹුරුනුවණැත්තාවූ ආචාර්යයන්විසින්; ඔගාහෙතබ්බගාවතො, බැසගැන්ම කටයුතු බැවින්; තස්සා, ඒ නෙත්තියගේ; අත්ථසංවණ්ණනා, අර්ථයන්ගේ සංවර්ණනාව; මයා, මා විසින්; කාතුං, කරන්නට; කිඤ්චාපිදුක්කරා, කිසිසේත් දුෂ්කරවන්නී ද ( තථාපි-යනු අධ්‍යාහාරයි, එසේද වුවත් ) යස්මා, යම් හෙයකින්; සඞ්ගහසංවණ්ණනං, අර්ථවර්ණනා සහිතවූ; සත්ථුසාසනං. පර්යාප්ති සංඛ්‍යාතවූ සර්වඥශාසනය; ධරෙත, විද්‍යමානවේද; පුබ්බාචරියසීහානං, පරවාදීන් මර්දනයකිරීමට සූරභාවයෝගයතාදියෙන් සිංහසදෘශවූ පූර්වාචාර්යයාතනමයන්ගේ; විනිච්ඡයො, විනිශ්චයතෙම; තිට්ඨතිඑව. සිටින්නේමවේද.

(අත්ථො සංවණ්ණීයති එතායාති අත්ථසංවණ්ණනා-යනුද, සංවණ්ණනාය සඞ්ගහවත්තනතීති සඞ්ගහසංවණ්ණනං-යනුද, දිට්ඨධම්මිකාදිඅත්ථෙහි යථාරහං සත්තෙ සාසති එතෙනාති සාසනං-යනුද, සත්ථුනො සාසනං සත්ථුසාසනං-යනුද, පරවාදීන මද්දිතුං නවසෙනවා සූරභාවයොගතාදිනාව සීහසදිසත්තා සීහා, පුබ්බාචරියාච තෙ සීහාචාති පුබ්බාචරියසීහා-යනුද, විනිච්ඡීනීයති එතෙනාති විනිච්ඡයො-යනුද, විසෙසෙනවා තං තං කාරණං නීහරිත්වා ඡිජ්ජතීති කඞ්ඛිතමෙතෙනාතිවිනිච්ඡයො-යනුද, සමාසවාක්‍යයි. අර්ථවර්ණනා යනු අර්ථකථායි යම් අර්ථවර්ණනාවකින් ව්‍යඤ්ජනාර්ථය පදානුගතාර්ථය නිදානය වස්තුය සම්බන්ධය යන මේ පඤ්චප්‍රකාර අර්ථය වර්ණනාකෙරේද? මෙතොමෝ අර්ථකථානම් වේයි දන්නාලදී, එහෙසින් කීහ.

"යා යත්ථං අභිවණ්ණෙති බ්‍යඤ්ජනත්ථපදානුගං,
නිදානවත්ථුසම්බන්ධං එසා අට්ඨකථා මතා"යි.

ඒ ඒ තන්හි වදාරණලද්දාවූ පාලියම සමහවන පරිද්දෙන් ත්‍රිපිටක පර්යාප්තියගේ අර්ථකථනයට ප්‍රමාණවෙයි කිසිසේත් ඒඒ තන්හි භගවත්නු විසින් පවත්වනලද ප්‍රකීර්ණක දේශනාවම අර්ථකථා නම්වේ. පාළිවශයෙන් වනාහි ධර්මසඞ්ගාහක මහාස්ථවිරයන් විසින් සඞ්ගීතියට නොනැගූ බැවින් ඒ භගවත්හුගේ ප්‍රකීර්ණක දේශනා තොමෝ සංවර්ණනා නම්විය එහෙසින් අර්ථකථාව අර්ථකථාචාර්යයන්ගේ මතිමාත්‍රයක්නොව භගවත්හුගේ ප්‍රකීර්ණක දේශනාවයයි දතයුතුයි, එහෙසින්කීහ සංගහට්ඨකථායෙහි. )

"තත්ථ පන වුත්තා පාළිමෙව අත්ථසඞ්ගහවං අට්ඨකථාය අත්ථපරියෙසනාය පමාණතායිකත්වා ධරෙති සත්ථුසාසනන්තිවුත්තං, කිඤ්චාපි තත්ථ තත්ථ භගවතා පවත්තිතා පකිණ්ණකදෙසනායෙව අට්ඨකථා පාළිව

යෙන පන සඞ්ගීතිම්හා ආරුළ්හාතා සංවණ්ණනාභාවිසෙසභූතා නෙත්ති සකසංවණ්ණනාති විසෙසනං වුත්තං. )

(12) තස්මා, එහෙයින්; තං, ඒ අර්ථකථාසහිත පෙටකෝපදේශ ශාසනය; උපනිස්සාය, උපනිශ්‍රයකොට (හෙවත්) කාරණාකොට; පඤ්චපි නිකායෙ, පඤ්චනිකායෙහි; (හෙවත්, දීඝ, මජ්ඣිම, සංයුත්ත, අඞ්ගුත්තර, ඛුද්දක, යන පඤ්චනිකායන්) ඔගාහෙත්වාන, අවගාහනය කොට (හෙවත් නුවණින් බැසගෙණ) පෙටකෝපදෙසතොපි, පෙටකෝපදේශය හා සමගද; යථාබලං, ශක්තිපරිද්දෙන්; සංසන්දෙත්වා, ගළපා; (එහි මේ නෙත්ති සොහොමෝ පත්මහාකසිපයන් දක්වනලද උදාහරණ පාලියහා සම්බන්ධ හුයි තදුදාහරණ පාලිඅර්ථය පඤ්චමහානිකායන් මුලින් අවගාහනය කොට දක්වීමෙහි යුක්තියෙහි සමත්වන පරිද්දෙන් හෝ පෙළට අවිරුද්ධ වශයෙන් ඒ ඒ තන්ති පාඨයන් අවලම්බනයකොට අර්ථවිභාවනය කිරීමම අර්ථකථානාමවේහුයි, කෙතතන්‍යාපිවණ්ණනා කරන්නහු විසිනුදු පාඨානුරූප වශයෙන්ම වණ්ණනාකටයුතුනම්වේයි යන අර්ථය "ඔගාහෙත්වාන පඤ්චපිනිකායෙ" යන පදයෙන් දක්වූයේයි. තම් නෙත්තිතො මෝ මනාති හාර, නය, සාසන පට්ඨාන යන්ගේ විචාරසාමාන්‍යයෙන් පෙටකොපදේශය හා සදෘශබැවින් මේ සියළු නෙත්තිප්‍රකරණයාගේ අර්ථය ගඞ්ගෝදකයෙන් යමුනෝදකය සංසන්දනය වන්නාක් මෙන් සංසන්දනයකොට ගළපා අර්ථවිචාරණය කටයුතු හෙයින් "පෙටකොපදෙසතොපිසංසන්දෙත්වා" යනුකිය, "අස්සාදෙව ආදීනවොච" යනාදී පෙටකොපදෙශ පාලිය එළවාට දෙසනාහාරාදීන්ගේ අර්ථවිනිශ්චය කිරීම පෙටකය හා සංසන්දනය කිරීමනම් වෙයි.

(පිටකස්ස ඉදං සංවණ්ණනං පිටකත්ථංවා විවරතීති පෙටකං-යනු පෙටක ශබ්දයාගේ නිෂ්පත්තියි, ආයුෂ්මත් මහාකාච්චායන ස්ථවිර යන්වහන්සේ විසින් දෙශනාකරණලද (දුක්ඛෙහෙතු දුක්ඛපච්චයා සාවකස්ස සම්මාදිට්ඨියා උප්පාදය) යන පාඨය මුල්කොට ඇත්තාවූ ප්‍රකරණය, පෙටකනෝ, පෙටකොපදෙශනම් වෙයී. )

(13) සුවිසුද්ධං, නිකායාන්තරලබ්ධි දොෂයන්ගෙන් අතරතුර ඇතුළත් නොකරණලද බැවින් (හෙවත් නිකායාන්තරලබ්ධියෙන් අසම්මිශ්‍රවූ හෙයින් අතිශයින් නිර්මලවූ) අසංකිණ්ණං, සනිකායෙහිද පදන්තර අර්ථාන්තර පරිකල්පනාදී වශයෙන් අසංකීර්ණවූ; (හෙවත් එබඳු සංකර දොෂ විරහිතබැවින් අනාකුලවූ මනාකොට පිරිසිඳිනාලද අර්ථඇත්තාවූ) නිපුණත්ථවිනිච්ඡයං, විවිධාකාරයෙන් විනිශ්චය කරණලද්දවූ අර්ථවිනිශ්චය ඇති (හෙවත් ග්‍රන්ථස්ථානවූ අර්ථයෙහිය

සිලුම්දිනාකාරයෙන් පැවති විවහිවිජ්ජනකථා ඇත්තාවූ) මහාවිහා රවාසීනං, අනුරාධපුර මහාවිහාරවාසීවූ මහාස්ථවිරයන්ගේ; සමයං, සිද්ධාන්තය(හෙවත් සම්ඥවනය) අවිලොමයං, විරොධනොකරන්නේ ( මහාවිහාරවාසීනුය යනු ත්‍රිපිටක චූලනාග ස්ථවිරාදීහුයි සද්ධාතිස්ස රජුගේ පුත්‍රවූ වට්ටගාමිණී අභයරජු විසින් කරවනලද අභයගිරි විහා රවාසී භික්ෂූනු ගගිරිනවනමිංවී, සිංහලද්වීපයෙහි ශාසනය පිහිටිතැන් පටන් දෙසිය අටළොස්වන අවුරුද්දවූ පැමිණිකල්හි වට්ටගාමිණී අ භයනම් රජතෙම නාගරගිඩනාම් සෙනෙවියා මැඩ ලඞ්කාරාජ්‍යය කර ණුයේ දකුණුදඹදිවින් දෙමළුන් සත්දෙනෙක් අවුත් යුද්ධකොට පර දවා තුදුස් හවුරුද්දක් සැඟවී සිටියේය එකල්හි මහාතිස්සනම් තෙර කෙනෙකු නිරන්තරයෙන් උපස්ථානකරණලදී මෑනහානමෙහි සත් දෙමළුන් පරදවා තක්ෂප්‍රාප්තවූ ලංකාරාජ්‍යඇත්තේ ගිරිනම් නිගණ්ඨ යාගේ නිවාසස්ථානයෙහිකළ බැවින් අභයගිරිනම්ලද විහාරයක්කො ට ඒ මහාතිස්ස තෙරුන් පිදූයේය ඒ මහාස්ථවිරතෙම කුළුදුසු ගිහි සං සගී දෝෂයෙන් මහාවිහාරවාසීන් කෙරෙන් බැහැරකරණලදුයේ ශා සනකණ්ටකයෙක්ව පරම්පරා වංශය වඩා අභයගිරිනම් නිකායක් කොළේයි ඒ නිකාය වනාහි කථාවස්තු ප්‍රකරණ අටුවායෙහි ආතනසින් මහාසංඝිකයන්ගෙන් භින්නවූ ධම්මරුචිකනම් වෛතුල්‍යවාදය ප්‍රකා ශකොළේයි. ශාසනය පිහිටීමෙන් සවිල්පයක් අඩුවූ සසිය හවුරුද්දක් ඉක්මතියකල්හි අභයගිරිවාසී නිකායට නිග්‍රහකලාවූ සිරිසංඝබෝධි මහරජුගේ පුත්වූ මහාසේනනාම රජතෙමේ ලංකාරාජ්‍යයකරණුගේ මහාවිහාර කොළවර පිහිටි ජේතවන නම් උයන්හි ජේතවන නම් විහාරයක් කරවා සගිරිතත්‍යෙන් භින්නවූ දක්ෂිණවිහාරනිකායිකවූ තිස්ස ස්ථවිරයන් කෙරෙහි පැහැද ඒ විහාරය පිදූයේය. ඒ තිස්ස ස්ථ විර තෙමේද ශාස්තෘශාසනයට පහරදෙනුයේ දෙනානවනාම් නිකා යක් කොළේයි දක්ෂිණවිහාර නිකායයි දු කියත් දෙනානවසවැසී ථෙර වංශය ධම්මරුචිකායන්ගෙන් භින්නවූ ශාගලිකවාදය ප්‍රකාශකොළේයි.)

(14) පමාදලෙඛං, ලෙඛකයන්ගේ ප්‍රමාද ලිපිදෝෂය; වජ්ජෙත්වා, දුරුකොට; පාළිං නම්මාතිසොජයං, ඒ ඒ නෙත්තිපාළිය ඒ ඒ තන්හි උදාහරණ වශයෙන් එලවනලද සූත්‍රයෙන් අත්ථසංවණ්ණනාවෙහි හෝ ඒ ඒ උදාහරණ පාළිය ඒ ඒ ලක්ෂණභූතවූ නෙත්තිප්‍රකරණයෙහි මෝ නාවට යොදමින්; උපදේසංවිභාවයන්තො, (ස්ථානවිභාගයෙන්වූ නෙ ත්තිස් වැදෑරුම් නෙත්තිපදස්ථියාගේ විභාගයෙන් අසඞ්කරවශයෙන් ව්‍යවස්ථාකරණලද විසයසාධ්‍යනාවූ ) නෙත්තිඋපදේශය ප්‍රකාශ කරමින්,( තස්සා, ඒ නෙත්තියගේ ) අත්ථවණ්ණනං, අර්ථවර්ණනාව; කරිස්සාමි, කරන්නෙමි.

(මෙසේ කරණ ප්‍රකාරය දක්වා දූන් මේ ධර්මසංවර්ණනාව ශ්‍රවණය කිරීමෙහි උත්සාහජනකයද කරණුයේ, “ඉතිඅත්ථං” යනාදී අවශාන කථාව කීහ. ඒ එසේමැයි. මේ ධර්මසංවර්ණනාව සකස්කොට ඇසීම කරණකොටගෙණ අනුපාදිශෙෂ නිර්වාණධාතුව අවසන්කොට ඇත්තාවූ සියළු අර්ථයෝ මනාකොට සිද්ධකරන්නීවෙයි, යනු ආචාර්ය්‍යයන්ගේ මේ ආණත්තියයි, මෙය ශ්‍රවණයකිරීමෙන්(හෙවත්) මේ අර්ථවිචාරණයෙන් නෙත්තිපාලියෙහි විජානනයවෙයි, නෙත්තිපාලියෙහි විජානනය වනාහි සංවර්ණනාකටයුතුවූ අට්ඨකථා සහිත ත්‍රිපිටක පාලියගේ අර්ථවිජානනය පිණිස වෙයි, ඒ අර්ථවිජානනය භගවත්හු විසින් තහනම් කරණලද වාරිත්‍ර සීලය දුරුකොට අනුදන්නාලද චාරිත්‍ර සීල සංඛ්‍යාත ප්‍රතිපත්තියෙහි පිළිපැදීම පිණිස වෙයි, එයින් ධර්මොපසංහිතවූ ප්‍රමොදය ලැබෙයි, ප්‍රමුදිතවූවාහට ප්‍රීතිය උපදී, ප්‍රීතිසිත් ඇත්තහුට කායප්‍රශ්‍රබ්ධිය ලැබේ. කායප්‍රශ්‍රබ්ධිය ඇත්තහු සුඛවේදනාව ලබයි, සුඛවේදනාව ඇත්තහුගේ සිත එකඟවෙයි, චිත්තෛකාග්‍රතාසංඛ්‍යාත සමාධිඇත්තාහට යථාභූත ඥානදර්ශනය පහළවෙයි යථාභූත ඥානදර්ශනයාගේ විදර්ශනා පරම්පරාවෙන් අනුපාදිශෙෂ නිර්වාණධාතුව අවසන්කොට ඇත්තාවූ සකලාර්ථසිද්ධිය සම්භව වන්නේයයි දතයුතුයි.)

(15) ඉති, යථොක්ත ක්‍රමයෙන් නෙත්තිප්‍රකරණයාගේ යථොක්තාලඞ්කාර රහිතබැවෙන්; විභජන්තස්ස, විභාගකරන්නාවූ; නෙත්තිප්පකරණස්ස, නෙත්තිප්‍රකරණයාගේ; අසංකිණ්ණං අත්ථං, පරවාදයෙන් මිශ්‍රනුවූ අර්ථයතෙම; මෙ, මාගේ සමීපයෙන්; සාධවො, එම්බා සාධුසත් පුරුෂ ජනයෙනි; සක්කච්චං, සකස්කොට; නිසාමයථ, ශ්‍රවණය කරව්. (නොහොත්) සක්කච්චං, සකස්කොට; විභජන්තස්ස, විභාගකරන්නාවූ; නෙත්තිප්පකරණස්ස, නෙත්තිප්‍රකරණයාගේ; ( කියාගෙන් සම්බන්ධකටයුතුයි— මෙසේ සම්බන්ධය ඇතිකල්හි “යෙ ඉමෙ භික්ඛවෙ භික්ඛූ දුග්ගහීතෙහි සුත්තන්තෙහි අත්ථබ්‍යඤ්ජනපතිරූපකෙහි අත්ථංච ධම්මංච පටිබාහන්තිතෙ භික්ඛවෙ භික්ඛූබහුජනාහිතාය පටිපන්නා බහුජනාසුඛාය බහුනොජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං බහුංචඛො භික්ඛවෙ තෙභික්ඛූ අපුඤ්ඤං පසවන්ති තෙචිමං සද්ධම්මං අන්තරධාපෙන්තීති” යන්නෙන් හා“වෙමෙ භික්ඛවෙ තථාගතං අබ්භාචික්ඛන්ති කතමෙවෙ යොචනෙය්‍යත්ථං සුත්තන්තං නීතත්ථො සුත්තන්තොති දීපෙති යොච නීතත්ථං සුත්තන්තං නෙය්‍යත්ථො සුත්තන්තොති දීපෙති ඉමෙඛො භික්ඛවෙ ද්වෙ තථාගතං අබ්භාචික්ඛන්තී” යනමේ ආදී අනෙකප්‍රකාරයෙන් වදාරණලද අශුභකාරණයන් දුරුකොට “යෙතෙ භික්ඛවෙ භික්ඛූ සුග්ගහීතෙහි

සුත්තන්තෙහාපි බ්‍යඤ්ජනපතිරූපකෙහි අත්ථංච ධම්මංච අනුලොමෙන්ති තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනහිතාය පටිපන්නා බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං බහුංච තෙ භික්ඛවෙ භික්ඛූ පුඤ්ඤං පසවන්ති තෙ චිමං සද්ධම්මං ඨපෙන්ති' යනුමෙන් හා "ද්වෙමෙ භික්ඛවෙ තථාගතං නාබ්භාචික්ඛන්ති කතමෙ ද්වෙ? යො ච නෙය්‍යත්ථං සුත්තන්තං නෙය්‍යත්ථො සුත්තන්තොති දීපෙති යො ච නීතත්ථං සුත්තන්තං නීතත්ථො සුත්තන්තොති දීපෙති ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා තථාගතං නාබ්භාචික්ඛන්ති" යන මේ ආදී අනෙකප්‍රකාරයෙන් දෙශනාකරණලද යුක්තකාරණයන් ගෙණ අර්ථ විභාගකටයුතුබව දක්වයි.

නිදාන ගාථාසන්නය නිමි.

# නෙත්තිශබ්දයෙහි නිර්වචන.

නෙත්තීති කෙනට්ඨෙන නෙත්ති සද්ධම්මනයනට්ඨෙන නෙත්ති යථාහි තණ්හා සත්තෙ කාමාදිභවං නයතීති භවනෙත්තීති වුච්චති එවමයම්පි වෙනෙය්‍යසත්තෙ අරියධම්මං නයතීති සද්ධම්මනයනට්ඨෙන නෙත්තීති වුච්චති අථවා නයන්ති එතායාති නෙත්ති තෙ තන්තිප්පකරණෙන හි කාරණභූතෙන ධම්මකථිකා වෙනෙය්‍යසත්තෙ දස්සනමග්ගං නයන්ති සම්පාපෙන්තීති නීයන්තිවා එතෙනාතිමං පකරණං අධිට්ඨානභූතෙන පතිට්ඨාපෙත්වා වෙනෙය්‍යා නිබ්බානං සම්පාපියන්තීති නෙත්ති නහි නෙත්ති උපදෙසසන්නිස්සයෙන විනා අවිපරීතසුත්තත්ථාවබොධො න සම්භවති.

මෙහි අර්ථ, කෙනට්ඨෙන, කවර අර්ථයකින්; නෙත්තීති, නෙත්ති යයි කියනුලැබේදයත්? සද්ධම්මනයනට්ඨෙන, මාර්ගඵල නිර්වාණ සංඛ්‍යාත නවලොකොත්තර ශ්‍රී සද්ධර්මයට පමුණුවන අර්ථයෙන් (නෙත්ති නම් වේ ) යථාහි, යම්සේ වනාහි; සත්තෙ, සත්වයන්; කාමාදිභවං, කාමරූපා රූපසඤ්ඤී අසඤ්ඤී නෙවසඤ්ඤී නාසඤ්ඤී එකවොකාර චතුවොකාර පඤ්චවොකාර සංඛ්‍යාත නවවිධ භවයට; නයති, පමුණුවාදුයි, තණ්හා, තෘෂ්ණාතොම; භවනෙත්තීති, භවනෙත්ති යයි; වුච්චති, කියනුලැබේද; එවං, මෙසේ; අයම්පි, මේ නෙත්තිප්‍රකරණී තොමෝද; වෙනෙය්‍යසත්තෙ, විනයනයකටයුතු කල්‍යාණ පෘථග්ජන සත්වයන්; අරියධම්මං, ආර්‍යසත්‍යතානයෙහි පැවතිලොකො

කා ලොකොත්තර ගුණයන්ම ( හෙවත් ) නවලොකොත්තර ශ්‍රී සද්ධර්මයට; නායන්ති, පමුණුවාතුයි; සද්ධම්මනයනෙන, සද්ධර්මයට පමුණුවා අර්ථයෙන්; නෙත්තිනිමුවවනි, නෙත්තීයයි කියනුලැබේ.

නිපාතුණෙන, යතාධාතුනු කෙරෙන් පරවකනාකාරකයෙහි නි ප්‍රත්‍යය වූ ඞිව නෙත්තියන පදසිද්ධියවේ: අථවා, නොහොත්; නාය, ඒ නෙත්තිනායාය කාරණකොටගෙණ; නායනත්ති, විනෙය සත්වයන් ශ්‍රී සද්ධර්මයට පමුණුවන්නුයි; නෙත්ති, නෙත්තිනාම් වේ; හි, ඒ එසේමැයි; කාරණභූතෙන, හෙතුභූතවූ; නෙත්තිප්පකාරෙණ, නෙත්ති ප්‍රකාරණය කාරණකොටගෙණ: ධම්මකථිකා, ධර්මකථිකයෝ; වෙනෙය්‍යසත්තෙ, විනයනය කටයුතු කල්‍යාණ පෘථග්ජන සත්වයන්; දස්සනමග්ගං, සොවාන් මාර්ගයට(නයනන්තියෙසි) සම්පාපෙන්ති, මනාකොට පමුණුවන්නුයි; නෙත්ති, නෙත්තිනම් වේ (කරණකාරකයෙහි පදසිද්ධවන ක්‍රමයති(උත්ත,ශේසි) අධිට්ඨානභූතෙන, ආධාරභූතවූ; එතස්මිං පකරණෙ, මේ ප්‍රකරණයෙහි; පතිට්ඨාපෙත්වා, පිහිටුවා ( හෙවත් නෙත්ති ග්‍රන්ථයෙන් සූත්‍රාර්ථ වර්ණනාකොට; වෙනෙය්‍යා, විනයනය කටයුතු සත්වයෝ; නිබ්බාණං, නිර්වාණයට; සම්පාපියන්තීති වා, මනාකොට පමුණුවනුලැබෙත්නුයි කියා හෝ; නෙත්ති, නෙත්තිනාමිවේ; හි, ඒ එසේමැයි; නෙත්තිඋපදෙස සන්නිස්සයෙන විනා, නෙත්තිනාය සංඛ්‍යාත උපදෙශ සන්නිශ්‍රයෙන් තොරව; අවිපරීත සුත්තත්ථාවබොධො, අවිපරීතසූත්‍රාර්ථාවබොධය; නසම්භවති, සම්භව නොවන්නේයි. ආධාරකාරකයෙහි පදසිද්ධියයි.

සද්ධම්මනයනෙනයනාදීන් සංක්ෂෙපයෙන් පළමුකොට කියනු ලබන්නාවූ සාධනත්‍රයට සාධාරණවශයෙන් නෙත්තිපදසිද්ධිය කියා යථාහි යනාදීන් අර්ථවිවරණය කරයි එහි ප්‍රත්‍යාහි ප්‍රත්‍යයාදියෙන් ශබ්ද නිෂ්පත්තිය සාමාන්‍යවශයෙන්ද තෘෂ්ණාවගේ කාමාදීභවයෙහිනුවම් භවනයනය මෙන් ආරක්ඛම් නෙතුවම සම්බන්ධය නුසී නයනාකාර සාමාන්‍ය වශයෙන්ද යථාහි යනාදියෙන් සදෘශකල්පනාව සාමල්ලයි කිසිසේත් "තණ්හානුසොතෙන භවනෙත්ති" යනුවෙන් ආයුෂ්මත් රාධස්ථවිරයන් විසින් විචාරණලද භාගවත්හතේම "රූපෙ ඛො රාධ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපාදානුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා අයං වුච්චති භවනෙත්ති" යනාදිය වදාලේද එසේදමුවන් "උච්ඡින්නා භවතණ්හා ඛීණා භවනෙත්ති නත්ථිදානි පුනබ්භවො" යනුවෙන් මහාපරිනිබ්බාණ සූත්‍රාදීන්හි වදාල වචනය සඳහා තෘෂ්ණාවතාමේ භවනෙත්තියයි කියනලදුයි දතයුතුයි.

සූත්‍රසංඛ්‍යානවූ බුද්ධවචනයාගේ සියළු අර්ථසංවර්ණනාව නෙත්ති උපදේශය ඇතත්කොට ඇත්තීය ඒ නෙත්තිනයද සූත්‍රසංඛ්‍යාත සම්බුද්ධ වචනයෙන්ම ප්‍රභවවූයේයි සූත්‍රය සම්‍යක්සම්බුද්ධ ප්‍රභවයි ඒ නෙත්තිය වනාහි ප්‍රකරණ පරිච්ඡේද වශයෙන් හාර, නය, පට්ඨාන, යයි තුන් වැදෑරුම්වේ. එහි පළමුකොට හාරවිචාරයද ඊටඅනතුරුව නයවිචාරයද ඊට අනතුරුව පට්ඨානවිචාරයදැයි යන ක්‍රමයෙන් විභාගකරණු ලැබේ. පාළි ව්‍යවස්ථානවශයෙන් වනාහි සංග්‍රහවාර විභාගවාර වශයෙන් දෙවැදෑරුම්වේ ඒ එසේවැයි සියළු නෙත්තිය සංග්‍රහවාර විභාග වාරයයි වාරද්වයක් වේ එහි සංග්‍රහවාරය ආදියෙහි ගාථා පඤ්චකයකින් පිරිසිඳිනාලදී මේ සියළු ප්‍රකරණයෙහි “යංමලාවකා පූජයනෙ” යනාදී ගාථාපඤ්චකයෙන් නොගත්නාලද අර්ථයෙක් නම් නැත්තේයි එහෙයින් නෙත්තිප්‍රකරණයෙහි ආදි ගාථා පඤ්චකය සියළු ප්‍රකරණාර්ථයන්ගේ සංග්‍රහවාරයයි කියනුලැබේ. මේ සංග්‍රහවාරයෙහි ප්‍රස්ථානය සංග්‍රහ නොකරණලද්දේ නොවේදයත්? මුල්පදයන්ගේ ගැණීමෙන් පට්ඨානයද සංග්‍රහකටයුතු බැවින් පට්ඨානය සංග්‍රහවාරයෙහි අසංගෘහිතයයි නොදතයුත්තේයි එහෙයින් “අට්ඨාරසමූලපදාකුහිංදට්ඨබ්බා සාසනපට්ඨානෙ”යි කියනුලැබේ ඒ එසේමැයි අට්ඨාරසමූලපදයන් හා ප්‍රස්ථානාදීහු අර්ථනය සංස්කාර ත්‍රිකයන් මෙන් බවුනොවූන් සංග්‍රහනොකරණලද්දාහු වෙත්.

එහි මූලපදපට්ඨාන අර්ථනයයන්ගේ සංගෘහිතභාවය මතුපහලවේයි සංස්කාරත්‍රිකයන්ගේ වනාහි අන්‍යොන්‍යය සංගෘහිතභාවය මෙසේ දතයුතුයි. හේ කෙසේදයත් “තත්‍ථ කතමෙ අවිජ්ජාපච්චයා සංඛාරා පුඤ්ඤාභිසංඛාරො අපුඤ්ඤාභිසංඛාරො ආනෙඤ්ජාභිසංඛාරො කායසංඛාරො වචීසංඛාරො චිත්තසංඛාරො”යි කියනලද්දාවූ ත්‍රිකයෝ දෙදෙන එකදෙශානයින් හෝ සාමාන්‍ය නිර්දේශයෙන් හෝ සංස්කාරත්‍රිකයෝ නම් වෙත් එහිද “කායසංචෙතනා කායසංඛාරො වචීසංචෙතනා වචීසංඛාරො මනොසංචෙතනා මනොසංඛාරො”යි කියනලද ධම්මයෝම කායසංඛාරත්‍රිකයෝ නම්වෙත් අස්සාස පස්සාසාදීහු මෙන් නොවෙත් ඔවුන් අතුරෙහි වනාහි පුණ්‍යාභිසංස්කාරය කායදුශ්චරිතයෙන් වළකින්නාහට කායසංස්කාරවෙයි වචීදුශ්චරිතයෙන් වළකින්නාහට වචීසංස්කාරවෙයි මෙසේ කාමාවචර අෂ්ටමහාකුශල චේතනාවෝ පුණ්‍යාභිසංස්කාරද වෙයි කායසංස්කාරද වෙයි වචීසංස්කාරද වෙයි මනොද්වාරයෙහි උපන්නාවූ තෙලෙස්චේතනාවෝ පුණ්‍යාභිසංස්කාරදවෙයි චිත්තසංස්කාරද වෙයි අපුණ්‍යාභිසංස්කාරද වෙයි කායදුශ්චරිත වශයෙන් පැවැත්මක් ඇතිකල්හි කායසංස්කාරවෙයි කායචාර වචීචාර

සන්මුද මනෝචාරයෙහි පැවැත්මක් ඇතිකල්හි චිත්තසංස්කාරවේයි මෙසේ අපුණ්‍යාභිසංස්කාරය කායසංස්කාරද වෙයි වචීසංස්කාරද වෙයි චිත්තසංස්කාරද වෙයි කායසංස්කාරය වනාහි පුණ්‍යාභි සංස්කාරද වෙයි අපුණ්‍යාභිසංස්කාරද වෙයි ආනඤ්ජාභිසංස්කාර නොවෙයි එසේම වචීසංස්කාරද නොවෙයි චිත්තසංස්කාරය වනාහි පුණ්‍යාභි සංස්කාරද වෙයි අපුණ්‍යාභිසංස්කාරද වෙයි ආනඤ්ජාභි සංස්කාරද වෙයි මෙසේ සංස්කාරත්‍රිකයෝ අන්‍යෝන්‍ය සංග්‍රහීත වන්නාහුයයි දතයුතුයි.

විභාගවාරය වනාහි උද්දේසවාරය නිද්දේසවාරය පටිනිද්දේසවාරයයි තුන්වැදෑරුම් වේ ඒ වාරයන් අතුරෙහි "තත්ථකතමෙ සොළස හාරා" යන්නෙන් පටන්ගෙණ "කවනානි අඨාරසමූලපදානි" යන පදය දක්වා උද්දේසවාරය වේ නිද්දේසවාරය වනාහි "අස්සාදදීනවතා" යන පදය පටන් "භවනෙත්ති" යන පදය දක්වා නිද්දේසවාරයවේ පටිනිද්දේසවාරය වනාහි හාරවිභාගවාරය හාරසම්පාතවාරය නයසමුට්ඨානවාරය සාසනපට්ඨානවාරයයි සතරවැදෑරුම්වේ ඒ සතරවාරයන් අතුරෙහි "තත්ථ කතමො දෙසනාහාරො" යන පදය පටන්, "අයංපධානෙන සමාරොපනා" යන පදය දක්වා, හාරවිභාගවාරයයි "තත්ථ කතමො දෙසනාහාරසම්පාතො" යන පදය පටන් "අනුපාදිසෙසානිබ්බාණධාතු" යන පදය දක්වා හාරසම්පාතවාරයයි මේ හාරවිභාගවාර හාරසම්පාතවාර යන්ගේ වෙනස කවරේදයත්? යම්තැනක නොයෙක් උදාහරණ සූත්‍රයන්ගෙන් එකම හාරයක් ප්‍රකාශකරණලද්දේද මේ හාරවිභගවාරනම් වේ යම් එකම සූත්‍රයෙක්හි නොයෙක් හාරයෝ වැටෙද්ද මේ හාරසම්පාතවාරනම් වේ එහෙයින් කියනලද්දී පෙටකොපදෙශයෙහි.

"යත්ථ ච සබ්බෙහාරා-සම්පතමානා නයන්ති සුත්තත්ථං
බ්‍යඤ්ජනවිධිපුථුත්තා-සා භූමිහාරසම්පාතො" යි

නයසමුට්ඨානවාරසාසනපට්ඨානවාරයන්ගේ විභාගය ප්‍රකටමැයි.

මේ නෙත්තිප්‍රකරණය වනාහි කාත්‍යායන මහාශ්‍රාවකයාණන්වහන්සේ විසින් ජම්බුවන ෂණ්ඩයෙහිදී තමන්ගේ අතවැසියන්ට දෙශනාකොට නැවත අවුත් බුදුන්ගේ සමීපයෙහිදී ස්වාමීනි මාවිසින් පර්‍යාප්ති ශාසනයාගේ අචිරස්ථිතාව පිණිස මෙබඳු න්‍යායක්‍රමයක් මාගේ අතවැසියන්ට දෙශනාකෙළෙමියි දැන්වූකල්හි කාත්‍යායනය ඒ ග්‍රන්ථ යහපත "සබ්බනෙත්ති" යයි ඊට නම් කටයුතුයයි බුදුන් විසින් අනුමෝදනා කරණලද්දේය. යන මේ අර්ථය කෙසේ හැඟෙන්නේදයත් ඒ අර්ථය වනාහි පෙළින්ම හැඟෙයි.

සතරමහා ප්‍රදෙශයටත් අවිරුද්ධවූ යම් පාළියක් වේද ඒ පාළිය මිට ප්‍රමාණවෙයි පෙළටවඩා ප්‍රමාණ කටයුත්තක් නැත්තේමැයි ඒ එසේමැයි අගරහිතවූ ආචාර්‍ය්‍ය පරම්පරාවෙත් පෙටකොපදෙශය මෙන්ම මේ නෙත්තිප්‍රකරණයද ආයේශී එහි අගරහිතවූ ආචාර්‍ය්‍ය පරම්පරාවය යන්නෙන් සඞ්ඝිකාදිවංශය ප්‍රතික්ෂෙපකොට එකම ථෙරවාදය දක්වයි ඒ ථෙරවාදය වනාහි බුදුන් පිරිනිවී හවුරුදු සියයක් තුළ මහාකාශ්‍යපාදී මහාස්ථවිරයන්ගේ වංශාහරණභූත ථෙරවංශයයි නොහොත් ශාරිපුත්‍රය භද්‍රජිය සොභිතය පියජාලිය පියපාලය යනාදී මහාස්ථවිරයන්ගේ පරම්පරාවෙන් තෘතීය සඞ්ගීතිකාලයදක්වාද ඉන්මතු ඔවුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍යයන් විසින් ජම්බුද්වීප තලයෙහි පවත්වාගණ ආ ආචාර්‍ය්‍ය පරම්පරාවද සිංහල ද්වීපයෙහි මහින්ද ඉට්ටිය උත්තිය සම්බල භද්‍රසාල යන මහාස්ථවිරයන්වහන්සේලා ජම්බුද්වීපයෙන් මෙහි ගෙණ ආ ශාසන පරම්පරාව හා උන්වහන්සේලාගේ ශිෂ්‍යානු ශිෂ්‍ය සංඛ්‍යාත ආචාර්‍ය්‍ය පරම්පරාවද මෙහි අගරහිත ආචාර්‍ය්‍ය පරම්පරාවනම් වේ ඉදින් මෙසේවීනම් මේ නෙත්තිප්‍රකරණය නිදාන සහිතකොට කුමක්හෙයින් නොවදාරණලද්දේදයත් ශ්‍රාවකභාෂිතවූ අනඞ්ගනසූත්‍ර කච්චාන සූත්‍රාදීන්ගේ නිදානය ධර්‍මසඞ්ගාහක ස්ථවිරයන් විසින් කියනලද්දේමය එපරිද්දෙන් මෙහි නිදානය කුමක්හෙයින් නොකියන ලද්දේදයත්? ශ්‍රාවක භාෂිතයන්ගේ හෝ බුද්ධභාෂිතයන්ගේ හෝ නිදාන දක්වීම ඒකාන්ත කාරණයක් නොවේ පටිසම්භිදාමාර්ගී මහානිද්දේශාදී ඇතම් ශ්‍රාවක භාෂිතයෝද ධම්මපද බුද්ධවංශාදී ඇතම් සර්‍වඥභාෂිතයෝද නිදාන නැත්තාහුවෙත් මෙහි පටිසම්භිදාමාර්ගී නම් ආයුෂ්මත් දම් සෙනෙවිසැරියුත් තෙරුන් විසින් වදාරණලද "සොතාවධානෙ පඤ්ඤා සුතමයෙඤාණං" යනාදී පාඨය ආදිකොට ඇත්තාවූ ප්‍රකරණයයි. නිද්දේශය යනු උන්වහන්සේ විසින්ම දෙශනාකරණලද කාමසූත්‍රාදීන්ගේ අර්ථවර්ණනාභූතවූ. "කාමං කාමයමානස්සානි කාමානි උද්දානතොවෙකාමා වත්ථුකාමාච කිලෙසකාමාච" යනාදී පාඨයෙන් පටන්ගන්නාලද ප්‍රකරණයයි ආදිශබ්දයෙන් පෙටකොපදෙශාදීන්ගේ ග්‍රහණයවේ එහෙයින් ශ්‍රාවකභාෂිතයන්ගේ හෝ බුද්ධභාෂිතයන්ගේ හෝ නිදාන දක්වීම ප්‍රමාණනොවේ. සූත්‍රවිනය ධර්‍මයන්ගේ නිදානයෝ ධර්‍මභාණ්ඩාගාරික උපාලි ආදී ශ්‍රාවකයන් විසින්ම දෙශනාකරණලද්දේය මේ නෙත්ති ප්‍රකරණයද මහාශ්‍රාවක භාෂිතයක්වේ මේ වනාහි මහාකාත්‍යායන ස්ථවිරයන්වහන්සේ හැර අනිකෙකුට විෂයනොවේ එහෙයින් මෙහි

නිදානය සෙවීමෙන් කවර ප්‍රයෝජනද? පෙළට අවිරුද්ධවූ අර්ථයම මෙහි සෙවියයුතුවෙයි තවද මේ ප්‍රකරණය දෙශනා පෙළට සාරණලද අර්ථවර්ණනාවක් බැවින් මිට නිදානයක් කීම ප්‍රයෝජනවත්නොවේ ප්‍රතිසම්භිදමාගී මහානිද්දේශයෝ යම්සේද මේ නෙත්තිප්‍රකරණයද එ පරිද්දෙන් දතයුතුයි.

දැන්මේ ප්‍රකරණයෙහි නානාප්‍රකාරඅර්ථ කෞශල්‍යය පිණිස මතු කියන විභාගය දතයුතුයි. මේ සියළු නෙත්තිප්‍රකරණය වනාහි සාසනපරියෙසන භාවයෙන් එක්වැදෑරුම්වේ "පරියෙසති එළු එතායා තිවා පරිශෙසි" යනාදී ක්‍රමයෙන් සුද්දසු පරිද්දෙන් ලබ්භ්‍යමාන පදයන්ගේ කරණාධිකරණ වශයෙන් අර්ථ දතයුතුයි-එසේම ආයසී මාගීයට පමුණුවන හෙයින්ද විමුක්තිරස බැවින්ද එක්වැදෑරුම්වේ ව්‍යඤ්ජනවිචාර අර්ථවිචාර භාවයෙන් දෙවැදෑරුම්වේ එසේම සංග්‍රහවිභාගවශයෙන්ද ධර්මාර්ථ විනයාර්ථ සංවර්ණනා වශයෙන්ද ලෞකික ලොකොත්තර අර්ථසංග්‍රහකිරීම් වශයෙන්ද රූපාරූප ධර්මයන්ගේ පරිග්‍රහ වශයෙන්ද ලක්ෂණ ලක්ෂ්‍යභාවයෙන්ද ප්‍රවෘත්තිනිවෘත්තිකථනයෙන් (නොහොත්) සංසාරයෙහි පැවැත්මෙන් හා සංසාරයෙන් වැලැක්මෙන්ද(හෙවත්)දුඃඛසත්‍ය නිරොධසත්‍යයන්ගේ කථනයෙන්ද සභාග විසභාග නිද්දේශ වශයෙන්ද සාධාරණ අසාධාරණ ධර්මවිභාගවශයෙන්ද දෙවැදෑරුම්වේ උද්ඝටිතඥාදී ත්‍රිවිධපුද්ගල නිද්දේශ වශයෙන් තුන්වැදෑරුම්වේ එසේම ආදි කල්‍යාණාදීන්ගේ විභාග වශයෙන්ද ඥාතපරිඥාදී පරිඥාත්‍රය කථනයෙන්ද තදඞ්ගාදීප්‍රහාණත්‍රයගේ උපදෙශ කථනයෙන්ද අධිසීලාදී ශික්ෂාත්‍රය සංග්‍රහකිරීම් වශයෙන්ද (භගවත්හුගේ ශාසනය වනාහි ශික්ෂාත්‍රයෙන් සංග්‍රහකරණලද්දේය ඒ ත්‍රිවිධ ශික්ෂාවන්ගේ අර්ථ ප්‍රකාශකිරීම් වශයෙන් මේ නෙත්තිතොමෝ වනාහි සකලනවාඞ්ග ශාසනයාගේ අර්ථසංවර්ණනාවවේ එහෙයින් මෙසේ කියනලද්දැයි දතයුතුයි.)

රාගාදී ත්‍රිවිධ සංක්ලේශ විශෝධන වශයෙන්ද මූලගීති අනුගීති සංගීති වශයෙන්ද පිටකත්‍රයාර්ථ සංවර්ණනා වශයෙන්ද හාර නය පට්ඨානයන්ගේ ප්‍රභෙද වශයෙන්ද තුන්වැදෑරුම්වෙයි සිව්පිළිසිඹියාවන්ට විෂයවන හෙයින් සතරවැදෑරුම්වෙයි එසේම සතරනය දෙශනා වශයෙන්ද ධර්මාර්ථ දෙශනා ප්‍රතිවෙධයන්ගේ ගම්භීර භාවයෙන්ද සතරවැදෑරුම්වේ අභිඥෙය්‍යය පරිඥෙය්‍යය පහාතබ්බ භාවෙතබ්බ සච්ඡිකාතබ්බධර්ම සංඛ්‍යාත පස්වැදෑරුම් ධර්මවිභාග වශයෙන් පචප්‍රකාරවේ (මෙහි විස්තරවශයෙන් ප්‍රතිසම්භිද

මාර්ගයෙහි සුතමයඤාණ නිර්දේශයෙහි කියනලද ක්‍රමයෙන් දතයුතුයි. එසේම රූපාදිපඤ්චස්කන්ධ ධර්මයන්ගේ නිර්දේශ වශයෙන්ද නිරය තිරච්ඡාන ප්‍රේත මනුෂ්‍ය දෙව යන පඤ්චගති පරිච්ඡේද වශයෙන්ද පස්වැදෑරුම්වේ මෙහි කාලකඤ්ජක අසුරයන් හා වෙපචිත්ති ආදීහුද යථාක්‍රමයෙන් ප්‍රේතවිෂය තාවතිංසයන් කෙරෙහි සංග්‍රහයට යෙත් කියනලදමැයි කථාවස්තු ප්‍රකරණයෙහි "ඝම්කාලකඤ්ජකාසුරාපෙතානං සමානවණ්ණා සමානභොගා සමානා යුකාපෙතෙහි සහ ආවාහවිවාහං ගච්ඡන්ති එතාවතරෙවතාතබ්බ ජගතියොති-කම්වෙපචිත්ති පරිසා දෙවානං සමානවණ්ණා සමානභොගා සමානා යුකාදෙවෙහි සහ ආවාහවිවාහං ගච්ඡන්ති නොවතරෙ වතාතබ්බ ජගතියො"යි ඒ එසේමැයි.ශක්‍රදෙවේන්ද්‍රතෙම සුජාතා නම් අසුර කන්‍යාව හා සමග විවාහවූයේයි පඤ්චප්‍රකාර නිකායාජීවණිතා වශයෙන්ද පස්වැදෑරුම්වේ ෂඩාලම්බන විභාග වශයෙන් සවැදෑරුම්වේ එසේම ෂඩ්අධ්‍යාත්මිකායතන විභාග වශයෙන්ද ෂඩ්බාහිරායතන විභාග වශයෙන්ද සවැදෑරුම්වේ, නානත්තකායා නානත්තසඤ්ඤී ආදී විඤ්ඤාණස්ථිති පරිච්ඡේදවශයෙන් සත්වැදෑරුම්වේ සූත්‍රාගාදි නවාඞ්ගනිර්දේශ වශයෙන් නවවැදෑරුම්වේ සූත්‍රාදීස්ථාන විභාගවශයෙන් තුදුස්වැදෑරුම්වේ මතුකියනුලබන සාසනප්‍රස්ථාන ප්‍රභෙදවශයෙන් සොළොස් වැදෑරුම් හා අටවිසිවැදෑරුම්වේ සුවාසූදහසක් ධර්මස්කන්ධ විචාරභාවයෙන් සුවාසූදහසක් ප්‍රභෙදවෙයි යනාදී ක්‍රමයෙන් ප්‍රකරණ විභාගය දතයුතුයි. මේ ධර්මස්කන්ධයන්ගේ සුවාසූදහසක් ප්‍රභෙදය යන මේ වචනය ගොපකමොග්ගල්ලාන බ්‍රාහ්මණයා විසින් ගොපකමොග්ගල්ලාන සූත්‍රයෙහිද ථෙරගාථායෙහි "ද්වංබහුස්සුතොහි බුද්ධසාසනෙපාකතො කිත්තකාධම්මා තෙ සත්ථාරා භාසිතා තයාච ධාරිතා"යි පුළුවුස්නාලද ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් විසින් ඔහුට පිළිවදන්දෙන්නානු තමාගේ ගුණදක්වීම් වශයෙන්,

"ද්වාසීතිං බුද්ධතොගණ්හිං ද්වෙසහස්සානි භික්ඛුතො
චතුරාසීතිසහස්සානි යෙමෙධම්මා පවත්තිනොයි"

වදාළ ගාථාවට අනුරූප පරිදෙන් කියනලදී එතකුදුවුවත් කථාවස්තු ප්‍රකරණ මාධුරිය සූත්‍රාදීන්ගේ හා විමානවස්තුවෙහිද සමහර ගාථාදීන්ගේ වශයෙන් ධර්මස්කන්ධයන්ගේ අසූසාරදහසටත්වඩා අධිකතාවය දතයුතුයි මෙහි වනාහි සුභසූත්‍රය හා ගොපකමොග්ගල්ලාන සූත්‍රයත් බුදුන්ගේ පිරිනිවීමෙන් පසු ආනන්දස්ථවිරයන් විසින් වදාරණලද්දේය ඒ සූත්‍රාදිහු සුවාසූදහසක් ධර්මස්කන්ධයෙහි අන්තර්ගතවේද

නොවේදැයි ප්‍රශ්නකටයුතුවේ එහි වනාහි පටිසම්භිදාමාර්ගී ගැටපදයෙහි
තමන්වහන්සේ විසින් වදාරණලද ධර්මස්කන්ධයෝ භික්ෂූන්ගෙන් ඉ
ගෙණ ගන්නාලද ධර්මස්කන්ධභාවයෙහි සඞ්ග්‍රහකොට මෙසේ
කියේයයි කියනලදී බුදුන් විසින් දෙනලද ක්‍රමයෙහි සිට ඒ සූත්‍රයන්
වදාළ බැවින් බුදුන් කෙරෙන් උගන්නා ලද්දෙහිම සංග්‍රහකොට
මෙසේ කීයේයයි කියන්නටද වටනේයයි පෙණේ-යම්සේ කථාවස්තු
ප්‍රකරණය මොග්ගලීපුත්ත තිස්සස්ථවිරයන් විසින් බුදුන් විසින් දෙන
ලද මාතෘකාන්තයෙහි සිට වදාරණලද්දේද එපරිදෙදන් ශ්‍රාවකයෝ
බුදුන් විසින් දෙනලද ක්‍රමයෙහි සිට ධර්මදෙශනාකෙරෙති එහෙයින්
ම ධර්මසඞ්ගායනා කාලයෙහි ආනන්දස්ථවිරයන් විසින් වදාරණලද
සූත්‍රයන්ගේ නිදානයෙහි එම තෙරුන් විසින්ම "එවං මෙසුතං" යනමේ
පාඨය කියනලදැයි සාරාර්ථදීපනී විනයටීකාවෙහි කියනලදී විමතී
විනොදනී ටීකාවෙහි වනාහි ඒ සුභ සූත්‍රාදීන්ගේ වශයෙන් සුවාසූදහ
සක් ධර්මස්කන්ධයන්ට අධිකවූ ධර්මස්කන්ධ ඇතිබවද කියනලදී.

ඒ එකවිධාදී ක්‍රමයන් අතුරෙහි ශාසන පරියෙෂණ භාවයෙන්
එක්වැදෑරුම් වන්නේය යනු සියළු නෙත්තිප්‍රකරණය අධිසීලාදී
ශික්ෂාත්‍රයකින් සංග්‍රහකරණලද සූත්‍රාදී සකල නවාඞ්ග ශාසනයාගේ
අර්ථසංවර්ණනා වනබැවින් එක්වැදෑරුම්වේ ආර්යමාර්ගී සම්පාදන ව
ශයෙන් එක්වැදෑරුම් වන්නේය යනු සියළු නවාඞ්ග ශාසනයාගේ
අර්ථසංවර්ණනාව දර්ශණභූමි සංඛ්‍යාත සොවාන්මාර්ගය සම්පාදනය
කරණ හෙයින් එක්වැදෑරුම්වේ විමුක්තිරස වශයෙන් එක්වැදෑරුම්
වන්නේය යනු විමුක්තිසංඛ්‍යාත අග්‍රඵලය එලවීම කෘත්‍යකොට
ඇතිබැවින් එක්වැදෑරුම්වේ ව්‍යඤ්ජනවිචාර අර්ථවිචාර භාවයෙන්
දෙවැදෑරුම් වන්නේය යනු සොළොස්වැදෑරුම් හාරයෝ ව්‍යඤ්ජන
පදයන්ගේ ව්‍යඤ්ජන විචාරය කරණ බැවින් හා අර්ථපදයන්ගේ අර්ථ
විචාරය කරණ බැවින්ද දෙවැදෑරුම්වේ ධර්මාර්ථ විනයාර්ථ සංවර්ණ
නා වශයෙන් දෙවැදෑරුම් වන්නේය යනු සියළු පර්යාප්ති ශාසනය
ධර්මවිනය යන දෙකට ප්‍රභෙදවන බැවින් දෙවැදෑරුම් යයි කියනලදී
ලක්ෂණ ලක්ෂ්‍යභාවයෙන් දෙවැදෑරුම් වන්නේය යනු නෙත්තිප්‍රකරණ
යෙහි ප්‍රකාශවන්නාවූ සොළසහාරයෝ ලක්ෂණබැවින් හා ඒ ඒ හාර
නයට උදාහරණ කරන්නාවූ සූත්‍රාන්තයෝ ලක්ෂ්‍ය බැවින් දෙවැදෑ
රුම් යයි කියනලදී සභාග විසභාග වශයෙන් දෙවැදෑරුම් වන්නේය
යනු සමාන ජාතිකවූ සභාග ධර්මයන්ගේ හා ප්‍රතිපක්ෂවූ විසභාග ධර්ම
යන්ගේද විචාරයකරණ බැවින් දෙවැදෑරුම්වේ සාධාරණ අසාධාරණ

ධම්මවිභාග වශයෙන් දෙවැදෑරුම් වන්නේය යනු එකමතින් එකාවිට ප්‍රහාණය කටයුතුවූ ප්‍රහාණෙකට්ඨ සාමාන්‍යයෙන් හා ඒක චිත්තයෙක්හි එකාවිට උපදනා සහජෙකට්ඨ සාමාන්‍යයෙන්ද යම් ධම්කෙනෙක් යම් ධම් කෙනෙකුන්ට නාමව්‍යවස්ථානාදි වශයෙන් සාධාරණ වන්නාහු නම් ඔවුන් සාධාරණ ධම්යෝයි තද්විරුද්ධවූ හෙවත් එට සතුරුවූ ධම්යෝ අසාධාරණ ධම්යෝනම් වෙත් ඒ ධම්යන්ගේ විභාගය කරණ හෙයින් දෙවැදෑරුම්වේ.

පුද්ගලත්‍රය නිද්දේශයෙන් තුන්වැදෑරුම් වන්නේය යනු උද්ඝටිතඥය විපඤ්චිතඥය නෙය්‍යය යන පුද්ගලයන්ගේ විභාග වශයෙන් තුන්වැදෑරුම්වේ ත්‍රිවිධ කල්‍යාණ වශයෙන් තුන්වැදෑරුම් වන්නේය යනු ආදි කල්‍යාණය මධ්‍ය කල්‍යාණය පරියොසාන කල්‍යාණය යන මොවුන්ගේ වශයෙන් තුන් වැදෑරුම්වේ මූලගීති අනුගීති සංගීතීන්ගේ ප්‍රභේදයෙන් තුන්වැදෑරුම්වන්නේය යන මෙහි ප්‍රථමවචනය මූලගීතිනම කියනලද අර්ථයම සංග්‍රහකොට අභිධම්මත්ථ සඞ්ග්‍රහාදියෙහි මෙන් කියනලද ගාථාව අනුගීතිනම ඒ ඒ සූත්‍රාර්ථයන් යෙදීම්වශයෙන් විසිර පවත්නාවූ අර්ථයන් එක්ප්‍රකරණයක් කොට සංගායනා කිරීම සංගීතිනාම මේ තුන්දෙනාගේද ප්‍රභේදයෙන් තුන්වැදෑරුම්වේයයන අර්ථයි.

පඤ්චස්කන්ධ නිද්දේශවශයෙන් පස්වැදෑරුම් වන්නේය යනු රූපාදී පඤ්චස්කන්ධයන්ගේ හා සීලාදී පඤ්චධම්ස්කන්ධයන්ගේද නිද්දේස වශයෙන් පස්වැදෑරුම්වේ සූත්‍රාධිෂ්ඨාන විභාග වශයෙන් තුදුස්වැදෑරුම වන්නේය යන මෙහි ලොභය ද්වෙෂය මොහය අලොභය අද්වෙෂය අමොහය කායකර්මය වාක්කර්මය මනොකර්මය ශ්‍රද්ධෙන්ද්‍රිය වීර්‍ය්‍යෙන්ද්‍රිය සමෘතෙන්ද්‍රිය සමාධෙන්ද්‍රිය ප්‍රඥෙන්ද්‍රිය යන මේ තුදුස්ධම්යෝ සූත්‍රාධිෂ්ඨානයෝ නම් වෙත් හෙවත් සියළු සූත්‍රාන්ත සංඛ්‍යාත පිටකත්‍රය මේ තුදුස්ධම්ය ආධාරකොට ඇත්තේය ඔවුන්ගේ විභාග කියන හෙයින් තුදුස්වැදෑරුම් වන්නේය යන අර්ථයි එකවිධාදි ක්‍රමයන් අතුරෙන් මෙහි නොකී සෙසු ක්‍රමයෝ සුඥෙය බැවින් වර්ණනා නොකරණලද්දාහුය.

මෙසේ නෙත්තිප්‍රකරණයෙහි අනාගතවූ සියළු විභාගයන් ඉගෙණ පර්‍ය්‍යාප්ති ශාසන සංඛ්‍යාත සාගරාවගාහණය කරණු කැමති සත්පුරුෂයන්ගේ නෙත්තිනයාර්ථාවබොධ සෞකර්‍ය්‍යය සඳහා නෙත්තිප්‍රකරණ අත්ථකථා ටීකාවන්ට අවිරුද්ධවශයෙන් නෙත්ති නිදානය දක්වා තදනන්තරව සොළස හාරනය දක්වනුලැබේ.

අප විසින් පර්‍ය්‍යාප්ති ශාසනායුර්භූතවූ නෙත්තිප්‍රකරණයෙන් සංක්ෂෙපයෙන් සංග්‍රහකොට ගන්නාලද මේ නෙත්ති ප්‍රදීපය උද්ග්‍රහණ ධාරණ පෘච්ඡා ප්‍රතිපෘච්ඡාකොට මේ උපනිශ්‍රයෙන් නෙත්තිප්‍රකරණය ද ආචාර්‍ය්‍යොපනිශ්‍රයෙන් වෙන්වද ප්‍රඥාසම්පන්නයන්ට අවබොධ කළ හැක්කේයයි දතයුතුයි.

**නෙත්ති නිදානකථාවයි.**

---

## සොළසහාරය කවරයත්?

“දෙසනා විචයො යුත්ති පදට්ඨානො ච ලක්ඛණො,
චතුබ්‍යූහො ච ආවට්ටො විභත්ති පරිවත්තනො,
වෙවචනො ච පඤ්ඤත්ති ඔතරණො ච සොධනො,
අධිට්ඨානො පරික්ඛාරො සමාරොපණො සොළස”

යනාදී නෙත්ති පාළියෙහි ආ ක්‍රමයෙන් දේශනාහාරය, විචය හාරය, යුක්තිහාරය, පදස්ථානහාරය, ලක්ඛණහාරය, චතුබ්‍යුහ හාරය, ආවර්තනහාරය, විභක්තිහාරය, පරිවර්තනහාරය, වෙවචනහාරය, පඤ්ඤත්තිහාරය, ඔතරණහාරය, සොධනහාරය, අධිෂ්ඨානහාරය, පරිෂ්කාරහාරය, සමාරොපණහාරය,යි හාරයෝ සොළොස් වැදෑරුම් වෙත්-කවරාර්ථයකින් හාරනම්වේදයත්?“හරතීති හාරො හරියන්ති එතෙනාති වා හාරො හරණමත්තමෙව වා හාරො ඵළුපචාරෙන හාරො වියාති වා හාරො” යනු නිර්වචන බැවින් සූත්‍රගෙය්‍යාදී නවාඞ්ග ශාස්තෘ ශාසනය අරමුණුකොට ඇත්තාවූ අඥානසංශය විපර්‍ය්‍යාස යන් පහකිරීම් ආදී අර්ථයෙන් කතෘ කර්ම කරණාධිකරණ භාවකාරක වශයෙන් සුදුසුපරිදි හෝ කාමරාගාදීන් කාරණකොටඇති ක්ලේශදාහය සංසිඳුවන අර්ථයෙන් පරමාර්ථධර්ම සංඛ්‍යාත ශබ්දසමූහයන් අවුනා ගොතනලද මුක්තාහාරයකටබඳු හෙයින් ඵලූපචාර වශයෙන් හෝ හාරනම් වේ ඒ සොළොස් වැදෑරුම් හාරයන් අතුරෙන් දෙසනාහාරය කවරයත්?

“අස්සාදාදීනවතා-නිස්සරණං පිචඵලං උපායො ච
ආණත්තී ච භගවතො-යොගීනං දෙසනාහාරො”

යනු නෙත්තිපාළි බැවින් ආශ්වාදය ආදීනවය නිස්සරණය ඵලය උපාය ආණත්තිය යන සවැදෑරුම් අර්ථයන් වර්ණනාකිරීම ලක්ෂණකොට ඇති හාරය “දෙසීයති සංවණ්ණීයති සුත්තත්‍ථො එතායාති දෙසනා” යනු නිර්වචන බැවින් දෙශනාහාර නම්වේ ඒ සවැදෑරුම් සංවර්ණනාවන් අතුරෙන් “අස්සාදීයතීති අස්සාදො”යනු නිර්වචන බැවින් සුඛවෙදනාව හා සෞමනස්‍ය වෙදනාව ආශ්වාදනම්වේ වදාරණලදුයේමැයි“යංභික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධෙ පටිච්චඋප්පජ්ජති සුඛං සොමනස්සං අයං පඤ්චසු උපාදානක්ඛන්ධෙසු අස්සාදො”යි-යම්සේ සුඛ සෞමනස්‍යයෝ ආශ්වාදනම් වේද එසේම ඉෂ්ටාලම්බනයද ආශ්වාද නම්වේ මේද වදාරණලදුයේමැයි “සොනං අස්සාදෙති තන්නිකාමෙන්” “රූපං අස්සාදෙති අභිනන්දති තං ආරබ්භ රාගො උප්පජ්ජති” “සංයොජනියෙසු භික්ඛවෙ ධම්මෙසු අස්සාදානුපස්සිනො” යනාදියයි“අස්සාදෙති එතායාති වා අස්සාදො” යනුද නිර්වචන බැවින්

තෘෂ්ණාතොමෝද ආශ්වාදනම්වේ ඒඑසේමැයි පුද්ගලතෙමේ තෘෂ්ණාව කරණකොටගෙණ සුඛවෙදනාවද සුඛාලම්බනයද ආශ්වාදනය කරයි එහෙයින් තෘෂ්ණාවද ආශ්වාදනාම්වේ එපරිද්දෙන් සඤ්ඤාවිපල්ලාසාදියද ආශ්වාදනම්වේ ඒ එසේමැයි සත්වයෝ විපල්ලාස වශයෙන් අනිෂ්ටාලම්බනාදීයද ඉෂ්ටවශයෙන් ආශ්වාදනයකෙරෙත්මැයි මෙසේ වෙදනාය සියළු ත්‍රෛභූමක සංස්කාරයෝය තෘෂ්ණාය විපල්ලාසයෝය යන මෙතෙක් ධර්මයෝ ආශ්වාද ධර්මයෝනම් වෙත් දුක් වෙදනාව හා උපෙක්ෂා වේදනාවත් කෙසේ ආශ්වාදනම් වන්නේදයත්? විපල්ලාසයන්ගේ වශයෙන් දුක් වෙදනාවට හා උපෙක්ෂා වෙදනාවටද සුඛපර්‍යාය සම්භව වනහෙයින් ඔවුන්ද ආශ්වාදනම් වෙත්, එහෙයින් වදාරණලදී "ආවුසොවිසාඛ සුඛාවෙදනා ඨිතිසුඛා විපරිණාමදුක්ඛා දුක්ඛාවෙදනා ඨිති දුක්ඛා විපරිණාමසුඛා අදුක්ඛමසුඛාවෙදනා ඤාණසුඛා අඤ්ඤාණසුඛා"යි.

### මේ ආශ්වාදයාගේ විභාගයි.

---

ආදීනවය යනු දුක්වෙදනාව හා ත්‍රිවිධවූ හෝ දුක්ඛතාවයි(නොහොත්) සියළු ත්‍රෛභූමක සංස්කාරයෝම ආදීනව නම්වෙත්"ආදීනා අතිවියකාපනාංවාති පවත්තතීති ආදීනවො" යනු නිර්වචනයි ආදීනව ශබ්දය කෘපණ මනුෂ්‍යවාචකවේ ත්‍රෛභූමක ධර්මයෝ වනාහි අනිත්‍යතාදී යොගයෙන් කෘපණ මනුෂ්‍යයෙකුට බඳු ස්වභාව ඇති බැවින් ආදීනවයයි කියත් යම්හෙයකින් ඒ ත්‍රෛභූමක සංස්කාරධර්මයෙහි පටන්ගන්නාලද විදර්ශණාඇති යොගාවචරයන්ට පවත්නාවූ ආදීනවානුපස්සනාව යථාභූතඥානදර්ශණයයි කියනුලැබේද එහෙයින් "යංභික්ඛවෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා අයංවුච්චති පඤ්චසු උපාදානක්ඛන්ධෙසු ආදීනවො"යි වදාරණලදී එහෙයින් ආදීනවය දුඃඛසත්‍යනිර්දේශාගත ජාත්‍යාදී දොළොස් ආකාරයන්ගේ වශයෙන් විභාගකොට විස්තාරකටයුත්තේයි.

### මේ ආදීනවයාගේ විභාගයි.

---

"නිස්සරති එතෙනාති නිස්සරණං" යනු නිර්වචන බැවින් කරණකාරකයෙහිවූ නිස්සරණ ශබ්දයෙන් ආර්‍ය්‍යමාර්ගය වාචකවේ "නිස්සරතීති නිස්සරණං" යනු නිර්වචන බැවින් කර්තෘකාරකයෙහිවූ නිස්සරණ ශබ්දයෙන් නිර්වාණය වාචකවේ මේ දෙකම සාමාන්‍ය නිර්දේශයෙන් හෝ එකාංශ නිර්දේශයෙන් හෝ නිස්සරණයයි කියනලද්දේයි ඒ ද්විප්‍රකාර නිර්දේශයන් අතුරෙන් ආර්‍ය්‍යමාර්ග පක්ෂයෙහි සති

ඥානාදි සත්තිස්බොධිපාක්ෂික ධර්‍මයන්ගේද කායානුපස්සනාදී සත් පර්‍ය්‍යාපන්න ෂට්ප්‍රභෙද ධර්‍මයන්ගේද වශයෙන් නිස්සරණය විභාග කොට දතයුතුයි. නිර්‍වාණපක්‍ෂයෙහි වනාහි කිසිසේත් අසංඛතධාතුහුගේ නිස්පර්‍ය්‍යායෙන් විභාගයක් නැත්තේයි පර්‍ය්‍යායවශයෙන් වනාහි සොපාදිසෙස අනුපාදිසෙස වශයෙන් හා යම් ධර්‍මයකින් ඒ නිස්සරණ ධර්‍මය නිර්‍ගමනයවේද ප්‍රතිසම්භිදාමාර්ගයෙහි දක්වනලද්දාවූ ඒ ධර්‍මයන්ගේ ප්‍රභෙද වශයෙන්ද චක්‍ෂුරාදි ෂට්ද්වාරයන්ගේද රූපාදී ෂඩාලම්බනයන්ගේද ඒ ඒ ද්වාරයෙහි පැවැති ෂඩ්විඥානයන්ගේද එසේම සවැදෑරුම්වූ ස්පර්‍ශ වෙදනා සංඥා චෙතනා තෘෂ්ණා විතර්‍ක විචාරයන්ගේද පෘථිවි ආදී ෂඩ් ධාතූන්ගේද දශකසිණායතනයන්ගේද දශඅශුභයන්ගේද කෙශාදිවූ ද්වාත්‍රිංශාකාරයන්ගේද පඤ්චස්කන්ධයන්ගේද ද්වාදශායතනයන්ගේද අෂ්ටාදශධාතූන්ගේද ලෞකික ඉන්ද්‍රිය ධර්‍මයන්ගේද කාමධාතු ආදීවූ තුන් තුන්වැදෑරුම් ධාතූන්ගේද කාමභවාදී තුන් තුන්වැදෑරුම් භවයන්ගේද සතර රූපාවචර ධ්‍යානයන්ගේද සතර අප්‍රමාණ්‍යයන්ගේද සතර ආරූප්‍යයන්ගේද දෙලොස් වැදෑරුම් ප්‍රතීත්‍ය සමුත්පාදයන්ගේද යන මේ ආදීවූ සංඛත ධර්‍මයන්ගේ නිස්සරණ භාවයෙන්ද විභාගකොට විස්තරකටයුත්තේයි.

**මේ නිස්සරණයාගේ විභාගයයි.**

---

ඵලය යනු දෙශනා ඵලයයි ඒ දෙශනාඵලය යනු කුමක්දයත්? දෙශනාවෙන් යම් ඵලයක් නිපදවනු ලැබේද ඒ දෙශනාඵල නම්වේ භගවත්හුගේ දෙශනාව කාරණකොටගෙණ නිර්‍වාණාධිගමය සිද්ධකරන්නේ නොවේදයත්? නිර්‍වාණයද නිස්සරණ යන මේ වචනයෙන් කියනලද්දේ නොවේදයත්? මේ සැබෑමය ඒ වනාහි පරම්පරා ඵලවශයෙන් ලැබෙන්නේයි මෙහි වනාහි ප්‍රත්‍යක්‍ෂවශයෙන් ලැබෙන්නාවූ දෙශනාඵලය කැමතිවනලදී ඒ ප්‍රත්‍යක්‍ෂඵලය වනාහි ශ්‍රුතමයඥාණය අර්ත්ථවෙදය ධර්‍මවෙදය ආර්‍ය්‍යමාර්ගයාගේ පූර්‍වභාග ප්‍රතිපත්තිවූ ෂට්විශුද්ධිහුය යන මොහු ප්‍රත්‍යක්‍ෂ දෙශනා ඵලයෝයි ඒක්‍ෂණයෙහි මාර්ගය නොලැබෙන්නාහට කාලාන්තරයෙහි ඒ මාර්ගාධිගමයට යම්හේතුවක් වේද සම්පත්තිභවයට යම්හෙතුවක් වේද ඒ මේ හේතුව ඵලය නම්වේ "ධම්මොහවෙරක්ඛති ධම්මචාරිං" යනු හෝ ඵලය නම්වේ මේ ක්‍රමයෙන් දිව්‍යමනුෂ්‍ය දෙගතියෙහි ආයුවර්‍ණ සුඛබල යශපරිවාර ආදි ප්‍රත්‍යසම්පත්තීහුද උපධිසම්පත්තීහුද චක්‍රවර්ත්තිරාජ්‍ය සම්පත්තියද දිව්‍යරාජ්‍ය සම්පත්තියද,

"ප්‍රතිරූපෙෂු දෙශෙෂු වාසඃ පණ්ඩිත සඞ්ගතිඃ
ශ්‍රවණං කෘතපුණ්‍යත්වං චතුශ්චක්‍රමිතීරිතං" යි

යන මේ චතුවාක්‍ය සම්පත්තියද සීලසම්පත්තිය සමාධිසම්පත්තිය ත්‍රිවිද්‍යාවෝය ෂඩභිඥාවෝය චතුපටිසම්භිදාවෝය ශ්‍රාවකබෝධිය ප්‍රත්‍යෙකබෝධිය සම්‍යක්සම්බෝධිය යන පුණ්‍යසම්භාර හේතුවූ සියලු ධර්මයෝ භාගවත්හුගේ දේශනාවෙන් සිද්ධකටයුතු හෙයින් ඵලනම් වෙයි දතයුතුසි.

## මේ ඵලයාගේ විභාගයයි

උපාය යනු ආර්‍යමාර්ගයට ආසන්නකාරණවූ පූර්වභාගප්‍රතිපදාවෝයි ඒ පූර්වභාග ප්‍රතිපදාව වනාහි පූර්වවූ ප්‍රතිපදාව පශ්චිමවූ ප්‍රතිපදාවන්ගේ අධිගමයට උපායවන බැවින් ඒ ප්‍රතිපදාවන්ගේ පරම්පරාවෙන් මාර්ගනිර්වාණාධිගමයට හේතුවන බැවින් උපායනම් වේ පෙර කියනලද ඵලාධිගමයට උපායවූ යම් ප්‍රතිපත්තියක් වේද ඒ ප්‍රතිපදාවද උපායනම් වේ සමහරු වනාහි විදර්ශණාවන් හා සමග මාර්ගයද උපායයි කියත් ඔවුන්ගේ මතයෙන් නිර්වාණයම නිර්වාණයයි කියනලද්දේ වේ ඵලයමෙන් උපායද පූර්වභාගයයි කියනලද්දේ වේ.

## මේ උපායයාගේ විභාගයයි.

ආණත්තිය යනු ආඥාහර්වූ භගවත්හුගේ විනෙය ජනයාහට හිතාභිවෘද්ධිය පිණිස මෙසේ පිළිපදුවයි කරණලද විධානයයි.

මෙසේ කියනලද අස්සාදය ආදීනවය නිස්සරණය ඵලය උපායය ආණත්තිය යන සවැදෑරුම් අර්ථය නෙත්තික්‍රමය ඉගෙණගණු කැමති ආධුනිකා ධම්කථිකයන් විසින් පළමුකොට උද්ග්‍රහණධාරණාදිය කොට තදනන්තරව සොළසහාරයන්ගේ විභාග අවබොධ කටයුතුයි.

මෙසේ දේශනාහාර නම්වූ සංවර්ණනා විශෙෂය ආශ්වාදදීවූ සවැදෑරුම් අර්ථයෙන් වර්ණනාකරන්නාහුද ලක්‍ෂණ දැක්වීම් මාත්‍රයකින් ලක්ෂ්‍යවූ උදාහරණයන්ගෙන් වෙන්ව අර්ථාවබොධය නොවන හෙයින් "නවවිධ සුත්තන්තපරියෙට්ඨි"යි කියනලද ක්‍රමයෙන් මේ දේශනාහාර ක්‍රමයට ත්‍රිපිටකයම උදාහරණ වශයෙන් උද්ධරණය කාලයුතු නමුදු "වත්ථිවජාතානුපුබ්බිකා සද්දප්පවත්ති" යන පරිභාෂාසූත්‍ර බැවින් විශාඛාතුගේ විවෘතා පරිච්ඡේදයේ පර්යාප්ති ශාසනයෙහි අතිශයින් ප්‍රකටවූ මඞ්ගල සූත්‍රයෙහි ආවාවූ "පූජාච පූජනීයානං" යන උදාහරණ පදයෙන් දෙසනාහාරය දක්වනුලැබේ. ඒ කෙසේ දක්වන්නෙන් දයත්? "ධම්මාසං දෙසනා කිං දෙසෙති? චත්තාරිසච්චානි දුක්ඛං සමුදයං නිරොධං මග්ගං" යන දේශනාවට අනුරූපපරිච්ඡේදයෙන් මේ "පූජාච පූජනී

යානං" යන සූත්‍රාන්ත දේශනා පදයෙන් චතුරාර්‍යසත්‍යය ප්‍රකාශක රත්නෝයයි කියයුත්තේයි ඒ කෙසේ ප්‍රකාශකරන්නේදයත්? පූජාච යන පදයෙන් ලැබියයුතු පූජාතොමෝ ආමිශපූජා ධර්මපූජා වශයෙන් දෙවැදෑරුම් වේ ඒ දෙවැදෑරුම් පූජාවන් අතුරෙන්-

"අන්නං පානං ඝරං වත්ථං යානං මාලා විලෙපනං
සෙය්‍යාවසථ පදීපෙය්‍යං දානවත්ථූ ඉමෙදස"

යන සූත්‍රාන්තදේශනා ක්‍රමයෙන් දශප්‍රකාරවූ දානවස්තුවද "රූප දානං සද්දදානං ගන්ධදානං රසදානං ඵොට්ඨබ්බදානං ධම්මදානං" යන අභිධර්ම දේශනා ක්‍රමයෙන් සවැදෑරුම් දානයද චීවර පිණ්ඩපාත සේනාසන භෛසජ්‍යදානයයි කියනලද විනය පිටකයෙහි ආවාවූ සතරාකාර දානවස්තුය යන මේ ත්‍රිපිටක ධර්මයෙහි ආවාවූ විසිවැදෑරුම් දානවස්තු දීමෙන් හට ගන්නාවූ කාමාවචර කුශල චේතනාවෝ ආමිශ පූජානම් වේ පඤ්චශීල අෂ්ටාංගශීල දශශීලාදීවූ ශීලසමාදානාදියෙන් උපදවා ගන්නාවූ ශීලමය කුශලක්‍රියාවෝද පූර්වභාග ප්‍රතිපදාව ආදියෙහිද මාර්ගඵල ධර්මයන් මධ්‍යයෙහිද නිර්වාණ ධර්මය අන්තයෙහිද ඇත්තාවූ භාවනාමය කුශලධර්ම සමූහයද ධර්මපූජානම් වේ.

ඒ ආමිශ ධර්ම පූජාවන්ට ඇතුළත්වූ ලෞකික ධර්ම සමූහය ( හෙවත් ) ඒ ආමිශ ධර්ම පූජාවන්ගෙන් ලබනලද ලෞකික භවභොග සම්පත් ආදිය ආශ්වාදය කටයුතු හෙයින් ආශ්වාදනම් වේ ඒ භව භොග සම්පත් ආදීන්ගේ රසාස්වාදනය කරන්නාවූ තෘෂ්ණාවද ආශ්වාදනම්වේ ඒ ත්‍රෛභූමික ධර්ම සමූහයම සංස්කාර දුක්වනබැවින් ආදීනව නම් වේ ඒ දුකින් නික්මයාමට හේතුවූ සෝවාන් ආදී සතර මාර්ගය හා නිර්වාණයත් නිස්සරණ නම්වේ සතරඵල චිත්තයද "ධම්මොහවෙරක්ඛති ධම්මචාරිං" යන දේශනාවට අනුරූප පරිද්දෙන් ඒ ආමිශ ධර්ම පූජාවන්ගේ ඵලවශයෙන් ලැබියයුතුවූ අත්තානුවාදභය පරානුවාදභය දණ්ඩභය දුර්ගතිභය සංඛ්‍යාත සතරමහ භයින් මිදීම් ආදිවූ සතසහස්‍රාධික ආනිශංසයෝද ඵලනම්වේ ඒ ඵලයන්ගේ ලැබීමට හේතුවූ ආමිශ ධර්ම පූජාවෝ උපායනම්වේ සුතමය ඥාණාදීවූ ඵලයද අත්තානුවාද භයාදියෙන් මිදීම් සංඛ්‍යාත ඵලයද භවභොග සම්පත්ති ආදීවූ ඵලයද ලබනුකැමති සාධුසත්පුරුෂ සමූහතෙම මේ "පූජාච පූජනීයානං" යන දේශනාව ශ්‍රවණය කොට ඒවූ පරිද්දෙන් පිළිපදිනට උත්සාහකරවයි යන ධර්මස්වාමිවූ තථාගතයන්වහන්සේගේ ආඥාවක් නැත්තෙහිදු එබඳු ආඥාවක් කළාක්මෙන් ලැබෙන්නාවූ අර්ථය ආණත්ති නම්වේ මෙසේ "පූජාච පූජනීයානං" යන දේශනා පද

ගාථාගේ ආශ්වාදය ආදීනවය නිස්සරණය ඵලය උපාය ආණත්තිය යන අර්ථ ෂට්කය දතයුතුයි ඒ සවැදෑරුම් අර්ථයන් අතුරෙන්-

“අස්සාදෙ සමුදයො ආදීනවො ඵලඤ්ච දුක්ඛං
නිස්සරණං නිරොධො උපායො ආණත්තීච මග්ගො”

යනුමෙන් නෙත්තිපාඨාගත ගාථාවෙහි කී ක්‍රමයෙන් ආදීනවය හා ඵලයද සංසාරදුක් බැවින් දුඃඛසත්‍ය නම්වේ ආශ්වාද සංඛ්‍යාත තෘෂ්ණා තොමෝ සමුදය සත්‍ය නම්වේ නිස්සරණ සංඛ්‍යාත නිර්වාණ ධර්මය නිරොධ සත්‍යනම්වේ උපාය ආණත්ති දෙදෙනා ඒ නිස්සරණය ට මාර්ගවනබැවින් මාර්ගසත්‍ය නම්වේ. මෙසේ දෙශනා හාරනම්වූ අර්ථ සංවර්ණනා විශෙෂයයි කියනලද “පූජාච පූජනීයානං” යන සූත්‍රාන්ත දෙශනා පදය ආශ්වාදාදිවූ සවැදෑරුම් අර්ථයන් ප්‍රකාශකරමින් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය ප්‍රකාශකිරිමට පොහොසත් වන්නේයි “පූජාච පූජනීයානං” යන පදයාගේ අර්ථය පිදියයුත්තන්ට පිදීම උතුම් මඞ්ගලයයෙකැයි යනුයි මේ වාක්‍යපදය ආශ්වාදාදී සවැදෑරුම් අර්ථය හා චතුරාර්‍ය්‍ය සත්‍යයද ප්‍රකාශ කළාක්මෙන් ත්‍රිපිටක ධර්මයෙහි සියළු වාක්‍ය පදයන්ගේ අර්ථවිචාරණය මෙසේම කටයුතුයි.

අක්ෂර සමූහය අක්ෂර පදයයිද ඒකාර්ථද්‍යොතකවූ පදසමූහය වාක්‍ය පදයයිද කියාද පදය දෙවැදෑරුම් වේ ඒ දෙවැදෑරුම් පදයන් අතුරෙන් මේ නෙත්තික්‍රමයෙහි සොළස හාරයන්ම උදාහරණ වශයෙන් ගන්නා පදය වාක්‍යපද වශයෙන් දතයුතුයි තව ද “පූජනීයානං” යන පදයෙන් වාච්‍යවන්නාවූ බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධශ්‍රාවක මාතෘ පිතෘ ශීලවන්ත ශ්‍රමණ බ්‍රාහ්මණාදිවූ පූජනීයයන්ගේ ලොභවර්ජිතවූ ලෞකික පඤ්චස්කන්ධයෝ දුඃඛසත්‍ය නම ඒ දුඃඛයාගේ සමුත්ථාපක හෙතුවූ ( ලොභවත් ) ඒ දුක අරමුණුකොට පවත්නාවූ තෘෂ්ණා තොමෝ සමුදය සත්‍යනම ඒ සත්‍යයන් දෙදෙනාගේ අභාවයයි කියනලද නිර්වාණය නිරොධ සත්‍යනාම ඒ නිරොධසත්‍යය දැනගැණීමට හෙතුවූ ප්‍රතිපදා තොමෝ මාර්ගසත්‍යනාම ඒ චතුරාර්‍ය්‍ය සත්‍යයන් අතුරෙන් සමුදයසත්‍යය ආශ්වාදනම දුඃඛසත්‍යය ආදීනවනම නිරොධ මාර්ගසත්‍යයෝ දෙදෙන නිස්සරණ නම්වේ “පූජාච පූජනීයානං” යන දෙශනා පදයෙන් සිද්ධකරණලද ආමිෂපූජා ධර්මපූජාවන් රැස්කිරීමට කරණලද ප්‍රයත්නාදිවූ නොයෙක් දහස්ගණන් ආනිශංසයෝ ඵලනම්වේ ඒ ඵලයද උපදවාගැණීමට හෙතුවූ යොනිසොමනස්කාර සද්ධර්ම ශ්‍රවණ චතුචක්‍ර සම්පත්ති ආදිවූ හෙතු ධර්මයෝ උපායනම ආත්මාර්ථ සංසිද්ධියෙහි උත්සාහවත්වූ කුලපුත්‍රයන් විසින් යථොක්ත උපාය ධර්මයන් සම්පූර්ණකොට පූජනීයයන්ට පූජාකරවයි යන ආණත්තිය ඒ සූත්‍රාන්ත පදයෙහි නැගෙන්නේනමුදු එබදු

ආණත්තිශඞ්කරවිදලාත්මෙන් හැඟීම ආණත්තිනම්වේ මෙසේද "පූජා ච පූජනීයානං" යන දෙශනා පදයෙන් චතුරාර්‍ය්‍යසත්‍යයන් ප්‍රකාශකරමින් ආශ්වාද ආදීනව නිස්සරණ ඵල උපාය ආණත්ති යන සවැදෑරුම් අර්ථයන් ප්‍රකාශකරණ බැවින් මේ හාරය දෙශනාහාර නම්වේ.

## දෙශනා හාරයයි.

"සම්පුච්ඡිතං ච විස්සජ්ජිතං ච-සුත්තස්ස යාච අනුගීති
සුත්තස්ස යො පවිචයො-හාරො විචයොති නිද්දිට්ඨො"

යනුවෙන් නෙත්තිපාඨාගත ගාථාවෙහි කී පරිද්දෙන් පද.පුච්ඡා, විස්සජ්ජනා,පුබ්බාපර,අනුගීති,අස්සාද, ආදීනව,නිස්සරණ,ඵල,උපාය, ආණත්ති,යන එකාදශාර්ථයන් විශෙෂ වශයෙන් ප්‍රකාශකිරීම ලක්ෂණකොට ඇත්තාවූ හාරක්‍රමය තෙම "විචියන්ති එතෙන එත්ථ වා පද පඤ්හාදයොති විචයො" යනු නිර්වචන බැවින් විචයහාර නම්වේ ඒ විචයහාරයාගේ එකාදශාර්ථයන් ප්‍රකාශකිරීම කෙසේදයත්? පූජා යන පදය තෙම "සද්දීයති උච්චාරීයති සප්පතිට්ඨා සොතවිඤ්ඤාණාරම්මණ භාවං ගච්ඡතීති සද්දො" යනු නිර්වචන බැවින් ශබ්දනම්වේ ඒ ශබ්දය චිත්තජ ඍතුජ යන දෙවැදෑරුම් ශබ්දයන් අතුරෙන් චිත්තජ ශබ්ද නම ආර්‍ය්‍යශබ්ද මේලච්ඡශබ්ද යන දෙවැදෑරුම් ශබ්දයන් අතුරෙන් ආර්‍ය්‍ය ශබ්දනම මාගධ සංස්කෘතයන එකසියඑකක් ප්‍රභෙදශබ්දයන් අතුරෙන් මාගධ ශබ්දනම ඒ මාගධ ශබ්දයද "අක්ඛරසමූහො පදං පජ්ජතෙ ඤායතෙ අත්ථො එතෙනාති පදං" යනු නිරුක්ති බැවින් පද නම්වේ ඒ පදය තෙමේ ස්‍යාද්‍යන්ත ත්‍යාද්‍යන්ත යන දෙවැදෑරුම් පදයන් අතුරෙන් ස්‍යාද්‍යන්ත පදනම්වේ ප්‍රථමාස්‍යාද්‍යන්ත ද්විතීයාස්‍යාද්‍යන්ත යනාදී සත්වැදෑරුම් පදයන් අතුරෙන් ප්‍රථමාස්‍යාද්‍යන්ත පද නම්වේ මේ ආදී ක්‍රමයෙන් පදයන්ගේ සෙවීම (හෙවත්) පදයන්ගේ ඉවත්කිරීම පදවිචය නම්වේ සන්ධි සමාසාදී සියළු ව්‍යාකරණක්‍රම විස්තරකටයුතුයි "පූජාච පූජනීයානං" යන මේ සූත්‍රාන්ත පදය ප්‍රශ්නයක්දෝහෝ විසර්ජනාවක්දෝහෝයි යමෙක් ප්‍රශ්නකලේනම් විසර්ජනායයි කියයුත්තේයි ඒ විසර්ජනා තොමෝ ඵලවන බැවින් හෙතුභූතවූ ප්‍රශ්නයෙන් වෙන්නොවී පවත්නේයි ඒ එසේමැයි.

"යත්ථ යත්ථ පදෙසෙව දිට්ඨෙ විස්සජ්ජනෙ සති
තත්ථ තත්ථුද්ධරිතබ්බා පුච්ඡා තාව විභාවිනා"

යනු පරිභාෂා බැවින් "පූජාච පූජනීයානං කිමත්ථිදං වුච්චතෙ" යනුවෙන් ප්‍රශ්නය උද්ධරණය කටයුත්තේයි ඒ පුච්ඡාතොමෝ අදිශ

ජෝතනාදී පස්වැදෑරුම් පුච්ඡාවන් අතුරෙන් නොදක්නාලද යම් වස්තුවක් ප්‍රකාශකරණු කැමතිව විචාළේනම් ඒ අදිට්ඨජෝතනා පුච්ඡා නම් වේයි යනාදී ක්‍රමයෙන් පුච්ඡාව සෙවීම හෝ වෙන්කිරීම පුච්ඡාවිචයනම්වේ මෙසේම දිට්ඨසංසන්දනා පුච්ඡාවය විමතිච්ඡේදන පුච්ඡාවය කථෙතුකම්‍යතා පුච්ඡාවය යනාදි පස්වැදෑරුම් පුච්ඡාවන් හා සත්තාධිට්ඨාන ධම්මාධිට්ඨාන පුච්ඡාවය ඒකාධිට්ඨාන අනේකාධිට්ඨාන පුච්ඡාවය සම්මුතිවිසය පරමත්ථවිසය පුච්ඡාවය යනාදීන් සියළු පුච්ඡාවෝ වෙන් කටයුත්තේයි ඒ පුච්ඡාව වනාහි “පූජාරහානං පූජංකත්වා සබ්බදුක්ඛනිස්සරණත්ථ මිදමුච්චතෙ,, යන්නෙන් විසජ්නා කටයුත්තේයි ඒ විසජ්නා තොමෝ ඒකංසබ්‍යාකරණය විභජ්ජබ්‍යාකරණය පටිපුච්ඡාබ්‍යාකරණය ඨපනබ්‍යාකරණය යන සතර වැදෑරුම් බ්‍යාකරණයන් අතුරෙන් විභාගකොට විසජ්නාකළ හෙයින් විභජ්ජබ්‍යාකරණ නම්වේ මේ ආදී ක්‍රමයෙන් විසජ්නාව වෙන්කිරීම හෝ සෙවීම විසජ්නා විචයනම් වේ මෙසේ සාවසෙස අනවසෙස විසජ්නාවය සඋත්තර අනුත්තර විසජ්නාවය ලෞකිය ලෝකුත්තර විසජ්නාවය යනාදියද සෙවියයුත්තේයි කවර ඵලයක් පිණිස “පූජාව පූජනීයානං,,යන පදය දෙශනාකළේදයත්? පූජාගයිවූ බුද්ධාදීන් පුදා සියළු වෘත්තදුඃඛයෙන් නික්මයාමයයි කියනලද නිරොධසත්‍යය සාක්ෂාත් කරණු පිණිස “පූජාවපූජනීයානං,,යන පදය දෙශනාකරණලද්දේය යන මේ ක්‍රමයෙන් සම්ප්‍රදාන හෙතුවෙන් විසජ්නා කිරීම පූර්වභාගයෙහි වූ පුච්ඡාව හා අපරභාගයෙහි වූ විසජ්නාවද සමානකොට “කිමත්ථමිදං” යන කාරකයෝ ආදියෙහි තැබියයුතුයි “වුච්චතෙ,,යන ක්‍රියා තොමෝ අන්තයෙහි යෙදිය යුතුයි මේ ආදී ක්‍රමයෙන් පූර්වාපරයන් සෙවීම පුබ්බාපර විචය නම්වේ “පූජාව පූජනීයානං,,යන මේ සූත්‍රාන්තපදය අනුගීති අනනුගීති යන දෙදෙනා අතුරෙන් කවර ගීතියක් වන්නේදයත්?

“පූජාරහෙ පූජයතෙ බුද්ධෙ යදි වා සාවකෙ
පපඤ්ච සමතික්කන්තෙ තිණ්ණසොකපරිද්දවෙ
තෙ තාදිසෙ පූජයතො නිබ්බුතෙ අකුතොභයෙ
නසක්කා පුඤ්ඤං සංඛාතුං ඉමෙත්තමපි කෙනචි
චතුන්නං පිචදීපානං ඉස්සරං යොධකාරණෙ
එකිස්සා පූජනායෙතං කලං නග්ඝති සොළසිං
නාත්ථිවිතෙන පසන්නම්හි අප්පකානාම දක්ඛිණා
තථාගතෙවා සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ

එහිමා තලිඅමොහාපි හීයොා හීයොාම නෙමසෙ
තථාගතස්සධාතුයො සුඛොපුඤ්ඤෙන මුච්චයො
තිඨනෙතා නිබ්බුතෙවාපි සමෙපිතෙත සමෙඵලං
චෙතොපනිධිහෙතු හි සතතාගච්ඡනති සුගතිං
බහුනං වතඅත්ථාය උප්පජ්ජනති තථාගතා
යත්ථකාරං කරිත්වාන සග්ගං ගච්ඡනතිදායකා"

යනාදී අතය සූත්‍රයන්ට අනුරූප පරිදෙදන් වදල බැවින්ද අධ්‍යයට සුදුසු පරිදෙදන් වදල හෙයින්ද සර්වඥයන්වහන්සේ පළමු කොට මෙබඳු ධර්‍මයක් දෙශනාකරමියි සිතින් පිරිසිඳ නැවත දෙශනා කළ හෙයින්ද "අනුරූපා අනුපවජාවාගිනි අනුගිති"යනු නිර්වචන බැවින් අනුගිති නම්වේ ඒ අනුගිති ශබ්දය සඞගහ ශබ්දයට පර්‍ය්‍යාය ශබ්දයකි ඒ සඞ්ග්‍රහයද ඓකනාශ්‍රි සඞ්ග්‍රහය අව්‍යානාශ්‍රි සඞ්ග්‍රහය උභයාශ්‍රි සඞ්ග්‍රහය යන ත්‍රිවිධාකාරයකට ප්‍රභෙදවේ"පූජව පූජනියානං" යන පදයෙන් අතීතානාගත වර්‍තමාන යන කාලත්‍රයෙහිම පූජාකිරීම වදළ හෙයින් ඒ ත්‍රිවිධාකාර සඞ්ග්‍රහයම මෙහි යෙදෙන්නේයි මෙසේ අනුගිතිය සෙවීම හෝ වෙන්කිරීම අනුගිති විචයනම් වේ ආශ්වාදය තෙම විඳගතුතුවූ සුඛවෙදනාවය සෞමනස්‍ය වෙදනාවය ඉෂ්ටාලම්බනය විඳගැනීමට හෙතුවූ තෘෂ්ණාවය විපර්‍ය්‍යාසය යන මොවුන්ගේ වශයෙන් පඤ්චප්‍රකාරවේ.ඒ පඤ්චප්‍රකාර ආශ්වාදයන් අතුරෙන් සුඛ සෞමනස්‍යයවනාහි ගෘහනිශ්‍රිත සුඛසෞමනස්‍යය නෛෂ්ක්‍රම්‍ය නිශ්‍රිත සුඛසෞමනස්‍යය යනමොවුන්ගේ වශයෙන් දෙවදෑරුම්වේ ඉෂ්ටාලම්බනයද ස්වභාව ඉෂ්ටාලම්බනය පරිකල්ප ඉෂ්ටාලම්බනය යන දෙදෙනාගේ වශයෙන් දෙවදෑරුම්වේ තෘෂ්ණා තොමෝ කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණාදීන්ගේ වශයෙන් එකසිය අටක් ප්‍රභෙදවේ විපල්ලාසයද සඤ්ඤාවිපල්ලාස චිත්තවිපල්ලාස දිට්ඨිවිපල්ලාස යන ත්‍රිවිධ විපල්ලාසයන් අතුරෙන් එකෙකී විපල්ලාසය අනිච්චෙ නිච්චවිපල්ලාසය දුක්ඛෙ සුඛවිපල්ලාසය අනත්තනි අත්තවිපල්ලාසය අසුභෙ සුභවිපල්ලාසය යන මොවුන්ගේ වශයෙන් සතර සතරකට ප්‍රභෙද වන හෙයින් විපල්ලාසයෝ දොළොස්දෙනෙක් වෙත් මේ ආදී ක්‍රමයෙන් ආශ්වාදය සෙවීම හෝ වෙන්කිරීම ආශ්වාද විචයනම් වේ ආදීනවය වනාහී දුක්ඛය දෞමනස්‍යය දුක්ඛදුක්ඛය සංඛාරදුක්ඛය විපරිණාමදුක්ඛය තෙභූමිකසංඛාරදුක්ඛය යනාදීන්ගේ වශයෙන් අනෙක ප්‍රභෙදවේ මේ ආදී ක්‍රමයෙන් ආදීනවය වෙන්කිරීම හෝ බෙදීම ආදීනව විචයනම් වේ නිස්සරණය වනාහි ආර්‍ය්‍යමාර්ග නිර්වාණයන්ගේ

වශයෙන් දෙවැදෑරුම්වේ ඔවුන් දෙදෙනා අතුරෙන් ආර්‍ය්‍යමාර්ගය නම් සුඤ්ඤතමාර්ගය අනිමිත්තමාර්ගය අප්පණිහිතමාර්ගය යන මොවුන්ගේ වශයෙන් තුන්වැදෑරුම්වේ නිර්වාණය වනාහි සොපාදිසෙෂ නිර්වාණය අනුපාදිශෙෂ නිර්වාණය යන මොවුන්ගේ වශයෙන් දෙවැදෑරුම්වේ මේ ආදී වශයෙන් නිඃස්සරණය වෙන්කිරීම නිඃස්සරණ විචයනම්වේ ඵලය වනාහි මුඛ්‍යඵලය පරම්පරාඵලය යන මොවුන්ගේ වශයෙන් දෙවදෑරුම් වේ පරම්පරා ඵලය ආනුසඞ්ගික ඵලයයිද කියත් ඒ දෙදෙනා අතුරෙන් මුඛ්‍යඵලය වනාහි ශ්‍රාමණ්‍යඵලය අර්ථවෙදය ධම්මවෙදය ශීලවිසුද්ධිය චිත්තවිසුද්ධිය දිට්ඨිවිසුද්ධිය කඞ්ඛාවිතරණවිසුද්ධිය මග්ගාමග්ගඤාණදර්ශනවිසුද්ධිය පටිපදාඤාණදර්ශනවිසුද්ධියයි කියා තාවවැදෑරුම්වේ පරම්පරා ඵලය වනාහි භවසම්පත්ති භොගසම්පත්ති ආදීන්ගේ වශයෙන් අනෙකප්‍රකාරවේ මේ ආදී ක්‍රමයෙන් ඵලය වෙන්කිරීම ඵලවිචය නම්වේ උපාය වනාහි ආර්‍ය්‍යමාර්ගයාගේ පූර්වභාග ප්‍රතිපදාවයයි කියනලද උපායය භවසම්පත්ති ආදීන්ට හෙතුවූ උපායය යන මොවුන්ගේ වශයෙන් දෙවැදෑරුම්වේ මේ ආදී ක්‍රමයෙන් උපාය වෙන්කිරීම හෝ සෙවීම උපාය විචයනම්වේ ආණත්තිය වනාහි මනුෂ්‍ය දිව්‍යබ්‍රහ්ම ආදීන්ගේ නියොග කිරීමය ආගාරික අනගාරික මිනිසුන්ගේ නියොග කිරීමය බුද්ධ අග්‍රශ්‍රාවකයන්ගේ නියොගකිරීමය "දානං දෙථ සීලං රක්ඛථ භාවනං භාවෙථ" යනාදීන් නියොගකිරීම් ආදීන්ගේ වශයෙන් නොයෙක් ප්‍රභෙද ඇත්තේවේ මේ ආදී ක්‍රමයෙන් ආණත්තිය වෙන්කිරීම හෝ සෙවීම ආණත්තිවිචයනම්වේ මෙසේ "පූජාච පූජනීයානං" යන සූත්‍රාන්ත පදයාගේ පදවිචයාදී එකාදශප්‍රකාර අර්ථයන් විශෙෂවශයෙන් වෙන්කොට දක්වීම විචයහාර නම්වේ.

## විචයහාරයයි.

"සබ්බෙසං හාරානං—යා භූමි යො ච ගොචරො තෙසං
යුත්තා යුත්තිපරික්ඛා—හාරො යුත්තීති නිද්දිට්ඨො"

යනු නෙත්තිපාළි බැවින් ශබ්දාර්ථ දෙදෙනාගේ යුක්ති අයුක්ති දෙක වෙන්කිරීම ලක්ෂණකොට ඇත්තාවූ හාරය තෙම "යුත්තිං විචාරෙති එතෙනාති යුත්ති උත්තරපදලොපෙන" යනු නිර්වචන බැවින් යුත්තිහාර නම්වේ ඒ යුක්තිවිචාරණය වනාහි මෙසේ දතයුතුයි යුක්තිතොමෝ ශබ්දයුක්ති අර්ථයුක්ති වශයෙන් දෙවැදෑරුම්වේ ඒ යුක්ති දෙදෙනා අතුරෙන් "පූජාච පූජනීයානං" යන ශබ්දය විත්තජ ශබ්ද වශයෙන් ගත්කල්හි යුතුවේ ඍතුජ ශබ්ද වශයෙන් ගත්කල්

හි අයුතුවේ ආර්‍යශබ්ද වශයෙන් හා මාගධ ශබ්ද වශයෙන් ගත්කල්හි යුතුවේ එසින් අනාර්‍යවූ අනාර්‍යශබ්ද වශයෙන් හා මෙලච්ඡශබ්ද වශයෙන් ගත්කල්හි අයුතුවේ එසේම ස්‍යාද්‍යන්තපද වශයෙන් ගත් කල්හි යුතුවේ ත්‍යාද්‍යන්තපද වශයෙන් ගත්කල්හි අයුතුවේ නං විභක්තිය චතුර්ථී ෂෂ්ඨී බහුවචන වශයෙන් ගත්කල්හි යුතුවේ තදන්‍යවූ විභක්තීන්ගේ ඒකවචන වශයෙන් ගත්කල්හි අයුතුවේ මේ ආදී ක්‍රමයෙන් සට විචයහාරයෙහි පදවිචයට කීනයින් සබ්දයාගේ යුක්ති අයුක්ති දෙක විචාරණය කිරීම ශබ්දයුක්ති නම්වේ. "පූජනීයානං" යන පදයාගේ අර්ථය බුද්ධප්‍රත්‍යෙක බුද්ධ ආර්‍යශ්‍රාවක ශීලවන්ත කල්‍යාණ පෘථග්ජන ශ්‍රමණ බ්‍රාහ්මණ මාතෘ පිතෘ ආදීවූ ගුණ විශිෂ්ට පුද්ගලයෝයයි ගත්කල්හි අර්ථයුක්තිය සිද්ධයි පූරණ කාශ්‍යපාදී ගුණවිරහිත ලාමක පුද්ගලයන් ගත්කල්හි අර්ථයුක්තිය අසිද්ධයි නං විභක්තියගේ අර්ථය සම්ප්‍රදානාර්ථ කර්මාර්ථ වශයෙන් ගත්කල්හි යුතුවේ සෙසු කාරකයන්ගේ අර්ථය ගත්කල්හි අයුතුවේ මේ ආදී ක්‍රමයෙන් අර්ථයාගේ යුක්තා යුක්ති විචාරය අර්ථයුක්ති නම්වේ මෙසේ "පූජාච පූජනීයානං" යන සූත්‍රාන්ත දේශනා පදය ශබ්දාර්ථ දෙදෙනාගේ යුක්තා යුක්ති වශයෙන් මේ හාරයෙන් විචාරණය කාරණ බැවින් යුක්තිහාර නම්වේ.

## යුක්තිහාරයයි

"ධම්මං දෙසෙති ජිනො-තස්සච ධම්මස්සයං පදට්ඨානං
ඉතියාවසබ්බධම්මා-එසොහාරො පදට්ඨානො"

යන නෙත්තිපාලියට අනුරූප පරිදෙදන් සූත්‍රාන්තයෙහි ආවාවූ ධර්මයන්ගේ ආසන්නකාරණයෝ අන්වය ව්‍යතිරෙකවශයෙන් හා ඔරුල්හ ආරුල්හ වශයෙන්ද ආරුල්හ ඔරුල්හවශයෙන්ද විභාගකිරීම ලක්ෂණකොට ඇත්තාවූ හාරයෙකතම "පදට්ඨානං විචාරෙති එතෙනාති පදට්ඨානො උත්තරපදලොපෙන" යනු නිර්වචන බැවින් පදට්ඨාන හාර නම්වේ ඒ පදට්ඨාන හාරය කෙසේදැයි යනහොත්? "පූජාච පූජනීයානං" යන සූත්‍රාන්ත පදයෙහි පූජයන්නෙන් ආමිශපූජා ධර්මපූජා සංඛ්‍යාත කුශල අව්‍යාකෘත චිත්තොත්පාදයන් දක්වයි ඒ කුශල අව්‍යාකෘතයන්ගේ ආසන්නකාරණය යොනිසොමනස්කාරයයි ඒ යොනිසොමනස්කාරයාගේ ආසන්න කාරණය සද්ධර්මශ්‍රවණයයි ඒ සද්ධර්මශ්‍රවණයාගේ ආසන්න කාරණය සත්පුරුෂොපනිශ්‍රයයි ඒ සත්පුරුෂොප නිශ්‍රයාගේ ආසන්න කාරණය ප්‍රතිරූපදෙශ වාසයයි ඒ ප්‍රතිරූපදෙශ වාසයාගේ ආසන්න කාරණය පුබ්බෙකතපුඤ්ඤතා පාරමී

සම්භාරයයි ඒ පුබ්බේකත පුණ්‍යතා පාරමිසම්භාරය හෙතුවෙයි ප්‍රතිරූපදෙශ වාසය ඵලයවෙයි ඒ ප්‍රතිරූපදෙශ වාසය හෙතුවෙයි සත්පුරුෂොපනිශ්‍රය ඵලයවෙයි ඒ සත්පුරුෂොපනිශ්‍රය හෙතුවෙයි සද්ධර්මශ්‍රවණය ඵලයවෙයි සද්ධර්මශ්‍රවණය හෙතුවෙයි යොනිසොමනසිකාරය ඵලයවෙයි ඒ යොනිසොමනසිකාරය හෙතුවෙයි පූජාකිරීම ඵලයවෙයි ඒ පූජාව හෙතුවෙයි එයින් හටගන්නා ප්‍රමොද්‍යය ඵලයවෙයි මේ ක්‍රමයෙන් ප්‍රීතිය ප්‍රශ්‍රබ්ධිය සුඛය සමාධිය යථාභූතඥානය නිර්වේදඥානය මාර්ගඥානය ඵලඥානය ප්‍රත්‍යවෙක්ෂාඥානය යන මොහු එකිනෙකාටහෙතුඵලවශයෙන් සම්බන්ධවේ ඒ ප්‍රත්‍යවෙක්ෂාඥානය හෙතුවෙයි අනුපාදිශෙෂනිර්වාණධාතුහුගේ ප්‍රතිලාභය ඵලයවෙයි මෙසේ අන්වය වශයෙන් එකිනෙකට ආසන්නවූ ධර්මයන්ගේ විභාගය දතයුතුයි.

ව්‍යතිරෙක වශයෙන් විභාගය කෙසේදයත්? පිදියයුත්තහු නොපිදීමට ආසන්නකාරණය අයොනිසොමනසිකාරයයි ඔහුගේ ආසන්නකාරණය යනාදියද එකිනෙකට සම්බන්ධකිරීම් වශයෙන් අසද්ධර්මශ්‍රවණය අසත්පුරුෂොප නිශ්‍රය අප්‍රතිරූප දෙශවාසය පුබ්බේඅකත පුණ්‍යතාවය යනමේ ධර්මයෝවෙති ඒ පුබ්බේ අකතපුණ්‍යතාවය හෙතුකොටගෙණ අප්‍රතිරූපදෙශ වාසයවෙයි අප්‍රතිරූපදෙශ වාසය හෙතුකොටගෙණ අසත්පුරුෂොපනිශ්‍රයවෙයි අසත්පුරුෂොපනිශ්‍රය හෙතුකොටගෙණ අසද්ධර්මශ්‍රවණයවෙයි අසද්ධර්මශ්‍රවණය හෙතුකොටගෙණ අයොනිසොමනසිකාරය වෙයි අයොනිසොමනසිකාරය හෙතුකොටගෙණපිදියයුත්තන්ට නොපිදීම වෙයි පිදිය යුත්තන්ට නොපිදීම හෙතුකොටගෙණ කුශලධර්මයන්ගේ පිරිහීම්වෙයි ඒ කුශලධර්මයන්ගේ පිරිහීම හෙතුකොටගෙණ සකල සංක්ලෙශ පාක්ෂික පාපධර්මයන්ගේ වැඩීමවේ ඒ පාපධර්මයන්ගේ වැඩීම හෙතුකොටගෙණ සතර අපාදුඛින්නොමිදීමවේ මේආදී වශයෙන් “පූජාච පූජනීයානං,, යන සූත්‍රාන්ත දෙශණාපදය අන්වය ව්‍යතිරෙක වශයෙන්ද ආරුය්හ ඕරුය්හ වශයෙන්ද ඒ ඒ ධර්මයන්ගේ ආසන්න කාරණයන් විභාගකරණහෙයින් මේ හාරය පදට්ඨාන හාරයයි දතයුතුයි.

පදට්ඨානහාරයයි

“වුත්තම්හි එකධම්මෙ-යෙ ධම්මා එකලක්ඛණා කෙචි
වුත්තා භවන්ති සබ්බෙ-සො හාරො ලක්ඛණො නාම,,

යනමෙතාන්ගාථාවට සුදුසුපරිද්දෙන් යම්සූත්‍රාන්තයෙක්හිආවාවූ ධර්මයන්හා ලක්ෂණ කෘත්‍ය හෙතු ඵලාදී වශයෙන් සමානවූ ඒසූත්‍රයෙහි දෙශණානොකරණලද්දවූ ධර්මයෝද දතයුතුවූ හාරය “ලක්ඛණොති අවු

තනාපි ධම්මා එතෙන එත්ථ වාති ලක්ඛණා,, යනු නිර්වචන බැවින් ලක්ඛණහාරනම්වේ ඒ කෙසේදයත්? “පූජාච පූජනීයානං,, යන සූත්‍රානාමදෙශණා පදයාගේ පූජා යන වචනයෙන් ආමිෂපූජා ධර්මපූජා සංඛ්‍යාත කුසල අව්‍යාකෘත චේතනාවන් ගන්නාලද බැවින් පූජාර්හ පුද්ගලයන් නියමකිරීම ලක්ෂණකොට ඇත්තාවූ මාත්සර්‍ය්‍යාදීන් පහකිරීම කෘත්‍යකොට ඇත්තාවූ යොනිසොමනස්කාර සංඛ්‍යාත හේතුවද භවසම්පත්ති ආදීවූ ඵලයද යන මොවුන්ගේ වශයෙන් ඒ කුශල චේතනාව හා තත්සම්ප්‍රයුක්ත චිත්තොත්පාදයද ගන්නාලැබේ (නොහොත්) පූජා යන පදයෙන් ලැබියයුතුවූ පූජන ක්‍රියා සංඛ්‍යාත කාය වාග් විඥප්තිවය ගන්නාලද බැවින් ඒ විඥප්ති රූපයන් හා රුප්පන ලක්ෂණයෙන් සදෘශවූ අවශේෂ රූපස්කන්ධයද ගන්නා ලැබේ (නොහොත්) “පූජාච පූජනීයානං,, යන ශබ්දසමුදය හා පූජන ක්‍රියාසංඛ්‍යාතවූ කෘත්‍යයෙන් සමානවූ “මානොචමානිතබ්බානං සක්කාතෙරා සක්කාරෙය්‍යානං,, යනාදී අන්‍ය පර්‍ය්‍යාය ශබ්දසමුදයයෝද ගන්නාලැබේ මේ ආදී ක්‍රමයෙන් “පූජාච පූජනීයානං,, යන දේශනාපදයෙන් ලක්ෂණ කෘත්‍ය හේතුඵලාදීන්ගේ වශයෙන් සදෘශවූ නොවදලාවූ ධර්මයෝද ලක්ෂණ වශයෙන් ගතයුතු හෙයින් මෙම හාරයලක්ෂණ හාරයයි දතයුතුයි.

## ලක්ඛණහාරයයි.

“නෙරුත්තමධිප්පායො-බ්‍යඤ්ජනමථ දෙසනානිදානඤ්ච
පුබ්බාපරානුසන්ධි-එසො හාරො චතුබ්‍යූහො,,

යන මෙහි ගාථාවට සුදුසු පරිච්ඡෙදන් නිරුක්තිය අභිප්‍රාය නිදානය අනුසන්ධිය යන සතර පරිච්ඡෙදන් අර්ථවිභාගකිරීම ලක්ෂණකොට ඇත්තාවූ හාරය “ව්‍යූහීයන්ති පිණ්ඩියන්ති එතෙන එත්ථ වාති බ්‍යූහො චතුන්නං බ්‍යූහො චතුබ්‍යූහො,, යනු නිර්වචන බැවින් චතුබ්‍යූහ හාරනම්වේ ඒ සතරවැදෑරුම් අර්ථයන් අතුරෙන් නිරුක්ති විභාගය කෙසේදයත්? පූජා යන පදය “පූජනං පූජා,, යි භාවසාධනයෙහි “පූජ,, ධාතුහු කෙරෙන් පරව අප්‍රත්‍යයවීමෙන් සිද්ධයි ඒ “පූජ,, ධාතුවෙන් පූජාකිරීම් වශයෙන් උපදනාලද චිත්තොත්පාදය වාචකවෙයි අප්‍රත්‍යයෙන්ද—

“ධාත්වත්ථා පච්චයත්ථස්ස විසුංභාවෙ අභාවතො
ධාත්වත්ථොව පච්චයෙන උදීරිතොති භාසිතො,,

යනු නිරුක්තිශාස්ත්‍ර බැවින් අප්‍රත්‍යයෙහුද එම චිත්තොත්පාදයම ලැබේ (හෙවත්) ප්‍රත්‍යයාර්ථය ධාත්වර්ථයට වෙනස් නොවනකල්හි ධාත්ව

ණීයමප්‍රත්‍යයෙන් කියනලද බැවින් “පූජ,, ධාතුවෙන් කියනලද පූජන
ක්‍රියා නිෂ්පාදක කුශලචිත්තයම ප්‍රත්‍යයෙනුත් වාචකවේ-වශබ්දය ව
නාහි “රුළ්හීඛ්‍යාතං,, යනාදී ගාථාවෙහි කීනයින් සමුච්චයාර්ථ සම්පි
ණ්ඩනාර්ථ ද්‍යෝතක නිපාතයක් බැවින් විග්‍රහ නොකටයුත්තේයි ඒ වශ
බ්දයවනාහී පූජ් යන පදයහා අසෙවන සෙවනයන් පිඬුකිරීමයයි කිය
නලද සමුච්චයාර්ථයෙහි වැටේ “පූජෙතබ්බානි පූජනීයා,, යනු විග්‍රහ බැ
වින් කර්ම සාධනයෙහි “පූජ,, ධාතුනු කෙරෙන් පරව අනීය ප්‍රත්‍යයාදේ
ශව සිද්ධවූ පදයෙකි පූජ ධාතුනුගේ අර්ථයවූ කෘත්‍ය කෙරෙහි පිහිටි ක්‍රි
යාවෙන් යටකී චිත්තෝත්පාදයම මුඛ්‍යවශයෙන් ලැබේ කර්මාර්ථ ක්‍රියා
වෙන් වනාහි ඒ චිත්තෝත්පාදයට අරමුණුවන්නාවූ බුද්ධප්‍රත්‍යෙක
බුද්ධාදිගුණවිශිෂ්ට පුද්ගලයන්ගෙන් ලැබියයුතුවූ ආලම්බන ප්‍රත්‍යයයි
කියනලද කර්මකාරකය උල්ලූපචාර වශයෙන් ලැබේ අනීය ප්‍රත්‍යයෙන්
ඒ උල්ලූපචාරයෙන් නියමකරණලද ශක්තිමත් ගුණවිශිෂ්ට පුද්ගලද්‍රව්‍ය
යලැබේ ඒ විප්‍රකාර විග්‍රහපදයන් අතුරෙන් නමාගේ පදය අපේක්ෂාකො
ට පැවති “පදවත්ති කත්තාදත්තාවෙච්ච,, න්‍යායෙන් “පූජනීයා” යන
ප්‍රථමාන්තබහුවචනය සිද්ධවේ ප්‍රථමා බහුවචන “යො,, විභක්තියෙන්
අභිමතවූ අකාරක බහුවචන සංඛ්‍යාව ලැබේ “පූජ්‍ය” යන පදයෙහි පූ
ජන ක්‍රියාවනාමෝ කර්ම සම්ප්‍රදානයන් අපේක්ෂාකරණ බැවින් “පදස
මූහො වාක්‍යං” යන පරිභාෂා සූත්‍රයට සුදුසුපරිද්දෙන් පදසමූහ වාක්‍ය
ය අපේක්ෂාකොට “වාක්‍යාවත්ති කත්තාදත්තාසාධන,, න්‍යායෙන් “තෙ
සං පූජනීයානං,, යන විභක්ත්‍යන්ත පදය ලැබේ ඒ විභක්ත්‍යන්ත පද
යාගේ නං විභක්තියෙන් පූජන ක්‍රියාවෙන් ලැබියයුතු පාප්‍රණීත ශක්
තියද පිදියයුත්තන්ගේ සම්ප්‍රදාන ශක්තියයිකියනලද කර්මකාරක සම්ප්‍ර
දාන කාරක බහුවචනසංඛ්‍යාවද ලැබේ “ඒ පූජනීයානං” යන පදයාගේ
අර්ථය වනාහි ස්වාර්ථ ද්‍රව්‍ය ලිඞ්ග සංඛ්‍යා කාරකවශයෙන් පඤ්චප්‍රකා
රවේ ඔවුන් අතුරෙන් ශීලසමාධි ආදීවූ පූජනීය ගුණය ස්වාර්ථනම්වේ
බුද්ධාදී ආර්‍ය පුද්ගලයෝ ද්‍රව්‍ය නම්වෙත් ඒ ශබ්දයාගේ විසදකාරය
පුල්ලිඞ්ගනම්වේ යටකී සංඛ්‍යා කාරකයෝම සංඛ්‍යා කාරක නම්
වෙත් මේ ආදී ක්‍රමයෙන් පදවිග්‍රහ දක්වීම නිරුත්තිනම්වේ.

මේසත්වයෝ පූජාහර් පුද්ගලයන් පුදා තුමූන් පූජලැබ සංසාරදුකින්
මිදෙත්වායි යන ධර්මදේශක පුද්ගලයාගේ කැමැත්ත අභිප්‍රායනම්වේ.
දේශණා නිදානය වනාහි අධ්‍යාත්මිකනිදානය බාහිරනිදානයයි දෙ
වැදෑරුම්වේ ඒ දෙදෙනා අතුරෙන් භගවත්හුගේ මහාකරුණා ස
මාපත්තියහා දේශණා ඥානයද අධ්‍යාත්මික නිදාන නම්වේ දේශනා

කාලය දේශකය ප්‍රතිග්‍රාහකය යන සතර බාහිරනිදානනම්වේ අනුසන්ධිද අර්ථසන්ධිය ව්‍යඤ්ජනසන්ධිය දේශනාසන්ධිය නිර්දේශසන්ධිය යන මොවුන්ගේ වශයෙන් සිව්වැදෑරුම්වේ ඔවුන් අතුරෙන් සංකාසනාය පකාසනාය විවරණාය විභජනාය උත්තානීකම්මය ප්‍රඥප්තිය යනඅර්ථපද සඳහනාගේ වශයෙන් ගැලපීම අර්ථසන්ධිනම්වේ කෙසේ ගලපන්නේදයත්?“පූජනීයානං,,යන පදයෙන් ලබ්භ්‍යමානවූ ගුණ විශිෂ්ට පුද්ගල ද්‍රව්‍යයතෙමේ“පූජා,,යන පදයෙන් ලබ්භ්‍යමානවූ කුශල චිත්තෝත්පාදයාගේ ආලම්බන හේතු නිමිත්තවූ සම්පත්ති කර්මයවේ චිත්තෝත්පාදයවනාහි ආරම්මණීක ඵල නිමිත්තවූ කර්මයාගේ ක්‍රියා භාවයෙන් ඒ කර්මයහා සම්බන්ධවේ (නොහොත්)“පූජනීයානං”යන පදයෙන් ලබ්භ්‍යමානවූ ගුණ විශිෂ්ට පුද්ගල ද්‍රව්‍යයෝතුමූ සුදුසු පරිද්දෙන් ආලම්බන ආලම්බනාධිපති ආලම්බනූපනිශ්‍රය ප්‍රත්‍යයෝ වෙත්“පූජා ,යන පදයෙන් ලබ්භ්‍යමානවූ කුශලචිත්තෝත්පාදය ආලම්බන ආලම්බනාධිපති ආලම්බනූපනිශ්‍රය ප්‍රත්‍යයන්ගේ ප්‍රත්‍යයොත්පන්න භාවයෙන් සම්බන්ධවේ මෙසේඅර්ථයක් අර්ථයක් පාසා ගැලපීම අර්ථසන්ධිනම්වේ.

අක්ෂර,පද,ව්‍යඤ්ජන,ආකාර, නිරුක්ති,නිර්දේශ,යන සවැදෑරුම්ව්‍යඤ්ජනපදයන්ගේ ගැලපීම ව්‍යඤ්ජන සන්ධිනම්වේ කෙසේ ගලපන්නේදයත්? ‘පූජනීයානං”යන පදයෙන් ඒ පූජාකර්මයන්ට යයි අර්ථලැබෙන හෙයින් පූජන ක්‍රියාවගේ කර්ම කාරක “පූජා” යන පදයෙන් වාච්‍යවන්නාවූ කර්මයාගේ ක්‍රියා භාවයෙන් ගලපන ලද්දේයි ‘පූජා,, යන පදයාගේ “එතං,, යන්නෙන් නිදර්ශිතවූ ස්වරූපය “එතං , යන පදයාගේ නිදර්ශන ස්වරූපවන්න භාවයෙන් ගලපනුලැබේ නොහොත් “පූජා,, යන පදයාගේ පූර්වවූ අසෙවන සෙවනයෙහි සමුච්චයාර්ථය පූර්වවූ අසෙවන සෙවනයන්ගේ සමුච්චනවූ භාවයෙන් ගලපනුලැබේ වශබ්දයාගේ ප්‍රධානවශයෙන් තමහට සුදුසු පූජා යන පදයෙහි සමුච්චයද්‍යෝතකාර්ථය “පූජා,, යන පදයාගේ සමුච්චය වාචක භාවයෙන් ගලපනුලැබේ අප්‍රධානවශයෙන් පූර්වවූ අසෙවන සෙවන යන දෙපදයෙහි සමුච්චනවූද්‍යොතකභාවය පූර්වවූ දෙපදයාගේ සමුච්චනවූ වාචකභාවයෙන් ගලපනුලැබේ මෙසේ ශබ්දයන්ගේ අන්‍යෝන්‍ය ගැලපීම ව්‍යඤ්ජන සන්ධිනම්වේ.

දේශනා සන්ධිතාවෝ කෙසේයත්? යටකියනලද ව්‍යඤ්ජනසන්ධියෙන් පූර්වපශ්චිම පදයන්ගේගැලපීමද“පූජාරහෙ පූජයතො” යනාදී සූත්‍රාන්තයන් හා ගැලපෙනපරිද්දෙන් ඒ ඒ තැනින් උද්ධරණ

යකොට ගැළපීමද දෙශක පුද්ගලයාගේ වාග්භේද දෙශණාවට අනු
ව ශ්‍රොතෘ ජනයා විසින් නැවතනැවත පවත්වන්නාවූ වාග් භෙද
ශබ්දයාගේ ගැළපීමද දෙශණා සන්ධිනම්වේ.

නිර්දේශසන්ධිය වනාහි පදය පදාර්ථය නිශ්‍රිතචිත්තය අනිශ්‍රිතචිත්ත
ය යන මොවුන්ගේ වශයෙන් සතර වැදෑරුම්වේ ඔවුන් අතුරෙන්
“පූජාති එකං පදං චාති එකපදං පූජනීයානන්ති එකං පදං,, යනු
වෙන්ද “පූජාහි එකං ක්‍රියාපදං චාති එකං සමුච්චයත්ථපදං පූජනී
යානන්ති එකං කම්මත්ථපදං සම්පදානත්ථපදංවා” යනුවෙනුද පදාර්ථයන්
වෙන්කොට පදච්ඡේද වශයෙන්ද පදවශයෙන්ද පදාර්ථ වශයෙන්ද
නියමකිරීම පදනිර්දේශ සන්ධිනම්වෙයි.

“පූජාති ක්‍රියානිද්දෙසො චාති අව්‍යයනිද්දෙසො පූජනීයානන්ති
ජව්ඨිනිද්දෙසො සම්පදානනිද්දෙසොවා” යනුවෙන්ද “පූජාති ක්‍රියාත්ථ
නිද්දෙසො චාති සමුච්චයත්ථනිද්දෙසො පූජනීයානන්ති කම්මත්ථනි
ද්දෙසො සම්පදාන නිද්දෙසොවා” යනුවෙන්ද පදාර්ථයන් කල්ප
නාකරමින් පදම්නතා පද පදාර්ථවශයෙන් ව්‍යවස්ථාකිරීම පදාර්ථ
නිර්දේශ සන්ධිනම්වේ.

පෘථග්ජන ශෛක්ෂපුද්ගලයෝය කුශලාකුශල ධර්මයෝය යන
මේ පුද්ගල ධර්ම දෙකොටසය “නිස්සිතං චිත්ත මෙතෙසන්ති නිස්සි
තචිත්තා” යනු නිර්වචනබැවින් තෘෂ්ණාදෘෂ්ටි නිශ්‍රිතවූ සිත්ඇති බැ
වින් “නිස්සිතචිත්ත” නම් වෙත් ඒ පුද්ගල ධර්ම දෙකොටසය
ප්‍රකාශකරණ සූත්‍රාන්තයෝ වනාහි “නිස්සිතං චිත්තං එතෙහීති නිස්සිත
චිත්තා,, යනු නිර්වචන බැවින් නිශ්‍රිත චිත්ත නම් වෙත්.

බුදුන් රහතුන් යන ආර්‍ය්‍ය පුද්ගලයන් හා අර්හත්ඵල නිර්වාණ
ධර්මයෝද යනමේ පුද්ගල ධර්ම දෙකොටසයද ඒ පුද්ගල ධර්මයන්
ප්‍රකාශකරන්නාවූ සූත්‍රාන්ත පදයෝද “නනිස්සිතචිත්තා අනිස්සිත
චිත්තා” යනු නිර්වචන බැවින් අනිස්සිතචිත්ත නම්වෙත් මේ “පූජාච
පූජනීයානං,, යන වාක්‍යයෙහි පූජා යනපදයෙන් ලබ්භ්‍යමානාවූ පෘථග්
ජන ශෛක්ෂයන්ගේ දාන ශීල භාවනාමය පූජාවන්හා “පූජනීයානං”
යන පදයෙන් ලබ්භ්‍යමානාවූ පූජාර්හවූ පෘථග්ජන ශෛක්ෂපුද්ගලයන්
ද ගන්නාකල්හි ඒ පුද්ගල ධර්ම දෙකොටසය නිස්සිතචිත්ත වන
බැවින් සංසාරප්‍රවෘත්ති වශයෙන් ප්‍රකාශකටයුත්තේයි ඔවුන් ප්‍රකාශ
කරන්නාවූකල්හි “පූජාච පූජනීයානං” යන දෙශණාව නිස්සිත
චිත්තනම්වනබැවින් වට්ටනිශ්‍රිත විවට්ටනිශ්‍රිත වශයෙන් දෙසාකාර
යකින් ප්‍රකාශකටයුතුවේ ඔවුන් දෙදෙනා අතුරෙන් වට්ටනිශ්‍රිත
දෙශණා තොමෝ වාසනාභාගිය වශයෙන්ද විවට්ටනිශ්‍රිත දෙශ

ණාව විනාහි වාසනාභාගිය නිබ්බෙධභාගිය වශයෙන් දෙයාකාරයෙන් ද ප්‍රකාශකටයුතුවේ ඔවුන් දෙදෙනා අතුරෙන් වට්ටනිශ්‍රිත දෙශණා තොමෝ වාසනාභාගියමවේ.

හොහොත් පූජයනපදයෙන් ලබ්භ්‍යමානවූ බුදුන් රහතුන්ගේ දාන සීලභාවනාමය පූජාවයයි කියනලද අනුපාදිශෙෂ නිර්වාණධාතුව අව සන්කොට ඇත්තාවූ ධර්ම සමූහය හා "පූජනීයානං" යන පදයෙන් ල බ්භ්‍යමානවූ පූජාහර්වූ බුදුන් රහතුන් යන ආර්ය්‍ය පුද්ගලයන්ද ගත් කල්හි ඒ පුද්ගල ධර්මයෝ අනිශ්‍රිතචිත්තනම්බැවින් සංසාරනිස්සරණ ව ශයෙන් ප්‍රකාශකටයුතුයි ඒධර්මයන් ප්‍රකාශකරන්නාවූ කල්හි මේ "පූ ජාච පූජනීයානං" යන දෙශණා පදයද අනිශ්‍රිත චිත්තනම්වේ මේ ආදී වශයෙන් "පූජාච පූජනීයානං" යන සූත්‍රාන්ත දෙශණා පදය නිරුක්ති ය අභිප්‍රාය නිදානය අනුසන්ධිය යන සතර අර්ථයන් විභාගකරණ බැවින් චතුබ්‍යූහ හාරනම් වේ.

## චතුබ්‍යූහ හාරයයි.

"එකම්හි පදට්ඨානෙ–පරියෙසති සෙසකං පදට්ඨානං
ආවට්ටති පටිපක්ඛෙ– ආවට්ටො නාම සො හාරො,,

යනු නෙත්තිපාලිබැවින් සූත්‍රාරූඪ ධර්මයන්ගේ පදස්ථාන සංඛ්‍යාත ආසන්න කාරණය කුමක්දැයි සොයා ඒ පදස්ථානයන්ගේ පරම්පරා ව ශයෙන් සභාග විසභාගවූ කුශලාකුශල ධර්මයන්ගේ පරිවර්තනය කිරීම ලක්ෂණකොට ඇත්තාවූ හාරය "ආවට්ටියන්ති එතෙන එවා සභා ගවිසභාගධම්මා තෙසං ආවට්ටනන්ති ආවට්ටො ,යනු නිර්වචනබැවින් ආවට්ටහාරනම්වේ ඒ ආවර්තනය වනාහි මෙසේ දතයුතුයි "පූජා" යන පදයෙන් ලබ්භ්‍යමානවූ ආමිශපූජා ධර්මපූජා සංඛ්‍යාත අනවද්‍ය කුශලධර්ම යන්ට ආසන්නකාරණය යොනිසොමනස්කාරය සත්පුරුෂොපනිශ්‍රය සද්ධර්මශ්‍රවණය නවිමසුණය චතුචක්‍රසම්පත්තිය යනාදියයි ඔවුන්ගේ වි රුද්ධපක්ෂය අයොනිසොමනස්කාරය බාලූපසෙවනය යනාදියයි ඔවුන් අතුරෙන් යොනිසොමනස්කාරාදිය ගැණීමෙන් "යොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නාචෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්ප න්නාච කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති,, "සකලමිදං ආනන්ද බ්‍රහ්මචරියස්ස යදිදං කල්‍යාණමිත්තතා,, "පඤ්චිමෙ භික්ඛවෙ ආනිසං සා ධම්මසවණෙ කතමෙ පඤ්ච අස්සුතං සුණාති සුතං පරියොදපෙති කංඛං විතරති දිට්ඨිං උජුං කරොති චිත්තමස්ස පසීදති,, යනාදිදෙශණාවන්ට අනුව යොනිසොමනස්කාරාදී හෙතු ධර්මයන්ගෙන් නිර වද්‍ය කුශලධර්මයන්ගේ පරිවර්තනයවේයි ඊටවිපරීතවශයෙන් අයොනි

සොමනස්කාරාදිය ගත්තේවීනම් "අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නාචෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නාච අකුසලා ධම්මා භීය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති,, "අස්සවණතා ධම්මස්ස පරිහායන්ති,, "දුක්ඛො බාලෙහි සංවාසො,, යනාදි නොයෙක් දෙශනාවන්ට අනුව අයොනිසොමනස්කාරාදි පාපධර්‍මයන් මුල්කොටගෙණ සාවද්‍ය අකුශලධර්‍මයන්ගේ පරිවර්‍තනයද වන්නේයි මේ ආදි ක්‍රමයෙන් "පූජාච පූජනීයානං,, යන දෙශනා පදයාගේ ආසන්නකාරණයන් සොයා යොනිසොමනස්කාරාදියට පරිවර්‍තනය කරන්නාවූ හාරතෙමේ ආවට්ටහාරනම් වේ.

## ආවට්ටහාරයයි.

"ධම්මඤ්ච පදට්ඨානං-භූමිඤ්ච විභජ්ජතෙ අයං හාරො
සාධාරණෙ අසාධාරණෙ ච-නෙය්‍යො හාරො විභත්තීති,,

යනාමේ නෙත්තිගාථාවට සුදුසුපරිදෙදන් සූත්‍රයෙහි ආවාවූ ධර්‍මය ධර්‍ම භූමි පදස්ථානයන්ගේ සාධාරණ අසාධාරණ නාම වස්තුවශයෙන් විභාගකිරීම ලක්ෂණකොට ඇත්තාවූ හාරතෙමේ "විභජීයන්ති එතෙන එථ්වා සාධාරණාසාධාරණානං සංකිලෙසවොදානධම්මානං භූමියො විභජනංවා එතෙසං භූමියොති විභත්ති,, යනු නිර්වචන බැවින් විභත්තිහාරනම්වේ ඒ විභත්තියද ධර්‍මවිභත්තිය භූමිවිභත්තිය පදට්ඨාන විභත්තිය යන මොවුන්ගේ වශයෙන් තුන්වැදෑරුම්වේ ඔවුන් තුන්දෙනා අතුරෙන් එකෙකී විභත්තියක් සාධාරණවිභත්තිය අසාධාරණ විභත්තිය යන දෙදෙනාගේ වශයෙන් දෙවැදෑරුම්වේ ඒ දෙදෙනා අතුරෙහුත් සාධාරණය නාමසාධාරණය වස්තුසාධාරණය යන දෙදෙනාගේ වශයෙන් දෙවැදෑරුම්වේ එපරිදෙන්ම අසාධාරණයද දෙවැදෑරුම්වේ එහි විභාගය මෙසේයි. "පූජා"යනපදයෙන් ලබ්භමානවූ පූජනක්‍රියා සංඛ්‍යාත චිත්තොත්පාදතෙමේ "චිත්තුප්පාද,,යන නම්ඇත්තේවේ ඒ චිත්තොත්පාදය හටගන්නා පුද්ගලසාමාන්‍යය වනාහි ආලම්බනසාමාන්‍ය යයි කියනලද ආධාරවස්තු වශයෙන් සාධාරණවේ ආමිශපූජා ධර්‍මපූජා ආදිවූ වෙන්වෙන්වූ නාමය පූජාකරන්නාවූද පූජාලබන්නාවූද පුද්ගල විශෙෂයයි කියනලද ආධාරවස්තුවශයෙන් අසාධාරණවේ මේ වනාහි ධර්‍මවිභත්තියයි.

ඒ පූජනක්‍රියා සංඛ්‍යාත චිත්තොත්පාදතෙමේ කාම රූපාරූප ලොකොත්තර යන සතර භූමියෙහි හටගණී එහෙයින් ඒ චිත්තයට ව්‍යවහාරකටයුතුවූ චාතුර්භූමික යන නාමසාමාන්‍යය සතරභූමියයි

කියනලද ආධාරවස්තු සාමාන්‍යවශයෙන් සාධාරණවූ වෙන්වෙන්වූ නාමවස්තු විශේෂයන්ගේ වශයෙන් අසාධාරණවූ මේ වනාහි භූමි විභත්තියයි. ඒ පූජාතොමෝ

"තෙ තාදිසෙ පූජයතො-නිබ්බුතෙ අකුතොභයෙ
නසක්කා පුඤ්ඤං සංඛාතුං-ඉමෙත්තමපි කෙනචි,,

යනාදින් වදාළතාක් ඵලයන්ට ආසන්නකාරණවේ ඒ ආසන්න කාරණයතෙමේ හෙතුසාමාන්‍යයයි කියනලද නාමවස්තු වශයෙන් සාධාරණවූ වෙන් වෙන්වූ ඵලයන්ගේ ලැබීමට හෙතුවූ ආසන්නකාරණභාවයයි කියනලද නාමවස්තු වශයෙන් අසාධාරණවූ පදස්ථාන හාරයෙහි කියනලද පරිද්දෙන් යොනිසොමනස්කාරාදිවූ පූර්‍ව පූර්‍වවූ හෙතුතෙම පූජාදීන්ට ආසන්නකාරණවෙයි පූජාදිය පසුපසුව හට ගන්නා පාමොජ්ජාදි ඵලයන්ට ආසන්නකාරණවෙයි මෙවනාහි පදස්ථාන විභත්තියයි. මේ ආදී වශයෙන් "පූජාච පූජනීයානං,, යන සූත්‍රාන්ත දෙශනාපදය ධර්‍ම භූමි පදස්ථානයන් හා සාධාරණ අසාධාරණවූ නාමවස්තූන්ගේ වශයෙන් බෙදනහෙයින් මේ හාරය විභත්තිහාර නම්වේ.

**විභත්තිහාරයයි.**

---

"කුසලාකුසලෙ ධම්මෙ-නිද්දිට්ඨෙ භාවිතෙ පහීනෙච
පරිවත්තති පටිපක්ඛෙ-හාරො පරිවත්තනො නාම,,

යන නෙත්තිපාලියට අනුරූප පරිද්දෙන් සූත්‍රාන්තයෙහි ප්‍රකාශ කරනලද කුශලාකුශල ධර්‍මයන් ප්‍රතිපක්ෂවූ අකුශලකුශලධර්‍මයන්ගේ වශයෙන් පෙරළීම ලක්ෂණකොට ඇත්තාවූ හාරයතෙම "පටිපක්ඛෙ පරිවත්තීයන්ති ඉමිනා එතෙවා සුදෙසිත වුත්තධම්මා පරිවත්ත නංවා එතෙසන්ති පරිවත්තනො,, යනු නිර්‍වචන බැවින් පරිවර්‍තන හාරනම්වේ ඒ ධර්‍මයන්ගේ පරිවර්‍තනය කෙසේ වන්නේදයත්? "පූජා" යන පදයෙන් ආමිශපූජා ධර්‍මපූජා සංඛ්‍යාත කුශලධර්‍මය ලැබේ ඒ කුශලධර්‍මතෙමේ යොනිසොමනස්කාර සංඛ්‍යාත ප්‍රධාන හෙතුවෙන් සුඛතාවේ ඒ යොනිසොමනස්කාරය ඇත්තාවූ පුද්ගලයාගේ අයොනිසොමනස්කාරය පහවේ ඒ අයොනිසොමනස්කාරය පහවූයේනම් අයොනිසොමනස්කාරය හෙතුකොටපවත්නාවූ අකුශලධර්‍මයෝද පහවෙත් අකුශලධර්‍මයන්ගේ පහවීමක් ඇතිකල්හි ඒ සන්තානයෙහි අනවද්‍යවූ කුශලධර්‍මයන්ගේ අභිවෘද්ධියවේ මේ ආදී ක්‍රමයෙන් පූජාච පූජනීයානං යන සූත්‍රාන්ත දෙශනාපදයෙන් කුශලාකුශලධර්‍මයන් ප්‍රතිපක්ෂවශයෙන් පරිවර්‍තනය කරනහෙයින් පරිවර්‍තනහාර නම්වේ.

**පරිවර්‍තනහාරයයි.**

---

“වෙවචනානි බහූනි තු - සුත්තෙ වුත්තානි එකධම්මස්ස
යො ජානාති සුත්තවිදූ - වෙවචනො නාම සො හාරො,,

යනු නෙත්තිපාළි බැවින් සූත්‍රාන්තයෙහි ආවාවූ ධර්‍මයන් බොහෝවූ වෙවචන පර්‍ය්‍යායවචනයන්ගෙන් විස්තරකොට ප්‍රකාශකිරීම ලක්‍ෂණකොට ඇත්තාවූ හාරයතෙම ‘විවිධං වචනං එත්ථ විවිධංවා වුච්චති අත්‍ථො එතෙනාති විවචනං විවචනමෙව වෙවචනං,, යනු නිර්වචන බැවින් වෙවචනහාර නම්වේ, ඒ වේවචනයන්ගෙන් අර්‍ථ ප්‍රකාශකිරීම මෙසේයි.

“පූජා,,යන පදයාගේ වෙවචනයෝ“පූජනා මානං මානනං සක්කාරො” යනාදී ශබ්දයෝයි වශබ්දයාගේ පර්‍ය්‍යාය ශබ්දයෝද වාශබ්ද තථාපිශබ්ද අපිශබ්ද ආදීවූ ශබ්දයෝයි පූජනීයානං යන පදයාගේ පර්‍ය්‍යාය ශබ්දයෝ“පූජෙතබ්බානං පූජ්‍යානං මානනීයානං සක්කාරෙය්‍යානං, යනාදී ශබ්දයෝයි මෙසේ මේ ශබ්දයෝ ඔවුනොවුන්ට වෙවචන පර්‍ය්‍යාය ශබ්දයෝ නම්වෙත් මේ ආදී ක්‍රමයෙන් “පූජාච පූජනීයානං”යනසූත්‍රාන්තයෙහි පදයන් බොහෝවූ වේවචන පර්‍ය්‍යාය ශබ්දයන්ගෙන් ප්‍රකාශකාරණහෙයින් වෙවචනහාරනම් වේ.

**වෙවචනහාරයයි.**

---

“එකං භගවා ධම්මං - පණ්ණත්තීහි විවිධෙහි දෙසෙති
සො ආකාරො ඤෙය්‍යො - පණ්ණත්තීනාම සො හාරො,,

යන නෙත්තිගාථාවට සුදුසුපරිද්දෙන් සූත්‍රාන්තයෙහි ආවාවූ ධර්‍මයන් විවිධාකාරයෙන් පැණවීම හෝ හැඟවීම ලක්‍ෂණකොට ඇත්තාවූ හාරය “පකාරෙහි ඤාපීයන්ති එතාය එත්ථවා අත්‍ථාති පඤ්ඤත්ති,, යනු නිර්වචන බැවින් ප්‍රඥප්තිහාර නම්වේ. එහි විභාගය කෙසේද යත්? “යා පකතිකථාය දෙසනා අයං නික්ඛෙපපඤ්ඤත්ති,, යනු බැවින් “පූජා,, යන ස්වභාව නිරුක්ති ප්‍රකෘතිකථා දේශනා තොමෝ පිදියයුත්තන්ට පිදීමයයි කියන ලද මඞ්ගල්‍යය නම්වෙයි යන අර්‍ථය ශ්‍රොතෲජනයාගේ සන්තානයෙහි ඒ මඞ්ගල්‍යය දැනගන්නා ඥානය උපදවන පිණිස දෙශනාකළ හෙයින් (නොහොත්) පැණවූහෙයින් නික්ඛෙප ප්‍රඥප්තිනම්වේ, පූජාකරන්නාවූ ආකාර විශෙෂයයි කියන ලද භාජ්‍යාප්‍රඥප්තිය භගවානහෙයින් භාජ්‍යාප්‍රඥප්ති නමුදුවේ, ඒ පූජනා ක්‍රියාව පිණිස පවත්නා හෙයින් උපාදප්‍රඥප්ති නමුදුවේ, වන්දනා මාන සත්කාරාදීවූ ක්‍රියාව නිසා පවත්නා හෙයින් උපනිධාප්‍රඥප්ති නමුදුවේ දනශීලභාවනාමය ආමිශපූජා ධර්‍මපූජා සමූහයක් දැනගැණීමට කාරණාවූ හෙයින් සමූහප්‍රඥප්ති නමුදුවේ, ධර්‍මානුධර්‍ම ප්‍රතිපත්ති පරම්පරාව හා ප්‍රථමද්වනාදී චිත්තපරම්පරාවද දැනගැණීමට කාරණාවූ හෙයින් සන්තානප්‍රඥප්ති නමුදුවේ. පූජනක්‍රියා සංඛ්‍යාත චිත්තොත්පාදයයි කියනලද අර්ථය දැනගැණීමට කාරණාවූ හෙයින් අර්ථප්‍රඥප්ති නමුදුවේ. ආමිශපූජා ධර්‍මපූජායයි කියනලද පූජාව මොනවට නියමකරන්නාවූ සංඛ්‍යාව දැනගැණීමට කාරණාවන බැ

වින් සංඛ්‍යානප්‍රඥප්ති නමුදුවේ. පූජාශබ්දයාගේ උච්චාරණයට පූර්‍ව
යෙහි සිතින් නියමකරගන්නාලද පූජාශබ්දය මනසාවවත්ථාපිත
ධම්මනම්භීරශබ්දප්‍රඥප්ති නමුදුවේ. සිතින් නියමකරගත්නාලද ප
රිච්ඡෙදන් උච්චාරණය කරණකල්හි වචීභෙදදෙශණාගම්භීරශබ්ද
ප්‍රඥප්ති නමුදුවේ. ඒ ශබ්දප්‍රඥප්තිය ශ්‍රවණයකරන්නාවූ ශ්‍රොතෘජන
යාගේ සන්තානයෙහි හටගන්නාවූ ශබ්දමනොචාරවිජ්ජයට අරමුණු
වන්නාවූ පූජා ශබ්දය නාමප්‍රඥප්ති නමුදුවේ.

තවද පූජා යන ශබ්දයතෙම පදප්‍රඥප්ති නමුදු ස්‍යාද්‍යන්ත පද
ප්‍රඥප්ති නමුදු ප්‍රථමා ස්‍යාද්‍යන්ත පදප්‍රඥප්ති නමුදුවේ. ඒ ශබ්දයාගේ
අර්ථය කාරකප්‍රඥප්ති නමුදු කත්තෘකාරක ප්‍රඥප්ති නමුදු උක්තකත්තෘ
කාරකප්‍රඥප්ති නමුදුවේ. ඒ පූජාව ආමිශපූජා ධර්මපූජා අන්නපූජාපා
න පූජා ආදීන්ගේ වශයෙන් අනෙකප්‍රකාර ප්‍රඥප්තීන්ම ප්‍රභෙදවේ.
මේ ආදීවශයෙන් "පූජාච පූජනීයානං,, යන දෙශණාපදය නො
යෙක් ප්‍රකාරයෙන් ( හෙවත් ) නොයෙක් ප්‍රඥප්තියෙන් අවබොධ
කිරීමට හේතුවන බැවින් ප්‍රඥප්ති හාරනම්වේ.

## පඤ්ඤත්තිහාරයයි.

"යො ච පටිච්චුප්පාදෙ-ඉන්ද්‍රියඛන්ධාච ධාතුආයතනා
එතෙහි ඔතරති යො-ඔතරණො නාම සො හාරො,,

යන නෙත්තිගාථාවට සුදුසුපරිච්ඡෙදන් සූත්‍රාන්තයෙහි ආවාවූ ධර්‍ම
යෝ ස්කන්ධ ආයතන ධාතු ඉන්ද්‍රිය ප්‍රතීත්‍යසමුප්පාදාදියෙහි බැසගැන්
වීම ලක්ෂණකොටඇති හාරතෙමේ "ඔතාරියන්ති අනුපවෙසීයන්ති
එතෙන එත්ථ සුත්තාගතා ධම්මා පටිච්චසමුප්පාදාදීසූති ඔතරණො,,
යනු නිර්වචනබැවින් ඔතරණ හාරනම්වේ, එහි බැසගැන්වීම මෙසේ
යි "පූජා,, යන පදයෙන් ලබ්භමානවූ චිත්තොත්පාදය හා පූජාක
රන්නාවූ ආකාරවිකාරයයි කියනලද විඤ්ඤත්තිරූපයද යනමේ
දෙකින් ස්කන්ධපංචකය ලැබේ ( හෙවත් ) ඒ චිත්තොත්පාදයෙන් ස
තරනාමස්කන්ධය හා විඤ්ඤත්තිරූපයෙන් රූපස්කන්ධයද ගැනේ
"පූජනීයානං,, යන පදයෙන් ලබ්භමානවූ පූජාර්හපුද්ගලයන්ගේ
ස්කන්ධපංචකය ගතයුතුහෙයින් සුදුසුපරිච්ඡෙදන් පංචස්කන්ධවිභාගයෙහි
බැසගැන්ම ඛන්ධොතරණ නම්වේ, එපරිච්ඡෙදන්ම ආයතන ධාතු ඉන්ද්‍රි
ය ධර්මයෙහිද ඒ "පූජා,,යන පදයෙන් ලබ්භමානවූ නාමරූපධර්මය
හා "පූජනීයානං,,යන පදයෙන් ලැබියයුතු නාමරූප ධර්මයද ආයත
න ධාතු ඉන්ද්‍රියවිභාගයෙහි බැස්වීම ආයතනොතරණ ධාතොතරණ
ඉන්ද්‍රියොතරණ නම්වෙත් ඒ පංචස්කන්ධයාගේ පැවැත්මට හේතුවූයේ
අවිද්‍යාවයි අවිද්‍යාවඇතිකල්හි සංස්කාර විඥාන නාමරූපාදීහුද
වෙත් අර්හත්මාර්ගඥානයෙන් ඒ අවිද්‍යාව නිරවශෙෂ ප්‍රහාණයෙන්
ප්‍රහීණකිරීමක් ඇතිකල්හි සංස්කාරාදීන්ගේද නිරොධයවේ, මෙසේ
ප්‍රතීත්‍යසමුත්පාදයෙහි බැස්වීම පටිච්චසමුප්පාදොතරණනම්වේ විමො
ක්ෂ සතිපට්ඨාන සම්මප්පධාන ඉද්ධිපාද බල බොජ්ඣඞ්ග මාර්ගාදීයෙහිද

එමෙසේම සමන්තාවචනපරිදෙදන් බැස්වියයුතුයි, මෙසේ "පූජාච පූජනීයානං,, යන සූත්‍රාන්තදෙශනා පදය ස්කන්ධාදී ධර්මයෙහි බැසගැන්වීම කරණයෙහෙයින් ඔතරණ හාරනම්වේ.

## ඔතරණහාරයයි.

"විස්සජ්ජිතම්හි පඤ්හෙ-ගාථායං පුච්ඡිතායමාරබ්භ
සුද්ධාසුද්ධපරික්ඛා-හාරො සො සොධනොනාම,,

යනමේ ගාථාවට සුදුසුපරිදෙදන් සූත්‍රාන්තයෙහි ආවාවූ පදය පදාර්ථය පුච්ඡාය විසජ්ජනාය ආරම්භය යන අර්ථපවත්‍ය සොධනයකිරීම ලක්ෂණකොට ඇත්තාවූ හාරයතෙමේ "සොධියන්ති සමාධියන්ති එතෙන එත්ථවාති සොධනො,, යනු නිර්වචන බැවින් සොධන හාරනම්වේ මේ පචප්‍රකාරාර්ථයන් අතුරෙන් නිෂ්ටානොකරණලද වාක්‍යයෙහි පදපදාර්ථ පුච්ඡා විසජ්ජනාවෝ ආරම්භසුද්ධිනම් නොවෙත් පදසුද්ධි පදාර්ථසුද්ධි පුච්ඡාසුද්ධි විසජ්ජනාසුද්ධිමාත්‍ර නම්වෙත් ආරම්භකොට නිෂ්ටාකරණලද වාක්‍යයෙහි කෙළවරවූ ප්‍රධානපදය වනාහි පදසුද්ධිනමුදු පදාර්ථසුද්ධිනමුදු පුච්ඡාසුද්ධිනමුදු විසජ්ජනාසුද්ධිනමුදු ආරම්භසුද්ධි නමුදුවෙයි එහෙයින් "පූජාච පූජනීයානං,, යනවාක්‍යය "පූජනීයානං පූජායි,, සෘජුවශයෙන් පදයොජනාකටයුතු බැවින් "පූජනීයානං,, යන පදතෙමේ පදසුද්ධිමාත්‍රයක්වේ ආරම්භසුද්ධිනොවේ ඒ පදයාගේ කර්මාර්ථය හා සම්ප්‍රදානාර්ථයද පදාර්ථසුද්ධිමාත්‍රයක් වේ ආරම්භසුද්ධිනම්නොවේ "පූජා,, යන පදය වනාහි පදසුද්ධිනමුදු වෙයි ආරම්භසුද්ධිනමුදු වෙයි ඒ පදයාගේ අර්ථයද පදාර්ථසුද්ධි නමුදුවෙයි ආරම්භසුද්ධි නමුදු වෙයි "පූජාච පූජනීයානන්ති කිමත්ථමිදමුච්චතෙ? පූජාරහානං පූජාමඞ්ගලංකත්වා සබ්බදුක්ඛනිස්සරණත්ථමිදමුච්චතෙ,, යනුවෙන් පුච්ඡාවිසර්ජනා කටයුතුයි, ඒ පුච්ඡාවිසර්ජනාවෙහි පූර්වපූර්වවූ පදයෝ පුච්ඡාසුද්ධි විසජ්ජනාසුද්ධි මාත්‍රයක්වේ ආරම්භසුද්ධි නොවේ "වුච්චතෙ,. යන පදය වනාහි පුච්ඡාසුද්ධිනමුදුවේ විසජ්ජනාසුද්ධි නමුදුවේ ආරම්භසුද්ධි නමුදුවේ මේආදී ක්‍රමයෙන් "පූජාච පූජනීයානං, යන සූත්‍රාන්තදෙශනා පදය පද පදාර්ථ පුච්ඡා විසජ්ජන ආරම්භ යන පචසුද්ධීන්ගේ වශයෙන් සොධනය කරණයෙහෙයින් සොධන හාර නම්වේ.

## සොධනහාරයයි.

"එකත්තතාය ධම්මා-යෙපිච වෙමත්තතාය නිද්දිට්ඨා
තෙන විකප්පයිතබ්බා-එසො හාරො අධිට්ඨානො,,

යන ගාථාවට සුදුසු පරිදෙදන් සූත්‍රාන්තයෙහි ආවාවූ ධර්මයන් සාමාන්‍ය විශෙෂවසයෙන් නික්ෂෙපය හා උද්ධරණයකිරීම ලක්ෂණකොට ඇත්තාවූ හාරතෙම "අධිට්ඨියන්ති අනුපවත්තීයන්ති එතෙන එත්ථවා සාමඤ්ඤවිසෙසභූතා ධම්මා එතා විකප්පෙනාති අධිට්ඨානො,, යනුනිර්වචන බැවින් අධිෂ්ඨානහාරනම්වේ එහි විභාග කෙසේයත්?

පූජා ශබ්දයාගේ "සප්පති සොතවිඤ්ඤාණාරම්මණභාවං ගච්ඡතීති සද්දො" යන සාමාන්‍ය නිර්වචන වශයෙන් සෘතුජ ශබ්දයන් හා සාධාරණ වන බැවින් ඒ සාධාරණභාවය එකත්තතා නම්වේ, චිත්තජ ශබ්දභාවයයි කියනලද විශෙෂ වශයෙන් සෘතුජ ශබ්දයෙන් වෙනස්කළ හෙයින් ඒ වෙනස්කිරීම වෙමත්තතා නම්වේ ඒ චිත්තජශබ්දභාවයද විවිධාකාර මෙලච්ඡශබ්ද හා සාධාරණ වන බැවින් ඒ සාධාරණබව එකත්තතා නම්වේ මේ ශබ්දයාගේ ආය්‍යශබ්දභාවය වෙමත්තතා නම්වේ ඒ ශබ්දයාගේ පදයයි කියනලද සාමාන්‍යය එකත්තතා නම්වේ ඒ පදයන් අතුරෙන් මේ පදයාගේ ස්‍යාද්‍යන්තභාවය වෙමත්තතා නම්වේ ඒ ස්‍යාද්‍යන්තභාවයද අන්‍ය විභක්තීන්ට සාධාරණ බැවින් ඒ සාධාරණභාවය එකත්තතා නම්වේ මෙහිලා ගැණෙන්නාවූ ප්‍රථමා ස්‍යාද්‍යන්තභාවය වෙමත්තතා නම්වේ මේ ආදී ක්‍රමයෙන් යට පදව්‍යවහාරයෙහි ක්‍රමය ආශ්‍රයකොට ගෙණ සිංහල විභාග කටයුතුයි, ඒ පූජා යන පදයාගේ අර්ථයවූ පූජන ක්‍රියා තොමෝ එකත්තතා නම්වේ. පූජනීයයන් පිදීම වෙමත්තතා නම්වේ නැවත ඒ වෙමත්තතායද එකත්තතා නම්වේ ආමිශපූජා ධර්මපූජාදි විශෙෂය වෙමත්තතා නම්වේ නැවත ඒ වෙමත්තතායද එකත්තතා නම්වේ අන්නපූජා පානපූජා ආදිවූ පූජා විශෙෂය වෙමත්තතා නම්වේ මේ ආදී ක්‍රමයෙන් "පූජා ච පූජනීයානං" යන දෙශණා පදය සාමාන්‍ය විශෙෂ වශයෙන් නික්ෂෙප හා නිර්ධාරණයද කාරණ හෙයින් අධිෂ්ඨාන හාරනම්වේ, වෙමත්තතාය යනු නානාත්වයයි.

## අධිෂ්ඨානහාරයයි.

"යෙ ධම්මා යං ධම්මං—ජනයන්ති පච්චයා පරම්පරතො
හෙතුමවකඩ්ඪයිත්වා—එසො හාරො පරික්ඛාරො"

යන නෙත්තිපාළියෙහි සඳහන් පරිච්ඡෙදන් සූත්‍රාගත ධර්මයන්ගේ සභාගවූද අධ්‍යාත්මිකවූද ජනකවූද අසාධාරණවූද හෙතු ධර්මයන් හා විසභාගවූද බාහිරවූද උපස්ථම්භකවූද සාධාරණවූද ප්‍රත්‍යය ධර්මයන් ද යනමේ දෙවැදෑරුම් හෙතු ප්‍රත්‍යය ධර්මයන් විභාග කිරීම ලක්ෂණ කොට ඇත්තාවූ හාරතෙමේ "පරික්ඛරොති අභිසංඛරොති ඵලන්ති පරික්ඛාරො හෙතුපච්චයො ච තං ආචික්ඛතීති පරික්ඛාරො" යනු නිර්වචන බැවින් පරික්ඛාර හාරනම්වේ එහි විභාග කෙසේයත්? ප්‍රදීපය දල්වනකල්හි වහනිතෙමේ පහන්සිළුව හා සභාග හෙතුවෙයි චක්ෂුර්විඥානය හටගන්නා කල්හි චක්ෂුර්වස්තුව හා මනසිකාරයෝද අධ්‍යාත්මික හෙතුවෙත්, ප්‍රතිසන්ධි ගන්නාකල්හි කර්මතෙමේ ජනක හෙතුවෙයි අඞ්කුරය හටගන්නාකල්හි බීජතෙමේ අසාධාරණ හෙතුවේ මෙසේ සභාගාදි වශයෙන් හෙතුවන බැවින් මේ ධර්මයෝ හෙතුකාරණා නම්වෙත්, අවශෙෂවූ තෛලාදීවූද රූපාලම්බනාදීවූද අවිද්‍යාදීවූද පෘථිවීරසාදීවූද ධර්මයෝ පිළිවෙළින් විසභාගවූද බාහිරවූද උපස්ථම්භකවූද සාධාරණවූද උපකාර කාරණාවන බැවින් ප්‍රත්‍යය කාරණයෝ නම්වෙත්, එපරිද්දෙන් "පූජා ච පූජනීයානං" යන සූත්‍රා

ඨානපදයෙහි පූජා යන පදයාගේ අර්ථවූ පූජනක්‍රියා චිත්තොත්පාද යාගේ හෙතුහුනම් “තිණ්ණාගිකබ්බං සම්බුද්ධිගාවා සංදධාකුලපුත්තො බහුං පුඤ්ඤං පසවති,, යනාදී පාඨයෙහි කී පරිද්දෙන් ශ්‍රද්ධාව ය දෙයයධර්මය දක්ෂිණාහපුද්ගලය යොනිසොමනස්කාරය මෛත්‍රිය ප්‍රඥාවය වස්තුවාරාලම්බනයෝය සත්පුරුෂොපනිශ්‍රය පාරමිසම්භාර ය යනාදී ධර්මයෝ වෙත් ඔවුන් අතුරෙන් ශ්‍රද්ධාතොමෝ සභාග හෙතු නාමුදු අධ්‍යාත්මික හෙතුනාමුදු ජනකහෙතු නාමුදු අසාධාරණ හෙතු නාමුදුවේ, දෙයයධර්ම දක්ෂිණාහයෝ විසභාග ප්‍රත්‍යය නාමුදු බාහිර ප්‍රත්‍යය නාමුදු උපස්ථම්භක ප්‍රත්‍යය නාමුදු සාධාරණ ප්‍රත්‍යයනාමුදුවේ. යොනිසොමනස්කාර යොමෙ සභාගහෙතුනාමුදු අධ්‍යාත්මික හෙතු නාමුදු ජනකහෙතු නාමුදුවේ, ඒ යොනිසොමනස්කාරය වනාහි සියළු කුශලධර්මයන් හා සාධාරණවන බැවින් සාධාරණ ප්‍රත්‍යය නාමුදුවේ. කායවාග් විඥප්ති දෙදෙන පූජන ක්‍රියාවෙන් ගැණිමක් ඇතිකල්හි ඒ විඥප්ති රූපසහිත කලාපයෙහි පිහිටි සතරමහාභූත රූපයෝ සභාග හෙතු නාමුදු අධ්‍යාත්මික හෙතු නාමුදු ජනකහෙතු නාමුදුවෙත්, එම රූපකලාපයෙහි පිරිවරකොට ඇති වර්ණගන්ධරස ඔජාදීහු ඒ පූජනක්‍රියා සංඛ්‍යාත ඵලය හා සාධාරණවන බැවින් සාධාරණ ප්‍රත්‍යයෝ නාමුදුවෙත් මේ ආදී ක්‍රමයෙන් “පූජාච පූජනීයානං,, යන සූත්‍රාන්ත දෙශනා පදය හෙතුකාරණයන් හා ප්‍රත්‍යය කාරණයන් විභාගකරණ හෙයින් පරික්ඛාර හාරනම්වේ.

පරික්ඛාරහාරයයි.

---

“යෙධම්මා යං මූලා - යෙචෙකත්ථා පකාසිතාමුනිනා
තෙසමාරොපයිතබ්බා - එසසමාරොපනො හාරො,,

යන නෙත්තිපාළියට සුදුසුපරිද්දෙන් සූත්‍රාන්තයෙහි ආවාවූ ධර්මයෝ පදස්ථානය වෙවචනය භාවනාය පහාණය යන සතර ධර්මයන්ගේ වශයෙන් හෙවත් ඒ සතරධර්මයන්ට මොහුමට ආරොපනයකොට විනිශ්චයකිරීම ලක්ෂණකොටඇත්තාවූ හාරතෙමේ “සමාරොපියන්ති එතෙන එත්ථවා පදස්ථානාදී මුඛෙනධම්මානි සමාරොපනො,, යනු නිර්වචන බැවින් සමාරොපනහාරනමවේ. ඒ සතර ධර්මයන් අතුරෙන් “පූජා,, යන පදයාගේ අර්ථයවූ ආමිශපූජා ධර්මපූජාමය චිත්තොත්පාදය යොනිසොමනසිකාරය සද්ධර්මශ්‍රවණය සත්පුරුෂොපනිශ්‍රය යනාදීවූ ආසන්නකාරණයන්ගේ පරම්පරාවට ආරොපනයකොට විනිශ්චයකිරීම පදස්ථානසමාරොපන නාම්වේ.

“පාඨානුසාරීසම්බන්ධො සම්බන්ධො උපමායච
හෙතුනාපිච සම්බන්ධො උපමාහෙතුනාපිච
සම්බන්ධභෙදවිඤ්ඤෙය්‍යා චත්තාරොපි විභාවිතා,,

යන ගාථාවෙහි කී පරිද්දෙන් වෙවචන හාරයෙහි දක්වනලද විවිධ විශෙෂ වෙවචන පර්‍ය්‍යාය ශබ්දයන්ට පෙරලීම් වශයෙන් අර්ථ සම්බන්ධයට ආරොපනයකොට අර්ථයන්ගේ දැක්වීමකිරීම වෙවචන සමාරොපන නාම්වේ. ක්‍රියාකාරක සම්බන්ධය උපමාසම්බන්ධය හෙතුසම්බන්ධය උපමාහෙතුසම්බන්ධය යන සම්බන්ධ චතුස්කය දතයුතුයි.

“පූජා., යන පදයාගේ අර්ථයවූ පූජන ක්‍රියාවෙන් ගටගන්නාවූ වොදන පාක්ෂික ධර්මයන්ට ආරොපනයකොට අර්ථදක්වීම භාවනා සමාරොපන නම්වේ, ඒ පූජන ක්‍රියාවෙන් දුරුකටයුතුවූ සංක්ලෙශ පාක්ෂික ධර්මයන්ට ආරොපනයකොට අර්ථප්‍රකාශකිරීම පහාණ සමාරොපන නම්වේ ( නොහොත් ) පූජාකරන්නාවූ කුලපුත්‍රයන්ගේ සන්තානයෙහි පූජාමය කුශලචිත්තයහා සම්ගතවගන්නාවූ ශ්‍රද්ධෙන්ද්‍රිය ශ්‍රද්ධාබල සම්‍යක්ප්‍රධාන විරියිද්ධිපාද විරියින්ද්‍රිය විරියබල වීර්‍යසම්බොධ්‍යංග සම්‍යක්ව්‍යායාම මාර්ගාංගාදිවූ බොධිපාක්ෂික ධර්මයෝද ඔවුන් කෙරෙන් අන්‍යවූ එම කුශලචිත්ත සම්ප්‍රයුක්තවූ ශුක්ලපක්ෂයෙහිවූ සියළු වොදන ධර්මයෝද අභිවෘද්ධියට යෙත්, මෙසේ සියළු ධර්මයන් උද්ධරණයකොට විභාගකිරීම භාවනා සමාරොපන නම්වේ ඒ ශ්‍රද්ධා වීර්‍යාදිවූ වොදන පාක්ෂික ධර්මයන්ගේ දියුණුවීම හෙතුකොටගෙණ ඒ ධර්මයන්ට ප්‍රතිපක්ෂවූ අශ්‍රද්ධිය කෞසජ්ජ පමාද කාමච්ඡන්ද මොහාදිවූ ධර්මයෝද ඔවුන් කෙරෙන් අන්‍යවූ කෘෂ්ණපක්ෂයෙහි සකල සංක්ලෙශික ධර්මයෝද ප්‍රහාණයට යෙති ඒ ධර්මයන්ගේ ප්‍රහාණ වශයෙන් අර්ථවර්ණනාකිරීම පහණ සමාරොපන නම්වේ. මේ ආදී ක්‍රමයෙන් “පූජාච පූජනීයානං,, යන සූත්‍රාන්ත දෙශණාපදය පදස්ථාන සමාරොපනය වෙවචන සමාරොපනය භාවනා සමාරොපනය පහාන සමාරොපනය යන මොවුන්ගේ වශයෙන් ආරොපනය කිරීමෙන් අර්ථප්‍රකාශකරණ හෙයින් සමාරොපන හාරනම්වේ.

සමාරොපන හාරයයි.

# සොළසහාරයයි.

“එවං සුපරිකම්මකතාය භූමියා නානාවණ්ණානි විචිත්‍රපුප්ඵානි පරිකිරන්තෙනාවිය සුසික්ඛිතසිප්පාචරිය විරචිතෙසු රතනසුවණ්ණාලංකාරෙසු නානාවිධරංසිජාලසමුජ්ජලානි විවිධානි මණිරතනානි බන්ධන්තෙනාවිය මහාපඨවිං පරිවත්තෙත්වා පප්පටකොජං ඛාදපෙන්තෙනාවිය ගොජනිකමධුගණ්ඩං පීළෙත්වා සුමධුරමධුරසං පායෙන්තෙනාවියච ආයස්මා මහාකච්චානො නානාසුත්තපදෙස උදාහරන්තො සොළස හාරෙ විභජිත්වා ඉදානි තෙ එකස්මිංයෙව සුත්තෙ යොජෙත්වා දස්සෙන්තො හාරසම්පාතවාරං ආරභි—පෙ--අනෙකෙහි සුත්තපදෙසෙහි හාරානං විභාගදස්සනමෙවහි හාරවිභඞ්ගවාරො හාරසම්පාතවාරො පන තං පයොජෙති එකස්මිංයෙව සුත්තපදෙසෙ සොළසහාරෙ යොජෙත්වා තදත්තාරං නයසමුට්ඨානස්ස කාමිතබ්බත්තා,, යනු නෙත්ති අටුවා බැවින් එකම සූත්‍රප්‍රදෙසයෙක සොළසහාරයන් යෙදීම හාරසම්පාතවාරයයි කී නියායෙන් “පූජාච පූජනීයානං” යන සූත්‍රප්‍රදෙශයෙන්

සොළසහාර සම්පාතවාරය දක්වා තදනන්තරව නන්දියාවත්තාදි නය පඤ්චකය දක්වනු ලැබේ නොයෙක් සූත්‍රයෙන් උදහරණ කටයුතුවූ හාර විභඞ්ගවාරය ඉතා විස්තර බැවින් මේ ප්‍රකරණයට ඇතුළත් නොකරණ ලදී.

"සොළසහාරා පඨමං-දිසාලොචනතො දිසාවිලොකෙත්වා
සඞ්ඛිපිය අඞ්කුසෙනහි-නයෙහිතීහි නිද්දිසෙ සුත්තං,,

යන නෙත්තිපාලියට සුදුසු පරිද්දෙන් සොළස හාරයන් පළමු කොට දක්වා ඊට අනතුරුව න්‍යාය විධිය දක්වනු ලැබේ. කුමක් හෙයින් න්‍යාය නම්වේදයත්? "නයති සංකිලෙස වොදානානි විභාගතො ඤාපෙතීති නයො,, යනු වචනාර්ථ බැවින් සංකිලෙස පක්ෂයෙහිවූද වොදාන පක්ෂයෙහිවූද අකුශල කුශලධර්මයන් රාශිවශයෙන් විභාග කොට හඳුන්වන අර්ථයෙන්ද "නීයන්ති වා තානි එතෙන එත්ථවාති නයො,, යනු වචනාර්ථ බැවින් මෙයින් ඒ සංකිලෙසික වොදාන ධර්මයන් අවබොධකිරීම එළවන බැවිනුදු මෙහි ඒ ධර්මයන් විභාගකරණ බැවිනුදු "නීයන්ති උපනීයන්ති ධම්මකප්පකොහිතිවා නයො,, යනු වචනාර්ථ බැවින් සූත්‍රාර්ථයාගේ අර්ථය විභාගකරණු පිණිස ධර්මකථිකයන් විසින් දතයුතු හෙයින්ද එළවියයුතු හෙයින්ද "නයොවියාතිවා නයො,, යනු වචනාර්ථ බැවින්-

"එකත්තතනයො නානත්ත මබ්‍යාපාරනයොපිච
එවං ධම්මතානයොති ච තුධාත්ථනයානුව-
සන්තානස්සානුපච්ඡෙදෙ නානාභාවො නිරිගතා
යථාහෙතුසමුප්පන්නානංතෙසං සාතතාදියථාසකං,,

යනුමෙන් කියනලද එකත්තනය නානත්තනය අබ්‍යාපාරය එවං ධම්මතාය යන සතර න්‍යායයෝ තුමූ ඉත්ථිපුරිස යනාදීවූ සම්මුති සත්‍යය හා පඤ්චස්කන්ධාදී පරමාර්ථ සත්‍යයද අමිශ්‍රකොට අවබොධ කිරීම චතුරාර්යසත්‍ය ධර්මයන් අවබොධකිරීම පිණිස පවත්නාක් මෙන් කුශලාකුශල ධර්මයන් විභාගකොට ප්‍රකාශකිරීමෙන් සූත්‍රාර්ථය අවිපරීත වශයෙන් අවබොධකරවමින් වෛනෙය ජනයන්ගේ චතුරාර්ය සත්‍යාවබොධය පිණිස පවත්නා හෙයින් එකත්තාදීවූ න්‍යාය යන්හා සමාන බැවින්ද න්‍යාය නම්වේ. ඒ න්‍යාය තෙමේ යටකියනලද සාමාන්‍ය ලක්ෂණ වශයෙන් එක්වැදැරුම්වේ විශෙෂ ලක්ෂණ යන් ආශ්‍රයකොට බෙදනකල්හි-

"පඨමො නන්දියාවත්තො දුතියො ච තිපුක්ඛලො
සීහවික්කීළිතොනාම තතියො නයලඤ්ජකො
දිසාලොචනමාහංසු චතුත්ථං නයමුත්තමං
පඤ්චමො අඞ්කුසොනාම සබ්බෙපඤ්චනයාගතා,,

යන නෙත්තිපාලියෙහි කීනියායෙන් පඤ්චප්‍රකාරවේ. ඔවුන් අතුරෙන් නන්දියාවත්තනයාය කෙසේදයත්? "නන්දියාවත්තනස්සහිය ආචරියා

ඤාණං ති නන්දියාවට්ටො නන්දියාවත්තණිහාය පමොදස්සවා ආවට්ටො එ ත්ථාති නන්දියාවත්තො,, යනු වචනාබැවින් වතුසුදු පුෂ්පයාගේ පුෂ් පදලයන්ගේ අවුල්වීමවැනි අවුලක් යම් තෘෂ්ණා අවිද්‍යා සමථවිදර්ශ ණාසංඛ්‍යාත සංක්ලේශපාක්ෂික ව්‍යොදානපාක්ෂිකධර්මයන්ගේ ඇත්තේ වේද ඒ අවුල හෝ ( නොහොත් ) නන්දි නම්වූ තෘෂ්ණාතොමෝ නන්දීනම්වූ ප්‍රීතිප්‍රමෝද්‍යයට අවුල්වේද පෙරළේදඒ අවුල්වීම හෝ පෙරළීම නන්දියාවත්ත න්‍යායනම්වේ * ඒ න්‍යාය තෙමේ-

“තණ්හඤ්ච අවිජ්ජඤ්ච-සමථෙන විපස්සනාය යො නෙති
සච්චෙහි යොජයති -අයං නයො නන්දියාවත්තො,,

යනුනෙත්තිපාළිබැවින් තෘෂ්ණා අවිද්‍යාවන්ගේ වශයෙන් සංකිලෙස පාක්ෂිකවූ සූත්‍රයාගේ අර්ථයද සමථ විදර්ශනාවන්ගේ වශයෙන් ව්‍යොදාන පාක්ෂික සූත්‍රයාගේ අර්ථයද චතුරාර්‍ය්‍යසත්‍යයන් හා යුක්තකොට අර්ථ එළවීම ලක්ෂණකොට ඇත්තේයි. මෙවත් තෘෂ්ණාදි පාප ධර්මයන් ප්‍රකාශවූ සූත්‍රයෙන් හෝ සමාධි ආදි කුශලධර්මයන් ප්‍රකාශවූ සූත්‍රයෙන් හෝ උඩුයටිව අවුල්ව පවත්නා චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශකිරීම නන්දියා වත් න්‍යායයාගේ ලක්ෂණයි ඒ කෙසේ එළවන්නේදයත්? “පූජව පූ ජනීයානං” යන වාක්‍යයෙහි “පූජා,. යන පදයාගේ අර්ථවූ ආමිෂ පූජා ධර්මපූජා මය කුශලචේතනා තොමෝ සංස්කාරනම්වේ ඒ සංස්කා රයන්ගේ ගැණීමෙන් ඒ සංස්කාරයන්ගේ ප්‍රභව හෙතුවූ අවිද්‍යාවද ගතනාලැබේ. ඒ සංස්කාර අවිද්‍යාවන්ගේ ගැණීමෙන් අවිද්‍යා සංඛ්‍යාත මොහය හා ලොභසංඛ්‍යාත තෘෂ්ණාවද එක්ව හැසිරෙණ බැවින් තෘෂ්ණාවද ගත්නාලැබේ ඒ අවිද්‍යා තෘෂ්ණා සංඛ්‍යාත මූල පදයන්ගේ ගැණීමෙන් ඔවුන් හා සම්ප්‍රයුක්තවූ අටවැදෑරුම් දෘෂ්ටිගත සියළු අකුශල ධර්මයෝද ගන්නාලැබේ. පූජා යන පදයාගේ අර්ථ යන් අතුරෙහි ඇතුළත්වූ නොහොත් පූජාමය කුශලචිත්ත සම්ප්‍ර යුක්ත සමාධි තෙමේ සමථනම් වේයි. ඒ සමාධිය ගැණීමෙන් තත් සම්ප්‍රයුක්ත ප්‍රඥාවද ලැබෙනහෙයින් ඒ ප්‍රඥාතොමෝ විදර්ශනානම්වේ. ඒ සමථවිදර්ශනා සංඛ්‍යාත මූලපදයන්ගේ ගැණීමෙන් ව්‍යොදානපක්ෂ යෙහිවූ සියළු කුශල ධර්මයෝද ගන්නාලැබේ.

“පූජා”යන පදයෙන් ලබ්භමානවූ චිත්තොත්පාදයෙහි ඇතුළත්වූ ඒකාග්‍රතා සංඛ්‍යාත සමාධිය සමථනම්වේ, තත්සම්ප්‍රයුක්තවූ ප්‍රඥාතො

---

* වේදයෙහි රාජමන්දිර විශේෂයක්ද නන්දියාවත් යයි ව්‍යවහාර කරති ඒ මෙසේයි.

“දක්ෂිණානුගතාලින්ද-ත්‍රයංයත්පශ්චිමාමුඛම්-පූජ්‍යති ශොභන රම්‍යාඞ්ගං-නන්‍ද්‍යාවර්තං වදන්ති තත්,, එසේකුදුවූවත් නන්දියාවත් න්‍යා ය හා බුදුන්ගේ ශ්‍රීපාදතලයෙහි පිහිටි නන්දියාවර්ත ලක්ෂණයත් වතු සුදු පුෂ්පදලයන්ගේ අවුල්වීම වැනි ලක්ෂණයකැයි අපගේ ආචාර්‍ය්‍ය පරම්පරාගත මතයි.

මෝ විදර්ශනා නම්වේ, ඒ සමථවිදර්ශනා සංඛ්‍යාත මූලපදයන්ගේ ගැ
ණීමෙන් තත්පාක්ෂිකවූ සියළු කුශලධර්මයෝද ගණනාලැබේ. මෙසේ
ගණනාලද සංක්ලෙශ පාක්ෂිකවූද ව්‍යෝදාන පාක්ෂිකවූද ධර්ම සමූහයන්
අතුරෙන් තෘෂ්ණා අවිද්‍යා දෙදෙන ප්‍රධානකොටඇති තය පාක්ෂික
අවශෙෂ අකුශල ධර්මයෝද ආශ්‍රව ධර්මයන්ට අරමුණුවූ කුශලචිත්
තොත්පාදයෝද යන මෙතෙක් ධර්මයෝ සමුදය සත්‍යනම්වේ අවශෙ
ෂවූ ත්‍රෛභූමික ධර්මසමූහය දුඃඛසත්‍ය නම්වේ සමථවිදර්ශනා දෙදෙන
මාර්ගසත්‍ය නම්වේ, ඒ මාර්ගසත්‍යයෙන් පැමිණියයුතුවූ නිර්වාණධර්මය නි
රොධ සත්‍ය නම්වේ, ඒ ධර්මසමුදය අතුරෙන් සංක්ලෙශික පක්ෂයෙහිවූ
තෘෂ්ණාතොමෝ අකුශලපක්ෂයෙහි ප්‍රථමදිසා නම්වේ, තත්සම්ප්‍රයුක්ත
වූ අවිද්‍යා තොමෝ එපක්ෂයෙහි ද්විතීයදිසානම්වේ, ව්‍යෝදානපක්ෂයෙ
හිවූ සමථය කුශලපක්ෂයෙහි ප්‍රථමදිසා නම්වේ, ඒ පක්ෂයෙහිවූ ප්‍රඥා
තොමෝ කුශල පක්ෂයෙහි ද්විතීයදිසා නම්වේ, මේ නන්ද්‍යාවර්ත න්‍යා
යෙහි තෘෂ්ණා අවිද්‍යා සමථ විපස්සනා යන සතර මූලපදයෝද තෘෂ්ණා
චරිත දිෂ්ටිචරිත යන පුද්ගලයෝ දෙදෙනාද දතයුත්තාහුය. ඔවුන්
අතුරෙන් තෘෂ්ණාචරිත පුද්ගලතෙමේ මේ සස්නෙහි පැවිදිවිනම්
ඒ ප්‍රව්‍රජිතතෙමේ දුඃඛාප්‍රතිපදාව කාරණකොටගෙණ ව්‍යෝදාන
පක්ෂයෙහි ප්‍රථම දිසායයි කියනලද සමථය උපනිශ්‍රයකොට ගෙණ
සංක්ලෙශ පක්ෂයෙහි ප්‍රථම දිසායයි කියනලද තෘෂ්ණා සංඛ්‍යාත
වට්ටමූලය මුල්කොට පවත්නාවූ තෘෂ්ණා පාක්ෂික සියළු අකුශල ධර්ම
යන් සමුච්ඡෙද ප්‍රහාණ වශයෙන් දුරුකිරීමෙන් වෘත්තයෙන් නික්ම
අනාගාමි මාර්ගඵලයන්ට පැමිණීම කාරණ හෙයින් සමථ සංඛ්‍යාත
ප්‍රථම දිසාවගේ අන්තයෙහිවූ රාග විරාග චෙතො විමුක්ති සංඛ්‍යාත
නිර්වාණයට පැමිණෙන්නේයි ඒ පුද්ගලයන් දෙදෙනා අතුරෙන් දිෂ්ටි
චරිත පුද්ගල තෙමේ මේ ශාසනයෙහි පැවිදිවීනම් ඒ ප්‍රව්‍රජිතතෙමේ
සුඛාප්‍රතිපදාවෙන් ව්‍යෝදානපක්ෂයෙහි ද්විතීය දිසාවයයි කියනලද වි
දර්ශනාව උපනිශ්‍රයකොට ගෙණ සංක්ලෙශ පක්ෂයෙහි ද්විතීය දිසාව
යයි කියනලද අවිද්‍යාසංඛ්‍යාත වට්ටමූලය මුල්කොට පවත්නාවූ අ
විද්‍යාපාක්ෂික සකල සංක්ලෙශික ධර්මයන් සමුච්ඡෙද ප්‍රහාණයෙන් න
සාවෘතතයෙන් නික්ම අර්හත් මාර්ගඵලයන්ට පැමිණීම කාරණ හෙ
යින් විදර්ශනා සංඛ්‍යාත ද්විතීය දිසාවගේ අන්තයෙහිවූ අවිජ්ජා විරාගා
පඤ්ඤා විමුක්ති සංඛ්‍යාත නිර්වාණට පැමිණේ මේ ආදී ක්‍රමයෙන් "ප්‍රු
ජව පුජනීයානං" යන සූත්‍රාන්ත දෙශනාපදය තෘෂ්ණා අවිද්‍යා සමථ
විදර්ශනා සංඛ්‍යාත සතර මූලපදයන්ගේ වශයෙන් සංක්ලෙශපාක්ෂික
වූද ව්‍යෝදාන පාක්ෂිකවූද සකල ධර්මසමූහය චතුරාර්ය සත්‍යය හා යුක්
තකොට තෘෂ්ණාචරිත දිෂ්ටිචරිත පුද්ගලයන් දෙදෙනාගේ වශයෙන්
නවභූමියට එළවා අර්ථවර්ණනාකිරීම මේ නන්ද්‍යාවර්ත න්‍යායයාගේ
ලක්ෂණයි.

**නන්ද්‍යාවර්තන්‍යායයි.**

තිපුක්ඛල න්‍යාය කවරයත්? "තීහිඅවයවෙහි පුක්ඛලො සොභනොති තිපුක්ඛලො" යනුවෙන් මේ පදය බුරුමරට ආචාර්‍ය්‍යවරයන් විසින් විග්‍රහකරණු ලැබේ. එහෙයින් "පුක්ඛල" ශබ්දය සොභනාර්ථයෙහි වැටෙන්නේය යනු ඒ ආචාර්‍ය්‍යයන්ගේ මතයබව ගැනේ එනකුදුවුවත් "පුක්ඛල" ශබ්දය අටම්මෙක් එක්කුඩියෙක කුඩිඅටෙක් එක් පුෂ්කලයෙක්වේයි, යන පරිමාන භෙදයෙන්මුත් සොභනාර්ථයෙහි පවත්නාබවක් නොපැණේ, ධාතූන්ගේ අනෙකාර්ථ භාවයෙන් එසේ වැටේ තුදු අර්ථය නොයෙදෙන හෙයින් අපාර්ථ ශබ්දයක්වේ, නෙත්ති අටුවාවෙහි "ඉදානි උග්ඝටිතඤ්ඤූආදිපුග්ගලත්තයවසෙන තිපුග්ගලස්සභූමිං විභාවෙතුකාමො" යනාදී පාඨයෙන් උග්ඝටිතඤ්ඤ විපඤ්චිතඤ්ඤ නෙය්‍යය යන ත්‍රිවිධ පුද්ගලයන්ගේ වශයෙන් තිපුග්ගලනය භූමියදක්වන්නේයයි කී බැවින් තිපුග්ගල යනු ශුද්ධපාඨයයි හැඟේ ස්‍යාම දෙශවාසීන්ගේ ස්වකීය භාෂාවේ ගකාර ඝකාරයන් වෙනුවට කකාර ඛකාරයන් ව්‍යවහාර කරණ බැවින්ඔවුන්ගේ පොත් වල තුබූ "තිපුක්ඛල" යන අව්‍යක්ත ලිපියක් ගරුකොට ගෙණ සියම් බුරුම දෙරට විසූ ආචාර්‍ය්‍යවරු "තිපුක්ඛල" ශබ්දයට ස්වමතයෙන් නිර්වචන යොදනන්නානුයි සිතියයුතුවේ එහෙයින් "තීහිපුග්ගලෙහි සොභනොති තිපුග්ගලො" යන නිර්වචනය ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන්ට අභිමතයයි ගනිමු ප්‍රාඥයන් විසින් පරීක්ෂාකොට සුදුසු අර්ථයක් ගතයුතුයි

මේ තිපුක්ඛල න්‍යාය විභාගය මෙසේ දතයුතුයි

සංකිලෙස පක්ෂයෙහි ලොභ ද්වෙෂ මොහ යන හෙතූන්ගෙන්ද වොදාන පක්ෂයෙහි අලොභ අද්වෙෂ අමොහ යන හෙතූන්ගෙන්ද යන උභයපක්ෂයෙහි තුන් තුන් අවයව කෙනෙකුගෙන් යුක්තවූ න්‍යාය හෝ තිපුක්ඛල න්‍යාය නම්වේ.

"යො අකුසලෙ සමූලෙහි-නෙති කුසලෙච කුසලමූලෙහි
භූතං තථං අවිතථං-තිපුක්ඛලං තං නයං ආහු,,

යනු නෙත්තිපාළි බැවින් ත්‍රිවිධ අකුශල මූලයන්ගේ වශයෙන් සංකිලෙස පාක්ෂික සූත්‍රාන්තයාගේ අර්ථයද ත්‍රිවිධ කුශල මූලයන්ගේ වශයෙන් වොදානපාක්ෂික සූත්‍රාන්තයාගේ අර්ථයද චතුරාර්‍ය්‍යසත්‍යයෙන් යුක්තකොට අර්ථඑළවීම මේ න්‍යායයාගේ ලක්ෂණයි, කෙසේ එළවන්නේදයත්? නව නන්ද්‍යාවර්ත න්‍යායෙහි චතුස්සත්‍යයන්ට බෙද දක්වනලද ධර්මසමූහයන් අතුරෙන් සංකිලෙස පක්ෂයෙහිවූ ලොභ ද්වෙෂ මොහ සංඛ්‍යාත අකුශලමූලයෝ තුන්දෙන ක්‍රමයෙන් ප්‍රථම ද්විතීය තෘතීය දිශානම්වෙත් වොදාන පක්ෂයෙහි අලොභ අද්වෙෂ අමොහ තුන්දෙනද ඒ පක්ෂයෙහි ප්‍රථම ද්විතීය තෘතීය දිශා නම්වෙත් මේ තිපුක්ඛල න්‍යායෙහි අකුසල් මුල්තුණය කුසල් මුල්තුණය යන මූල පද සයෙනද උද්ඝටිතඥ විපඤ්චිතඥ නෙය්‍ය යන පුද්ගලයන් තුන්

දෙනාද දනයුත්තාහුය. ඔවුන් අතුරෙන් දෘෂ්ටිචරිත උද්ඝටිත පුද්ගලතෙමේ උද්ඝටිතඥ නම්වේ, දෘෂ්ටිචරිත අනුද්ඝටිත පුද්ගලයා තෘෂ්ණාචරිත උද්ඝටිත පුද්ගලතෙමේද විපචිතඥ නම්වේ, තෘෂ්ණාචරිත අනුද්ඝටිත පුද්ගලතෙමේ නෙයය නම්වේ, උද්ඝටිත අනුද්ඝටිත යනු නිත්‍යබද්ධ ශබ්දයන්ට පර්‍යාය ශබ්දයි ඒ ත්‍රිවිධ පුද්ගලයෝ මේ ශාසනයෙහි පැවිදිවූවාහුනම් වොදාන පක්ෂයෙහි ප්‍රථම දිසා සංඛ්‍යාත අලොභය උපනිශ්‍රයකොට ගෙණ සංකිලෙස පක්ෂයෙහි ප්‍රථමදිසා සංඛ්‍යාත ලොභය හා තත්පාක්ෂික අකුශල ධර්මයෝද ප්‍රහාණයකොට ප්‍රථම දිසාවගේ අන්තයෙහිවූ අප්‍රණිහිත විමොක්ෂයෙන් වෘත්තයෙන් නික්ම නිවන්පුර වදනාහුය. එපරිද්දෙන්ම අදොෂ අමොහයන් උපනිශ්‍රයකොට ගෙණ දොෂ මොහයන් හා තත්පාක්ෂික අකුශල ධර්මයෝද ප්‍රහීණකොට ක්‍රමයෙන් ද්විතීය තෘතීය දිසාවන්ගේ අන්තයෙහිවූ අනිමිත්ත විමොක්ෂ සුඤ්ඤත විමොක්ෂයන් කාරණකොට ගෙණ වෘත්තයෙන් නික්ම නිවන්පුර වදනාහුය මේ ආදී ක්‍රමයෙන් "පූජව පූජනියානං" යන සූත්‍රාන්ත දෙශනාපදය ලොභදොෂ මොහ අලොභ අදොෂ අමොහ යන ෂට්මූල පදයන්ගේ වශයෙන් සංකිලෙස වොදාන යන උභයපක්ෂයෙහිවූ සකල සූත්‍රාන්තයාගේ අර්ථය චතුස්සත්‍යය හා යුක්තකොට උද්ඝටිතඥාදි ත්‍රිවිධ පුද්ගලයන්ගේ වශයෙන් නයභූමියට එලවා අර්ථවර්ණනා කිරීම මේ න්‍යායයාගේ ලක්ෂණයි.

මේ "විපචිතඥ" ශබ්දය බුරුම රටවාසීහු පපඤ්චි ශබ්දාදියම අනුව "විපඤ්චිතඥ" යයි ව්‍යවහාර කරති.

### තිපුක්ඛල න්‍යායයි.

"සීහස්සවික්කීළිතං එතාති සීහවික්කීළිතං"

යනු නිර්වචනබැවින් චතුර්වෛශාරද්‍ය ගුණයෙන් අභීතකෙසර සිංහරාජයෙකුව බඳුවූ විපද්දෙනාම තථාගතයන්වහන්සේගේ සිංහරාජයෙකුගේ සතරදිශාවන්ට පැණ පවත්වන්නාවූ සිංහගර්ජනාවක්මෙන් සතරවිපල්ලාසධර්මයන් හා තත්ප්‍රතිපක්ෂ ධර්මයන් ප්‍රකාශකරමින් පවත්වන්නාවූ දෙශනා වර්ණකම් සංඛ්‍යාත විජ්‍රුම්භනය ප්‍රකාශකරන්නාවූ න්‍යාය තෙමේ "සීහවික්කීළිත" න්‍යාය නම්වේ ඒ න්‍යායද–

"යො නෙති විපල්ලාසෙහි–සංකිලෙසෙ ඉන්ද්‍රියෙහි සද්ධම්මෙ
එතං නයං නයවිදූ–සීහවික්කීළිතං ආහු,,

යන නෙත්තිපාළියට සුදුසු පරිද්දෙන් සතර විපල්ලාස ධර්මයන්ගේ වශයෙන් සංකිලෙස පාක්ෂිකවූ සූත්‍රාන්තයාගේ අර්ථයද ස්මෘතෙන්ද්‍රිය වීර්‍ය්‍යෙන්ද්‍රිය සමාධෙන්ද්‍රිය ප්‍රඥෙන්ද්‍රිය යන සතර ඉන්ද්‍රිය ධර්මයන්ගේ වශයෙන් වොදාන පාක්ෂිකවූ සූත්‍රාන්තයාගේ අර්ථයද චතුරාර්‍ය්‍ය සත්‍යය හා යුක්තකොට අවඑලවීම ලක්ෂණකොට ඇත්තාවූ න්‍යාය තෙමේ සීහවික්කීළිත න්‍යාය නම්වේ, ඒ න්‍යායයාගේ විභාග කෙසේ යත්? "පූජව පූජනීයානං" යන වාක්‍යයෙහි පූජා යන පදයෙන් ලභ්‍යමානවූ සට න්‍යායෙහි දක්වනලද ධර්මසමූහයන් අතුරෙන්

තෘෂ්ණාව කාරණකොටගෙණ අශුභෙසුභවිපල්ලාසය හා දුක්ඛෙසුඛ විපල්ලාසයද ලැබේ. අවිද්‍යාව කාරණකොටගෙණ අනිත්‍යයෙහි නිත්‍යවිපල්ලාසය හා අනත්තානි අත්තවිපල්ලාසයද ලැබේ(නොහොත්) තෘෂ්ණානිශ්‍රිත පුජාවෙන් සතර විපල්ලාසය හා තත්පාක්ෂික සියළු අකුශල ධර්මයෝද ලැබේ. දිට්ඨිනිශ්‍රිත පුජාවෙන් ස්මෘතිසමාධිවීය්‍ය ප්‍රඥා යන සතර ඉන්ද්‍රිය ධර්මයෝද සතර සතිපට්ඨානයෝද තත්පාක්ෂික සියළු කුශල ධර්මයෝද ලැබේ. ඒ ධර්ම සමූහයන් අතුරෙන් සංක්ලෙස පක්ෂයෙහිවූ අශුභෙ සුභය දුක්ඛෙ සුඛය අනිච්චෙ නිච්චය අනත්තානි අත්තය යන සතර විපල්ලාස ධර්මයෝද ක්‍රමයෙන් ප්‍රථම ද්වීතිය තෘතීය චතුර්ථ දිසාවෝ නම් වෙත් එපරිද්දෙන්ම වොදානපක්ෂයෙහි සතීන්ද්‍රිය අශුභෙඅශුභසම්‍යක්දර්ශනය කායානුපස්සනාසතිපට්ඨානය සමාධින්ද්‍රිය දුක්ඛෙදුක්ඛසම්‍යක්දර්ශනය වේදනානුපස්සනා සතිපට්ඨානය වීය්‍යෙන්ද්‍රිය අනිච්චෙඅනිච්චසම්‍යක්දර්ශනය චිත්තානුපස්සනා සතිපට්ඨානයද ප්‍රඥෙන්ද්‍රිය අනත්තනිඅනත්තසම්‍යක්දර්ශනය ධම්මානුපස්සනා සතිපට්ඨානයද යනමේ සතර ධර්මයෝ පිළිවෙළින් වොදාන පක්ෂයෙහි ප්‍රථම ද්වීතිය තෘතීය චතුර්ථ දිසාවෝ නම්වෙත් ඒ දිසා ධර්මයන් අතුරෙන් සතර විපල්ලාසයෝ තෘෂ්ණා සංඛ්‍යාත වට්ටමූලයෙහි ඇතුළත් වන බැවින් සමුදය සත්‍ය නම්වේ ඔවුන් කෙරෙන් අවශිෂ්ටවූ ත්‍රෛභූමක ධර්මසමූහය දුඃඛසත්‍ය නම්වේ, සතර ඉන්ද්‍රිය ධර්මයෝය සතර සම්‍යක්දර්ශනයෝය සතර සතිපට්ඨානයෝය යන මෙතෙක් ධර්මයෝ මාර්ගසත්‍ය නම්වේ,ඒ මාර්ගසත්‍යය කාරණකොටගෙණ පැමිණියයුතු නිර්වාණධර්මය නිරොධසත්‍ය නම්වේ,මේ සීහවික්කීළිත න්‍යායෙහි සතර විපල්ලාසය සතර සතිපට්ඨානය යන මූලපදයෝ අටදෙනද රාගචරිතය දෙසචරිතය දිඝචරිතඅනුද්ධතතය දිට්ඨිචරිතඋද්ධතතය යන පුද්ගලයෝ සතර දෙනද ලැබේ. ඒ පුද්ගලයෝ සතරදෙන ක්‍රමයෙන් වොදාන පාක්ෂික සතර දිසා ධර්මයන් උපනිශ්‍රය කොටගෙණ සංක්ලෙස පාක්ෂික සතර දිසා ධර්මයන් ප්‍රහීණකරමින් දිසා ධර්මයන්ගේ අන්තයෙහිවූ සතර මාර්ගඵල ධර්මයන් කාරණකොටගෙණ වෘත්තයෙන් නික්ම නිර්වාණක්ෂෙම භූමියට ඇතුළත්වන්නාහු වෙති මේ ආදී ක්‍රමයෙන්“පූජාව පූජනීයානං”යන සූත්‍රාන්ත දෙශණා පදය වනාහි මූලපදයන් අටදෙනා කාරණකොටගෙණ සංක්ලෙස පාක්ෂික වොදාන පාක්ෂික සූත්‍රාන්තයාගේ අර්ථය චතුරාය්‍යසත්‍යය හා යුක්තකොට චතුර්විධ පුද්ගලයන්ගේ වශයෙන් නයභූමියට එළවා අර්ථවර්ණනා කිරීම සීහවික්කීළිත න්‍යායයාගේ ලක්ෂණයි.

**සීහවික්කීළිත න්‍යායයි.**

---

“වෙය්‍යාකරණෙසු හි යෙ-කුසලා කුසලා තහිං තහිං වුත්තා
මනසා ඔලොකයතෙ-තං දිසාලොචනං ආහු”

යන නෙත්තිපාළියට සුදුසු පරිද්දෙන් යටි කියනලද නන්දියාවට්ට තිපුක්ඛල සීහවික්කීළිත යන අත්ථනයත්‍රයෙහි දක්වනලද කුශලාකුශලවූ අටලොස් දිසා ධර්මයන් සිත කාරණකොටගෙණ ( හෙවත් ) සිතින් දැකීමට හෙතුභූතවූ න්‍යාය තෙමේ "දිසා ආලොචයති එතෙනාති දිසාලොචනො" යනු වචනාර්ථ බැවින් "දිසාලොචන න්‍යාය" නම්වේ.

"ඔලොකයිත්ව දිසලොචනෙන-උක්ඛිපියයං සමානෙති
සබ්බකුසලා කුසලෙ-අයං නයො අංකුසොනාම,,

යන පාළියට සුදුසු පරිද්දෙන් කැමති යම් වස්තුවක් කැමති ස්ථානයකට අංකුසයකින් ( හෙවත් ) කොකියකින් අවිළුවා ඇදගැණීමක් මෙන් දිසාලොචන න්‍යාය කාරණකොටගෙණ සිතින් දක්නාලද දිසා ධර්මයන් යටදක්වනලද ක්‍රමයෙන් අර්ථනයත්‍රයෙහි මොනවට එළවීමට හෙතුභූතවූ න්‍යාය තෙමේ "අඞ්කුසොවියාති අඞ්කුසො,, යනු නිර්වචන බැවින් අංකුස න්‍යාය නම්වේ, මේ දිසාලොචන අංකුස යන න්‍යාය දෙදෙන වෙන් වෙන් කොට යෙදීමක් නෙත්තිප්‍රකරණ පෙටකොපදෙශ අර්ථකථාටීකාදියෙහි නොදක්නාලැබේ. යටකී අර්ථනයත්‍රය යෙදියයුතු දෙශනාපදයෙක්හි ලැබියයුතු දිසා ධර්මයන් සිතින් අවලොකනයකොට සිතින් කැමති ස්ථානයකට ගැණීම් මාත්‍රයක් මේ න්‍යාය දෙදෙනාගේ ලක්ෂණවෙත්, දැකීමය එළවීමයයි කියනලද ව්‍යවහාරය දැකීම හා එළවීමයයි කියනලද ක්‍රියාමාත්‍රයක් වනහෙයින් දිසාලොචන න්‍යායට ව්‍යවහාර න්‍යාය කියාද අඞ්කුස න්‍යායට කම් න්‍යායයි කියාද ව්‍යවහාරකරණු ලැබේ. එහෙයින් නෙත්තිප්‍රකරණාදියෙහි "වොහාරකම්"යන නම්වලින් දිසාලොචන අඞ්කුස න්‍යායයන්ම ප්‍රකාශකරණ බව දතයුතුයි.

දිසාලොචන න්‍යාය හා අංකුස න්‍යායයි.

## නයපඤ්චකයයි.

සාසනපට්ඨාන සංවණ්ණනාව කෙසේයත් "දෙසනාසංඛාතසාසනස්ස වෙනෙය්‍යජ්ඣාසයානුරූපං පකාරෙහි ඨානං පවත්ති සාසනපට්ඨානං ඉධපනස්ස තප්පභාවදීපනං සාසනපට්ඨානං,, යනු වචනාර්ථ බැවින් ත්‍රිවිධ විනෙයජනයන්ගේ අදහස් පරිද්දෙන් සංකිලෙසභාගියාදී ප්‍රභෙදයන්ගේ වශයෙන් දෙශනාවගේ සිටීම ( නොහොත් ) පැවතීම ප්‍රකාශකරන්නාවූ සංවණ්ණනාතොමෝ "සසනපට්ඨාන" නම්වේ "අට්ඨාරසමූලපදා කුහිං දට්ඨබ්බා සාසනපට්ඨානෙ" යන දෙශනාපාළියට සුදුසුපරිද්දෙන් යටකී නයපඤ්චකයෙහි දක්වනලද අටලොස්මූලපදසංඛ්‍යාත දිශාධර්මයෝ "සාසනපට්ඨාන,, නම්වූ ත්‍රිපිටක සූත්‍රාන්තපදයෙහි සෙවියයුත්තාහුය ඒ අටලොස්මූලපදයන්ට ආධාරස්ථානවූ "සාසනපට්ඨාන" නම්වූ සියළු සූත්‍රතෙමේ පාළියෙහි ආවාවූ සංකිලෙසභාගිය සූත්‍රය,වාසනාභාගිය සූත්‍රය,නිබ්බෙධභාගිය සූත්‍රය, අසෙඛභාගිය සූ

ත්‍රය, සංකිලෙසවාසනාභාගිය සූත්‍රය, සංකිලෙසනිබ්බෙධභාගිය සූත්‍රය, සංකිලෙසඅසෙක්ඛභාගිය සූත්‍රය, සංකිලෙසනිබ්බෙධඅසෙක්ඛභාගිය සූත්‍රය, සංකිලෙසවාසනානිබ්බෙධභාගිය සූත්‍රය, වාසනානිබ්බෙධභාගිය සූත්‍රය, තණ්හාසංකිලෙසභාගිය සූත්‍රය, දිට්ඨිසංකිලෙසභාගිය සූත්‍රය, දුච්චරිත සංකිලෙසභාගිය සූත්‍රය, තණ්හාවොදානභාගියසූත්‍රය, දිට්ඨිවොදානභාගියසූත්‍රය, දුච්චරිතවොදාන භාගිය සූත්‍රය, යන මොවුන්ගේ වශයෙන් සොළොස් සූත්‍රකෙනෙක්ද අට්ඨකථාචාර්‍ය්‍යකායෙහි ආවාවූ සංකිලෙසභාගිය, වාසනාභාගිය, නිබ්බෙධභාගිය, අසෙක්ඛභාගිය, යන එකමූලිකසූත්‍ර සතරක්ද සංකිලෙසවාසනාභාගිය, සංකිලෙසනිබ්බෙධභාගිය, සංකිලෙසඅසෙක්ඛභාගිය, වාසනානිබ්බෙධභාගිය, වාසනාඅසෙක්ඛභාගිය, නිබ්බෙධඅසෙක්ඛභාගිය, යන ද්විමූලික සූත්‍ර සයක්ද සංකිලෙසවාසනානිබ්බෙධභාගිය, සංකිලෙසවාසනා අසෙක්ඛභාගිය, සංකිලෙසනිබ්බෙධ අසෙක්ඛභාගිය, වාසනානිබ්බෙධ අසෙක්ඛභාගිය, යන ත්‍රිමූලික සූත්‍ර සතරක්ද සබ්බභාගිය සූත්‍රය, අසබ්බභාගිය සූත්‍රය, යන චතුමූලිකසූත්‍ර දෙකෙක්දැයි යන මොවුන්ගේ වශයෙන් සොළොස් සූත්‍රකෙනෙක්ද මෙසේම පාළියෙහි ආවාවූ ලොකියසූත්‍රය, ලොකොත්තර සූත්‍රය, ලොකිය ලොකුත්තර සූත්‍රය, යන තුනක්ද එපරිද්දෙන්ම සත්තාධිට්ඨාන සූත්‍රය, ධම්මාධිට්ඨාන සූත්‍රය, සත්තධම්මාධිට්ඨාන සූත්‍රය, යන තුණක්ද ඤාණසූත්‍රය, ඤෙය්‍යසූත්‍රය, ඤාණඤෙය්‍යය සූත්‍රය, යන තුණක්ද දස්සනපහාතබ්බ සූත්‍රය, භාවනාපහාතබ්බ සූත්‍රය, දස්සනභාවනාපහාතබ්බ සූත්‍රය, යන තුණක්ද සකවචන සූත්‍රය, පරවචන සූත්‍රය, සකපරවචන සූත්‍රය, යන තුණක්ද විස්සජ්ජනීය සූත්‍රය, අවිස්සජ්ජනීය සූත්‍රය, විස්සජ්ජනීයාවිස්සජ්ජනීය සූත්‍රය, යන තුණක්ද කම්මසූත්‍රය විපාක සූත්‍රය, කම්මවිපාක සූත්‍රය, යන තුණක්ද කුසලසූත්‍රය, අකුසලසූත්‍රය, කුසලාකුසල සූත්‍රය, යන තුණක්ද අනුඤ්ඤාත සූත්‍රය, පටික්ඛිත්තසූත්‍රය, අනුඤ්ඤාතපටික්ඛිත්තසූත්‍රය, යන තුණක්ද එතාවැදෑරුම්වූ එව සූත්‍රයදැයි යන මොවුන්ගේ වශයෙන් අටවිසි සූත්‍රයෙක්වෙති ඔවුන් අතුරෙන් අකුශලවිභාගයෙහි–

"කොධමක්ඛගරූ භික්ඛු–ලාභසක්කාරකාරණා
සුඛෙත්තෙ පූතිබීජංව–සද්ධම්මෙ න විරූහති,,

යනාදී සූත්‍රතෙමේ "සංකිලිස්සන්ති එතෙනාති සංකිලෙසො සංකිලෙසභාගෙ සංකිලෙසකොට්ඨාසෙ පවත්තං සංකිලෙසභාගියං" යනු වචනාර්ථ බැවින් සංකිලෙසභාගිය සූත්‍ර නම්වේ, ලෞකික කුශල විභාගයෙහි–

"එකපුප්ඵංච ජීත්වාන–සහස්සංකප්පකොටියො
දෙවෙසුචෙව මනුස්සෙසුච–සෙසෙන පරිනිබ්බුතො,,

යනාදී සූත්‍රතෙමේ "වාසනා පුඤ්ඤභාවනා වාසනාභාගෙ පවත්තං වාසනං භජාපෙතීති වාසනාභාගියං" යනු වචනාර්ථ බැවින් වාසනාභාගිය සූත්‍ර නම්වේ ශෛක්ෂශීලාදීන්ගේ විභාගයෙහි–

"සත්තියා විය ඔමට්ඨො-ඩය්හමානොව මත්ථකෙ
කාමරාගප්පහාණාය-සතො භික්ඛු පරිබ්බජෙ,,

යනාදී සූත්‍රාන්ත තෙමේ "නිබ්බිජ්ඣනං ලොභක්ඛන්ධාදිපදාලනං නිබ්බෙධො නිබ්බෙධභාගෙ පවත්තං නිබ්බෙධං භජාපෙතීතිවා නිබ්බෙධභාගියං,, යනු වචනාර්ථ බැවින් නිබ්බෙධභාගිය සූත්‍රනම්වේ අශෛක්ෂශීලස්කන්ධාදීන්ගේ විභාගයෙහි-

"යදා හවෙ පාතුභවන්ති ධම්මා-ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං-සූරියොව ඔභාසයමන්තලික්ඛං,,

යනාදී සූත්‍රාන්ත තෙමේ අශෛක්ෂභාගිය සූත්‍රනම්වේ මේ "පූජාච පූජනීයානං,, යන සූත්‍රාන්තපදය වනාහි පූර්වභාග කාමාවචර කුසල සංඛ්‍යාත පූජාවශයෙන් වාසනාභාගිය නම්වේ සෝවාන්ආදී ශෛක්ෂ ධර්මවශයෙන් නිබ්බෙධභාගිය නම්වේ අර්හත්ඵලයාගේ වශයෙන් අශෛක්ෂභාගිය නම්වේ මේ සියල්ල පිඩුකොට වාසනානිබ්බෙධභාගිය සූත්‍ර නමුදු වාසනාඅශෛක්ෂභාගිය සූත්‍රනමුදු නිබ්බෙධඅශෛක්ෂභාගිය සූත්‍රනමුදු වාසනානිබ්බෙධඅශෛක්ෂභාගිය සූත්‍රනමුදුවේ ඒ පූජාධර්ම යන් කාරණකොටගෙණ තෘෂ්ණාදිෂ්ටිදුශ්චරිත සංක්ලෙශධර්මයන් පිරිසි දුකරණ අර්ථයෙන් තෘෂ්ණාව්‍යවදානභාගිය සූත්‍රනමුදු දිෂ්ටිව්‍යවදානභාගිය සූත්‍රනමුදු දුශ්චරිතව්‍යවදානභාගිය සූත්‍රනමුදුවේ, මෙසේ සොළස ශාසනපට්ඨානයෙහි සූත්‍රදශයක් යෙදෙන්නේයි අටවිසි ශාසනපට්ඨානයෙහි වනාහි පරවචනසූත්‍රය සකපරවචනසූත්‍රය අවිස්සජ්ජනීයසූත්‍රය විස්සජ්ජනීයාවිස්සජ්ජනීයසූත්‍රය අකුශලසූත්‍රය කුශලාකුශලසූත්‍රය පටික්ඛිත්තසූත්‍රය අනුඤ්ඤාතපටික්ඛිත්තසූත්‍රය යනමේසූත්‍රඅටවර්ජිතකොට ඇත්තාවූ විංශතිප්‍රකාරසූත්‍රකෙණෙක් යෙදෙන්නාහුවෙත් ඔවුන් අතුරෙන් "බුද්ධාදීනංපන ගුණාධිට්ඨානවසෙන පවත්තං සුත්තං ථවොනාම,,යනු වචනාර්ථ බැවින් "මේ පූජාච පූජනීයානං,,යන්නෙන් පූජාභාජී පුද්ගලයන්ගේ පූජාභාජී ගුණයද පූජාකරන්නවුන්ගේ අනුප්‍රශාදදීවූ ගුණසමූහයෙන් සතුතිකිරීමද දක්නාගත්නාලද හෙයින් "ථව,, සූත්‍රනමුදුවේ, මේ ආදී ක්‍රමයෙන් වෛනෙයධ්‍යාශයන්ට සුදුසු පරිච්ඡෙදයන් සංක්ලෙශභාගියාදී ප්‍රභේදයෙන් දෙශනාවගේ පැවැත්ම ප්‍රකාශකරන්නාවූ සංවර්ණනා විශෙෂය "ශාසනපට්ඨාන,, නම්වේ.

## ශාසනපට්ඨානයයි.

---

මෙසේ මේ නෙත්තික්‍රමයෙහි ආවාවූ සොළසහාරය පංචවිධනය ශාසනපට්ඨානය යන සියළු අර්ථවර්ණනා ක්‍රමයන්ට බුද්ධශාසනයෙහි අතිශයප්‍රකටවූ "පූජාච පූජනීයානං,, යන සූත්‍රාන්තපදය උදාහරණ කළාක්මෙන් පිටකත්‍රයෙහි සියළු ධර්මපදයන්ම මේ ක්‍රමය ආශ්‍රයකොටගෙණ අර්ථවර්ණනාකටයුතුයි ශාසනාවචර කුලපුත්‍රයන්ට පළමුකොට ව්‍යාකරණහා තදනන්තරව අභිධර්මවිනයද උගත්වාකෙළවරට මේ නෙත්තිප්‍රදීපයෙන් පළමුකොට හාරාදීන්ගේ ක්‍රමය උගත්වා ඊටඅනතුරුව නෙත්තිප්‍රකරණය ඉගැන්විය යුතුයි

## හාරානුක්‍රමකාරණය.

මේ නෙත්තික්‍රමයෙහි හාරාදීන්ගේ අනුක්‍රමය කුමක්හෙයින් මෙසේ තබනලද්දේදයත්? දෙශණාහාරය වනාහි අනික් සංවර්ණනා විශෙෂයන්ටද විචයහාරාදීන්ටද ප්‍රතිෂ්ඨාධාර බැවින් පළමුකොට දෙශණාහාරය දක්වනලදී පදපුච්ඡාවිස්සජ්ජන පුබ්බාපරානුගීතින් හා සමග දෙශණාහාරපදාර්ථයන්ගේ සෙවීම සවභාවකොටඇති බැවින් ඊට අනතුරුව විචයද විචයහාරයෙන් සොයනලද අර්ථයන්ගේ යුක්තායුක්තිවිචාරණය කටයුතුබැවින් විචයටඅනතුරුව යුක්තියද යුක්තායුක්තවූ අර්ථයන්ගේ උත්පත්තිය අනුරූපකාරණයන්ගේ පරම්පරානිර්ධාරණලක්ෂණදක්වීමෙන් තැන්පත්කටයුතුහෙයින් යුක්තියට අනතුරුව පදස්ථානයද යුක්තායුක්තකාරණයන්ගේ පරම්පරාවෙන් ගන්නාලද ධර්මයන්ගෙන් නොකියනලද්දවූ ධර්මයන්ද එකලක්ෂණභාවයෙන් ගැණීමකටයුතුයයි දක්වනපිණිස පදස්ථානයට අනතුරුව ලක්ෂණයද අර්ථවශයෙන් නිර්ධාරණයකරණලද ධර්මයන්ගේ නිර්වනාදිය කියයුත්තේයයි දක්වනපිණිස ලක්ෂණයට අනතුරුව චතුබ්‍යූහයද මෙසේ ගත්කල්හි නිරවශෙෂ වශයෙන් අර්ථාවබොධය වෙයි යන බව දක්වනපිණිස චතුබ්‍යූහයට අනතුරුව ආවට්ටයද සභාග විසභාග ධර්මයන්ගේ ආවර්තනය කළකල්හි සාධාරණ අසාධාරණ වශයෙන් සංක්ලෙශවොදාන ධර්මයන්ගේ විභාගය පදස්ථානවශයෙන්ද භූමිවශයෙන්ද සුවසේ යෙදියහැකිවන බැවින් ආවට්ටයට අනතුරුව විභත්තියද සාවද්‍ය අනවද්‍ය ධර්මයන්ට සප්‍රතිභාගවශයෙන් ඒ ඒ ධර්මයන්ගේ විභාගය කළකල්හි සූත්‍රාගත ධර්මයන් නොදුකින්ම ප්‍රතිපක්ෂයන්කෙරෙන් පෙරලියහැකි බැවින් විභත්තියට අනතුරුව පරිවත්තනයද ප්‍රතිපක්ෂයන්කෙරෙන් පෙරලෙන ධර්මයෝද සූත්‍රයෙහි ආ වචනයන්ට අධිකවූ පර්යාය වචනයෙන් අවබොධකටයුතුයයි දක්වනපිණිස පරිවත්තනයට අනතුරුව වෙවචනයද පර්යාය වචනයෙන් ප්‍රකාශකරණලද ධර්මයන්ගේ ප්‍රභේදය ප්‍රඥප්තිවශයෙන් ප්‍රකාශකිරීමෙන් සුවසේ දැනගතහැකි බැවින් වෙවචනයට අනතුරුව පඤ්ඤත්තියද ප්‍රභවපරිඥාදී ප්‍රඥප්තිවිභාගමුඛයෙන් පටිච්චසමුප්පාදාදී ධර්මවිභාගයකළකල්හි සූත්‍රයෙහිආවාවූ ධර්මයන්ගේද පටිච්චසමුප්පාදාදීයෙහි බැසගැණීම දක්වියහැකිබැවින් ප්‍රඥප්තියට අනතුරුව ඔතරණයද ධාත්වායතනාදියෙහි බස්වනලද සූත්‍රපදපදාර්ථයන්ගේ පුච්ඡාරම්භ විශොධනය සුවසේ සම්පාදනයකළහැකි බැවින් ඔතරණයට අනතුරුව සොධනයද විශොධනය කරණලද සූත්‍රපදපදාර්ථයෙහි ලබ්භ්‍යමාන සාමාන්‍යවිශෙෂභාවය දැනගැණීම සුකරවනහෙයින් සොධනයට අනතුරුව අධිෂ්ඨානයද සාමාන්‍යවිශෙෂවූද සාධරණ අසාධාරණවූද ධර්මයන් දැනගත්කල්හි පරික්ඛාරසංඛ්‍යාත සාධාරණ රූපයාගේද ප්‍රත්‍යහෙතුරාශියගේද ප්‍රභේදය සුවිඥෙයවන බැවින් අධිෂ්ඨානයට අනතුරුව පරික්ඛාරයද භාවෙතබ්බ ප්‍රහාතබ්බ ධර්මයන්ගේ භාවනා ප්‍රහාණයන් නිර්ධාරණයකොට කීකල්හිම සූත්‍රාර්ථාවබොධය මොනවට වනහෙයින් පරික්ඛාරයට අනතුරුව සමාරොපනහාරයද දක්වනලදී මේ හාරයන්ගේ අනුක්‍රමයෙහි කාරණයයි.

හාරානුක්‍රමහෙතුවයි

නයපවසකයෙහි වනානි ත්‍රිවිධඅර්ථනය ත්‍රිවිධවිනෙයජනයන් සඳහා යොදනලද බැවින් ත්‍රිවිධවිනෙයජනයන්ගේ ක්‍රමයෙන්ම නන්දියාවර්තාදී අර්ථනයත්‍රයගේ ක්‍රමය දතයුතුයි. ඒ එසේමැයි උද්ඝටිතඥය විපඤ්චිතඥය නෙය්‍ය යන තුන්දෙන පිළිවෙළින් නන්දියාවර්තය ත්‍රිපුෂ්කලය සීහවික්කීළිතය යන නයත්‍රයට යෙදෙනබැවින් ඒ නයත්‍රය උද්දෙස නිද්දෙස පටිනිද්දෙසයන් මෙන් යථාක්‍රමයෙන් ඒ ත්‍රිවිධවිනෙයජනයන්ට උපකාරපිණිස පවතින් එහෙයින්ම ඒ නයත්‍රයට මූලපදයන් සතරක්ද සයක්ද අටක්ද දක්වනලද්දහුය අවශේෂනයවය වනානි අර්ථනයත්‍රයගේ නයභූමිය බැලීමද ඒ ඒ ධර්ම ඒ ඒ තැනට එළවීමද කොරෙත් මෙතෙක්ප්‍රකාරයෙන් සූත්‍රාර්ථය උද්ධරණයකල කල්හිම විනෙයජනයන්ගේ ප්‍රථමලොකොත්තරභූමි සංඛ්‍යාතවූ සොවාන්මාර්ගාධිගමය පිණිස පරතොඝොෂය ලැබෙන්නේයි-එහෙයින් කීක “දස්සනභූමිසමනුප්පාපනිඅත්ථොති නෙත්තිප්පකරණෙ දෙසනා,, යි එබැවින් නෙත්තිනය ආශ්‍රයනොකොට ධර්මදෙශනාකරන්නවුන්ගේ ධර්මය ඇසීමෙන් ධර්මසංඥාව ඉපදිමමුත් ධර්මාර්ථාවබොධයකොට මාර්ගාධිගමය පිණිස නොපවත්නේයි.

“අථඛො වා එතදත්ථාගබ්බනා සඞ්ඛෙපසං සුත්තස්ස සංවණ්ණනාවිසෙසානං එකතාලීසා හාරානං දස්සිතබ්බාකාරානං සුත්තස්ස සංවණ්ණනාවිසෙසා සබ්බෙ තෙ නෙත්තිඋපදෙසායත්තාති වුත්තොවායමත්ථො,, යනු නෙත්තිටුවා බැවින් මෙහි නොකියනලද්දාවූ යම්අර්ථසංවණ්ණනාවිශේෂ කෙනෙක් ඇත්තාහුනම් ඒ සියළුම අර්ථසංවණ්ණනාවෝ සොළසහාරයෙහිම ( හෙවත් ) විචයහාරය යුත්තිහාරය චතුව්‍යූහහාරය පරිවත්තනහාරය වෙවචනහාරයාගේ එකදෙශයෙකැයි යන කතිපයහාරයක සංග්‍රහවන බැවින් නොදක්වනලදී ඒ අර්ථසංවණ්ණනාවෝ කවරහුදයත්?

“සමුට්ඨානං පදත්ථොච-අනුවාදෙවිධිතථා
විරොධොච නිගමනං-සංවණ්ණනාවිදූ වදෙ.

පයොජනඤ්ච පිණ්ඩත්ථො අනුසන්ධිච චොදනා
පරිහාරොච සබ්බත්ථ සංවණ්ණනාවිදූ වදෙ,

උම්මුජ්ඣාතං පදංචෙව පදත්ථං පදවිග්ගහං
චොදනා පච්චුට්ඨානං සංවණ්ණනාවිදූ වදෙ

එකනාළිකා කථාච චතුරස්සා තථාපිච
නිසින්නවත්තිකාචෙව සංවණ්ණනාවිදූ වදෙ-

සද්දකථා තත්ථකථා පරියායකථා පිච
සංවණ්ණනාය තං සබ්බං සංවණ්ණනාවිදූ වදෙ-

සම්බන්ධොච පදංචෙව පදත්ථො පදවිග්ගහො
චොදනා පරිහාරොච ඡබ්බිධා සුත්තවණ්ණනා-

ආදිතො තස්ස නිදානං වත්තබ්බං තප්පයොජනං
පිණ්ඩත්ථොචෙව පදත්ථො සම්බන්ධො චාධිප්පායතො
චොදනා සොධනං චෙව වෙදිතබ්බා නයඤ්ඤුනාති,,

යනාදීන් ඒ ඒ තන්හි දක්වනලද්දවූ සංවණ්ණනා ක්‍රමයෝද දත යුත්තාහුය ඒ කවරහුදයත්? සූත්‍රයාගේ සමුට්ඨානයයි කියනලද ආධ්‍යාත්මික බාහිරනිදානයෝ කියයුත්තාහුය අනේකප්‍රකාරවූ අභිප්‍රේතාර්ථ අනභිප්‍රේතාර්ථ ප්‍රකෘත්‍යාර්ථ ප්‍රත්‍යයාර්ථ අභිප්‍රායාර්ථ සම්බන්ධාර්ථයෝ කියයුත්තාහුය ඊට අනතුරුව විධිසංඛ්‍යාත ප්‍රථමවචනය හා අර්ථප්‍රකාශකිරීමවශයෙන් පැවති අනුවාදසංඛ්‍යාත පච්ඡාවචනයද කියයුත්තේය. ( නොහොත් ) විශේෂණසංඛ්‍යාත විධියහා විශේෂ්‍ය සංඛ්‍යාත අනුවාදයද කියයුත්තේය ඊටඅනතුරුව අර්ථනිශ්චයකිරීම පිණිස කාරණලද චෝදනාසංඛ්‍යාත විරෝධය තැබියයුත්තේය ඊට අනතුරුව අනුසන්ධියට සුදුසු පරිච්ඡෙදන් නිගමනය කටයුත්තේය. මේ එක්තරා සංවණ්ණනාවිශේෂයෙකි.

තවද පළමුකොට දේශනාවගේ ඵලයයි කීයනලද ප්‍රයෝජනය කියයුත්තේය. ඒ ඵලය වනාහි ශ්‍රුතමයඥානාදියයි ඊටඅනතුරුව විප්‍රකීර්ණවශයෙන් කියනලද වචනයන්ගේ යනපත් අර්ථාවබෝධය පිණිස පිඩුකොට අභිප්‍රායකීම යයි කියනලද පිණ්ඩාර්ථය කියයුත්තේය ඊටඅනතුරුව පුච්ඡානුසන්ධිආදීවූ අනුසන්ධිය කියයුත්තේය. චෝදනාපරිහාරයෝ යටකියනලද්දහුමැයි. මේද එක්තරා අර්ථසංවණ්ණනා ක්‍රමයෙකි.

උම්මුග්ඝාතය යනු සූත්‍රයාගේ අධ්‍යාත්මිකබාහිර නිදාන දැක්වීමයි ඊටඅනතුරුව පදවිභාගයද පදාර්ථයද පදවිග්‍රහයද චෝදනාපරිහාරයෝද කියයුත්තාහුය මෙහි පරිහාරය "පච්චුපට්ඨාන,, ශබ්දයෙන් කියනලදී මේ ගාථාසයෙන් අර්ථවණ්ණනා ෂට්කලයක් හා පචකයක්ද දක්වනලදී. තවද ඒකනාලිකාය චතුරස්සාය නිසින්නවත්තිකාය යන කථාත්‍රයක්ද ඇතිවේ "එකාය නාළියා මිනිතාවිය වුත්තා කථා ඒකනාළිකා,, යනු වචනාර්ථ බැවින් එකනැළියකින් මනිනලද්දක් හුමෙන් අර්ථයන්ගේ කථනය ඒකනාලිකා නම්වේ ( නොහොත් ) පාලි පාඨය කියා එකෙකී පදයාගේ අර්ථකථනයකිරීම ඒකනාලිකා කථා නම්වේ. පාලත්‍රයාර්ථකථාවන්ගේ පදාර්ථසහිත කථනයයි.

"චතුභාගෙන වුත්තා චතුරස්සා,,යනු වචනාර්ථ බැවින් ප්‍රතිපක්ෂය දක්වා ප්‍රතිපක්ෂයට උපමා දක්වා සපක්ෂය දක්වා සපක්ෂයට උපමාදක්වා අර්ථකථනයකිරීම "චතුරස්සාකථා,, නම්වේ. "නිසීදපෙත්වා පතිට්ඨාපෙත්වා ආවත්තානයුත්තා නිසින්නවත්තිකා,, යනු වචනාර්ථබැවින් සභාගවිසභාගාර්ථයන්ගේ වශයෙන් වෙනවෙනම කෙළවර නොට අර්ථකථනයකිරීම "නිසින්නවත්තිකා,, නම්වේ. සාරාර්ථමඤ්ජූසායෙහි වනාහි "එකෙකං පදං නාළං මූලං එතිස්සාති ඒකනාලිකා,, "එකෙකෙනවා පදෙන නාලිකා අත්ථගමනා එතිස්සාති එකනාළිකා,, යන්නෙන්ද "චත්තාරො රස්සා සල්ලක්ඛණුපායා එතිස්සාති චතුරස්සා,, යනුයෙන්ද "නියමතො නිසින්නස්ස ආරද්ධස්ස වට්ටො සංවට්ටො එතිස්සාති නිසින්නවත්තිකා,, යනුයෙන්ද අර්ථදක්වා තිබේ, උදහරණසහිතවූ මේ ත්‍රිවිධ කථාවෝ අඞ්ගුත්තරඅට්ඨකථාවෙන් දතයුත්තාහුය.

තවද හෙදකථාවය තත්ත්වකථාවය පර්‍යායකථාවය යි කියාද ත්‍රිවිධ කථාකෙනෙක් වෙත් ඔව්හු කවරහුදයත් "බුජ්ඣතීති බුද්ධො,, යනාදීන් යම්ශබ්දයක්හුගේ ප්‍රකෘති ආදීන්ගේ විචාරණය හෙදකථා නම්වේ. "බුද්ධොති යො සො භගවා සයම්භූ අනාචරියකො,, යනාදී උදාහරණයෙහිමෙන් යම් ශබ්දයක්හුගේ ස්වරූපවිචාරණය "තත්ත්වකථා,, නම්වේ. "බුද්ධො භගවා සබ්බඤ්ඤූ ලොකනායකො,, යනාදීන් එකාර්ථයක් නොයෙක් පරිද්දෙන් පර්‍යායශබ්දයන්ගෙන් විචාරණය කිරීම පර්‍යායකථා නම්වේ. මෙසේ ත්‍රිවිධකථා ද්‍රකයක්ද ඇත්තේයි.

සම්බන්ධය පදය පදාර්ථය පදවිග්‍රහය චොදනාය පරිහාරය යන ස වැදෑරුම් සූත්‍රවර්ණනාවෝ න්‍යාසකාරයන් විසින් ව්‍යාකරණසූත්‍රාර්ථ දැක්වීමපිණිස න්‍යාසටීකාවෙහි කියනලද පරිද්දෙන් තවාබගශාසනා ශාසනසංඛ්‍යාත සූත්‍රාර්ථවර්ණනාවටද එළවියයුතුයි. එපරිද්දෙන් පළමුකොට සූත්‍රයාගේ ආධ්‍යාත්මිකබාහිර නිදානය කියයුත්තේය ඊට අනතුරුව ශ්‍රාතමයඥණාදී ප්‍රයොජනය කියයුත්තේය, ඊට අනතුරුව ක්‍රමයෙන් පිණ්ඩාර්ථය පදාර්ථය සම්බන්ධය අභිප්‍රාය චොදනාය සොධනය යන අෂ්ටප්‍රකාර අර්ථවර්ණනාවද සොළසහාරයෙහි කීනයින් දතයුතුයි

තවද වාදාදීන්ගේ හා ත්‍රයස්ත්‍රිංශත්තන්ත්‍රයුක්තීන්ගේද වශයෙනුත් සුදුසු පරිද්දෙන් සූත්‍රාර්ථය සෙවියයුත්තේයි. හේ කෙසේදයත්? වාදය ජල්පය විතණ්ඩයයි අතිකුදු වාදකථාවෝ තුන්දෙනෙක්වෙත් ඔවුන් අතුරෙන් යම් වාදයක් කාරණකොටගෙණ ප්‍රමාණවූ තර්කයන්ගෙන් පක්ෂප්‍රතිපක්ෂයන්ගේ පිහිටුවීම හා ප්‍රතික්ෂෙපයත්වේද්ද හේ වාදනම් වේ. සමානාධිකරණවූ හෙවත් එකම ආධාරයෙකපිහිටියාවූ අන්‍යොන්‍ය විරුද්ධ ධර්මයෝම පක්ෂප්‍රතිපක්ෂනම්වෙත් "හොතිතථාගතො පරම්මරණා නහොති තථාගතො පරම්මරණා,, යනු ඊට උදාහරණයි භින්නාධිකරණවූ හෙවත් වෙනස්ආධාර ඇත්තාවූ ධර්මයෝ දෙදෙනෙක් අන්‍යොන්‍ය විරුද්ධවූවාහුදු පක්ෂප්‍රතිපක්ෂනම් නොවෙත් "අනිච්චං රූපං නිච්චං නිබ්බානං,, යනු ඊට උදාහරණයි. එහෙයින් එකම ආධාරයෙක පවත්නා ධර්මයෝ දෙදෙනෙක් ඔවුනොවුන්ට විරුද්ධවූවාහු නම් ඒ ධර්මයෝ දෙදෙනම පක්ෂප්‍රතිපක්ෂ නම්වෙත්.

යම් වාදයක් කාරණකොටගෙන ජල්පජල්පන්ට නිග්‍රහකටයුතුකාරණයන්ගෙන් පක්ෂප්‍රතිපක්ෂයන්ගේ පිහිටුවාලීමට හා ප්‍රතික්ෂෙපය ටත් කරනනාවූ යම් ආරම්භයක් ඇද්ද ඒ ආරම්භය ජල්පනම්වේ. මෙහි වාදාරම්භමාත්‍රයක්ම ජල්පනම්වේ. අර්ථසිද්ධිය නොවෙයි යනු දක්වන පිණිස ආරම්භග්‍රහණයකොළේයි. යම්කථාවක් කාරණකොටගෙණ ජල්පජල්පන්ට නිග්‍රහකටයුතු කාරණයන්ගෙන් ප්‍රතිපක්ෂයන්ගේ ප්‍රතික්ෂෙපය පිණිස උත්සාහකෙරෙද්ද ඒ විතණ්ඩකථා නම්වේ. ජල්පය යනු ඒ ඒ තන්හි විකල්ප එළවීමෙන් වචනවිඝාතනය කරන්නාවූ වාදීන්ට නාමෙකි.

තවද ප්‍රතිඥය හෙතුය දෘෂ්ටාන්තය උපනයනය නිගමනය යන අවයව ලක්ෂණ පඤ්චකයකින් වාක්‍යය යුක්තවේ. ඔවුන් අතුරෙහි සාධනීය නිර්දේශය ප්‍රතිඥා නම්වේ. මෙහි වහ්නිය සාධනීය නිර්දේශයයි සාධන නිර්දේශය ධූමය ඇතිබැවින් හෙතුවෙයි යම්තැනෙක්හි සාධනීය සාධන නිර්දේශයන්ගේ එක්ව පවත්නා ස්වභාව කරුණයක්වේද ඒ දෘෂ්ටාන්තයයි.

යම්සේ මුළුතැන්ගෙහි යම් තැනෙක ධූමය ඇත්තේවේද එහි වහ්නිය ඇත්තේවේ දක්නාලද සාධනය සාධනීය ධර්මයෙහි එලවීම උපනයන නම්වේ. මෙහි ධූමයද ඇත්තේවෙයි, ප්‍රතිඥාව නැවතකීම නිගමන නම්වේ. එහෙයින් මෙහි වහ්නිය ඇත්තේවේ මේ සියල්ල පිඩුකොට මෙසේ දතයුතුයි. ධූමය ඇතිබැවින් මෙහි වහ්නිය ඇත්තේවේ යම්සේ මුළුතැන්ගෙහි යම්තැනෙක ධූමය ඇත්තේවේද එහි වහ්නිය ඇත්තේවේ මෙහි ධූමය ඇත්තේවේද එහෙයින් එහි වහ්නිය ඇත්තේවේ.

## වාක්‍යාවයවපඤ්චකයයි.

ත්‍රයස්ත්‍රිංශත් තන්ත්‍රයුක්තිහු කවරයත්? අධිකරණය, යොගය, පදාර්ථය, හෙත්වර්ථය, උද්දෙශය, නිර්දේශය, උපදෙශය, අපදෙශය, ප්‍රදෙශය, අතිදෙශය, අපවර්ගය, වාක්‍යශෙෂය, අර්ථාපත්තිය, විපර්‍ය්‍යාසය, ප්‍රසංගය, ඒකාන්තය, අනෛකාන්තය, පූර්වපක්ෂය, නිර්ණය, අනුමතය, විධානය, අනාගතාවෙක්ෂණය, අතීතාවෙක්ෂණය, සංශය, ව්‍යාඛ්‍යානය, අන්‍යාසංඥය, ස්වසංඥය, නිර්වචනය, නිදර්ශනය, නියොගය, විකල්පය, සමුච්චය, ඌහනීය, යනමේ තෙතිස ත්‍රයස්ත්‍රිංශත් තන්ත්‍රයුක්තිහු නම්වෙත්? වාක්‍යයොජනාව හා අර්ථයොජනාවද මේ තන්ත්‍රයුක්තීන්ගේ ප්‍රයොජනයි මේ තන්ත්‍රයුක්තීන් නොදත් තැනැත්තේ වාක්‍යයාගේ හෝ වාක්‍යාර්ථයාගේ යෙදීමෙහි පොහොසත් නොවේ. මෙ තන්ත්‍රිකාගත ත්‍රයස්ත්‍රිංශත් තන්ත්‍රයුක්තිහු ලෞකිකයන් අතුරෙහිදු ව්‍යවහාරකරත්.. *

---

* “අසද්වාදිප්‍රයුක්තානාං - වාක්‍යානාං ප්‍රතිෂෙධනං
ස්වවාක්‍යසිද්ධිරපිච – ක්‍රියතෙ තන්ත්‍රයුක්තිතඃ –
ව්‍යක්තානොක්තාශ්ච යෙහ්‍යර්ථා – ලීනා යෙචාප්‍යනිර්මලාඃ.
ලෙශොක්තාශ්ච ස්වර්තාන්ත්‍ර - තෙෂාංචාපි ප්‍රසාධනං
යථාම්බුජවනස්‍යාර්කඃ ප්‍රදීපො වෙශ්මනො යථා
ප්‍රබොධස්‍ය ප්‍රකාශාර්ථාස්තථා තන්ත්‍රස්‍ය යුක්තයඃ,,

දුර්වාදීන් විසින් යොදනලද දුර්වාක්‍යයන්ගේ වැළැක්වීමද ස්වකීය වූ යහපත් වාක්‍යයන්ගේ සිද්ධියද මේ තන්ත්‍රයුක්තීන්ගෙන් කරණු ලැබේ. යම් අර්ථකෙනෙක් ව්‍යක්තකොට නොකියනලද්දාහුද සැඟවුනාහුද යම් අර්ථකෙණෙක් නොපිරිසිදුවූවාහුද ඒ සියළු අර්ථයෝ ප්‍රකාශකරන්නාහුත් පිරිසිදුකරන්නාහුවෙති යම් ග්‍රන්ථයෙක්හි යම් පදාර්ථකෙණෙක් සංක්ෂෙපයෙන කියනලද්දාහු ඒ අර්ථයන්ගේද සැරසීම කරන්නාහුය පියුම්වනයට සූර්‍ය්‍යයාමෙන්ද ගෘහයට ප්‍රදීපයමෙන්ද මේ තන්ත්‍රයුක්තීහු සියළුඅර්ථ ප්‍රකාශකරන්නාහු වෙත් (සුශ්‍රැත)

ස්කන්ධධාතු ආයතනාදි යම් අර්ථයක් අධිපතිකොටගෙණ කි
යනුලැබේද ඒ අධිකරණයයි. පූර්වාපර සන්නිහිතාසන්නිහිත වශ
යෙන් දුරස්ථානවූද පදයන්ගේ අර්ථයට සුදුසුපරිද්දෙන් යෙදීම යෝ
ගනම්වේ "පූජනීයානං පූජා උත්තමං මඞ්ගලං,, යනාදියයි සූත්‍රයෙහි
ගෝ පදයෙහි සෝ පූර්වාපරවශයෙන් කියනලද අනේකප්‍රකාරාර්ථය
පදාර්ථයි අන්‍යාර්ථසාධකවූ අන්තැනෙක්හි කියනලද හෙතුව අභිප්‍රෙ
තාර්ථසිද්ධිය පිණිස එළවීම හෙත්වර්ථයි සංක්ෂෙපවචනය උද්දෙසයි
විස්තාරවචනය නිර්දෙශයි "එවං තථා,, යනාදින් දක්වනලද්ද උපදෙශයි
"අනේකකාරණෙන,, යනුවෙන් දක්වනලද්ද අපදෙශයි යම්දක්ව
නලද අතික්‍රාන්තාර්ථවචනයකින් ප්‍රකෘතිය සිද්ධකිරීම ප්‍රතිදෙශනාම් ම
තුකියනුලබන අනාගතවචනයකින් ප්‍රකෘතිය සිද්ධකිරීම අතිදෙශ
යයි අභිව්‍යාපනයකොට අර්ථයපහලකිරීම අපවර්ගයි වාක්‍යයෙහි නො
කියනලද පදයක් එළවා ගම්‍යමාන අර්ථපරිසමාප්තියකිරීම වාක්‍ය
ශෙෂයි පාරිශෙෂ යනුද ඊටම පර්යායයි කීර්තනය නොකරණලද යම්
අර්ථයක් අර්ථවශයෙන් ලැබේද ඒ අර්ථාපත්තියයි යම්තැනෙක කිය
නලද අර්ථයට ප්‍රතිවිරුද්ධවූ යම් අර්ථයක්වේද ඒ විපර්යායයි ප්‍රකර
ණාන්තරයකින් සමානවූ අර්ථයාගේ පැමිණීම ප්‍රසඞ්ගයි යම් අර්ථයක්
සියළුතන්හි අවධාරණයෙන් කියනලද්ද ඒ ඒකාන්තයි යම්අර්ථයක්
කිසිතැනෙක එපරිද්දෙනුත් කිසිතැනෙක අන්පරිද්දෙනුත් වේද ඒ
අනෛකාන්තයි ශ්‍රොතෘජනයාට සැකඋපදවන්නාවූ "කථඤ්ච භික්ඛ
වෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති,, යනාදි යම් කථෙතුකම්‍යතා
පෘච්ඡාවක් වේද ඒ පූර්වපක්ෂනාම් "ඉධ භික්ඛවෙ භික්ඛු,, යනාදින් ප
ටන්ගෙණ ඊට දෙන්නාවූ ප්‍රතිඋත්තරය නිර්ණය නාම්වේ ප්‍රතිෂෙධ
නොකරණලද ඝොසාඝොසසංඥාදියවැනි පරමතය අනුමතනාම්වේ.
ප්‍රකරණානුපූර්වියයි කියනලද තබනලද උද්දෙශපිළිවෙළින් නිර්දෙශය
කිරීම විධානනාම් "එවං වක්ඛාමි වක්ඛති ආවිභවිස්සති,, යනාදින්
නොකියනලද අර්ථයක් පෙන්වීම අනාගතාවෙක්ෂණනාම් "සෙසං
වුත්තනයමෙව,, යනාදින් පටකියනලද අර්ථයක් නැවත පෙන්වීම අ
තීතාවෙක්ෂණනාම් එකම අර්ථයකට හෙතු දෙදෙනෙකුගේ දැක්වීම
සංශයනාම් අර්ථයන්ගේ අතිශයවර්ණනාව ව්‍යාඛ්‍යානනාම් ලෞකික
යන්ට සාධාරණවූ දෙවමනුෂ්‍යාදි සංඥාවෝ අන්‍යසංඥනාම් චතුස්ස
ත්‍යාදි ලෞකිකයන්ට අසාධාරණවූ සංඥාවෝ ස්වසංඥනාම් ලොකප්‍ර
සිද්ධිය දැක්වීම උදාහරණනාම් "බුජ්ඣතීති බුද්ධො,, යනාදින් නිශ්චිත කා
රණලද වචනය නිර්වචනනාම් යම්තැනෙක දෘෂ්ටාන්තයෙන් අර්ථසාධ

නාශකෙරේද ඒ නිදර්ශනනම් ‘‘ඉදමෙව,, යනුවෙන් මෙබඳු දෙයක්ම කටයුතුයයි අවධාරණයෙන් නියමකිරීම නියොගනම් ‘‘ඉදංවා,, යන්නෙන් ප්‍රකාරාන්තරයක් දක්වීම විකල්පනම් ‘‘ඉදඤ්චිදඤ්ච,, යනාදීන් අන්‍යයන්ගේ පිඩුකිරීම සමුච්චයනම් වාක්‍යයෙහි නොදක්වන ලද නුවණින්ගතයුතුඅර්ථය ඌහනීය නම්වේ. යම්සේ දුඃඛාදිචතුස්සත්‍යයන් අතුරෙන් ප්‍රවෘත්තිනිවෘත්තිලක්ෂණවූ දුඃඛනිරොධසත්‍යවය වදාළකල්හි තදුභයහෙතුවූ සමුදය මාර්ග සත්‍යවය නුවණින් කල්පනා කටයුතුවේද ඒ ඌහනීයයි දතයුතුයි. මේ ත්‍රයස්ත්‍රිංශත් තන්ත්‍රයුක්තීහු නම්වෙත්-

මෙසේමේ නෙත්තිප්‍රකරණ පෙටකොපදෙශ යන ප්‍රකරණවලයෙහි ආයුෂ්මත් මහාකාත්‍යායනස්ථවිරයන්වහන්සේ විසින් ෂොළසහාරය පඤ්චවිධනය සාසනපට්ඨානය යන තුන හාරවිභඞ්ගවාර හාරසම්පාතවාරාදීන්ගේ වශයෙන් වදාරණලදි.

තදර්ථකථාචාර්යවූ බදරතිත්ථ ධම්මපාල මහාසාමිපාදයන් විසින් නයමුඛවශයෙන් සූත්‍රසමුත්ථානය ආදිකොටඇති පර්යායකථාව කෙළවර කොට ඇත්තාවූ සංවර්ණනා විශෙෂයෝ දක්වනලදී එම අටුවායෙහි ‘‘හෙදකථා තත්ථකථා පරියායවචනෙන හි සුත්තං සංවණ්ණෙතබ්බන්තිච එවමාදයො තෙසම්පි එත්ථෙව අවරොධො යස්මා තෙ ඉධ කතිපයහාරසංගහිතාති,, යන පාඨයෙහි ආදිශබ්දයෙන් සම්බන්ධය ආදිකොටඇති ත්‍රයස්ත්‍රිංශත් තන්ත්‍රයුක්තීන් අවසන්කොට ඇත්තාවූ සංවර්ණනාවිශෙෂයෝ ටීකාචාර්යයන් විසින් දක්වනලද්දාහුය ඒ පාලිමුක්තාවූ අර්ථකථාගත සියළු සංවර්ණනාවෝ ‘‘කතිපයෙහෙව විචය යුත්ති චතුබ්‍යූහපරිවත්තන වෙවචනහාරෙකදෙසෙහිපි සඞ්ගහිතා,, යනුවෙන් විචයහාරය යුක්තිහාරය චතුබ්‍යූහහාරය පරිවත්තනහාරය වෙවචනහාරයාගේ එකදෙශයෙක යන හාරපඤ්චකයෙක්හි සංග්‍රහකරණලද්දාහුයයි දතයුතුයි. නෙත්තිප්‍රකරණ පෙටකොපදෙශ අර්ථකථාටීකාගත සියළු සංවර්ණනාක්‍රමයන් මෙහි සැකෙවින් සඞ්ගෘහීත බැවින් මේ නෙත්තිප්‍රදීපය අනුත්තානාර්ථ සංග්‍රහයෙකැයි දතයුතුයි.

**නෙත්තිප්‍රදීපය නිමි.**

ශුභමස්තු

# සොළසහාරනය ගාථාසන්නය

(1) (අස්සාදෙ ආදීනවතා යනු පදච්ඡේදයි.) අස්සාදෙ, සුඛ වේදනා සෞමනස් වේදනා සංඛ්‍යාත ආශ්වාදයද; ආදීනවතා, තුන් වැදෑරුම් දුඃඛ (හෙවත් ජාත්‍යාදී දෙසාළිස් ප්‍රකාර දුඃඛ) සංඛ්‍යාත ආදීනවයද; නිස්සරණං, ආර්‍ය්‍ය මාර්ගය හෝ නිර්‍වාණ සංඛ්‍යාත නිස්සරණයද (පිශබ්දය පූර්‍වපශ්චිමපදයන්ගේ සම්පිණ්ඩනයකෙරේ) ඵලං; දේශනා ඵලයද; උපායොච (ආර්‍ය්‍යමාර්ගයට ආසන්නකාරණවූ පූර්‍ව භාග ප්‍රතිපදා සංඛ්‍යාත) අධිගම උපායද; භගවතො, භාග්‍යවත්හුගේ; යොගීනං, විනෙය ජනයන්ට (අර්ත්‍ථාය යනු පාඨශෙෂයි) වැඩපිණිස; ආණත්තිච (මෙසේ පිළිපදුවයි කාරණ) විධානයද; දෙසනාහාරො (යථොක්ත මේ ආශ්වාදදීන්ගේ බෙදීම ලක්‍ෂණකොට ඇත්තාවූ සංවර්‍ණනා විශෙෂය) දෙශනාහාර නම්වේ.

**දෙසනාහාරයයි.**

(2) සුත්තස්ස, සූත්‍රයාගේ; යංපුච්ඡිතංච (යාපුච්ඡාසී ලිඞ්ගවිපරිණාමයවේ) යම් පුච්ඡාවක් (විචයමානා යනු පාඨශෙෂයි) සොයනු ලබන්නීවේද; යංවිස්සජ්ජිතංච (යා විස්සජ්ජනායි ලිඞ්ග විපරිණාමය වේ) (ඒකංස ව්‍යාකරණාදිවශයෙන්) යම් විසඳීමක් සොයනු ලබන්නීවේද (සම්පිණ්ඩනාර්ත්‍ථයෙහිවූ ච ශබ්දයෙන් ගාථාවෙහි නොකියනලද්දවූ පද විචය පුබ්බාපර විචය යන අර්ත්‍ථය සංග්‍රහකෙරේ) යාච අනුගීති, පුච්ඡාවට සුදුසුවූ යම් සංග්‍රහ ගාථාවක්වේද; සා, ඒ අනුගීතිතොමෝ (සෙවීමද) සුත්තස්ස, සූත්‍රයාගේ; යොපවිචයො (දෙශනාහාරයෙහි කී ආශ්වාදදී සවැදෑරුම් අර්ත්‍ථයන්ගේ) යම් සෙවීමක්වේද; සො, ඒ අර්ත්‍ථ සෙවීමද; විචයො හාරොති (යථොක්ත ඒකාදශාර්ත්‍ථයන් සෙවීම ලක්‍ෂණකොට ඇත්තාවූ) විචයහාරයයි; නිද්දිට්ඨො, දක්වනලද්දේයි.

**විචයහාරයයි.**

(3) සබ්බහාරානං, සියළු සොළස හාරයන්ට; යා, යම් ව්‍යඤ්ජන යුක්තියක් තොමෝ; භූමි, ප්‍රවෘත්ති ස්ථානවීද; තෙසං, ඒ සොළස හාරයන්ට; යො, යම් සූත්‍රාර්ත්‍ථයක් තෙම; ගොචරො, ගොචරවේද; යුත්තායුත්ති පරික්ඛා (ඒ සභාව නිරුක්ති සංඛ්‍යාත) යුක්තිය හා (අසභාව නිරුක්ති සංඛ්‍යාත) අයුක්තියද (හෙවත් සතරමහාප්‍රදෙශය හා යෙදීම නොයෙදීම) පරීක්‍ෂාකරන්නාවූ; හාරො, හාරතෙමේ; යුත්තීති නිද්දිට්ඨො (සූත්‍රයෙහි ආ ව්‍යඤ්ජනාර්ත්‍ථයන්ගේ යුක්තා යුක්තිය සෙවීම ලක්‍ෂණකොට ඇත්තාවූ) යුක්තිහාරයයී දක්වනලද්දේයි.

**යුක්තිහාරයයි.**

(4) ධම්මංකඤ්චි (සූත්‍රාගත) යම් කිසි කුශලාදි ධර්‍මයක්වේද; තස්ස ධම්මස්ස, යථොක්ත කුශලාදිධර්‍මයට; යං පදට්ඨානං (සූත්‍රයෙහි ආවාවූ හෝ නො ආවාවූ හෝ යොනිසොමනසිකාරාදි) යම් ආසන්නකාරණ

යක්වේද; තං, ඒ ආසන්නකාරණයද; ජිනො, පස්මරුත්දිනු භගවත් තෙමේ; දෙසෙති, ප්‍රකාශකෙරේද; ඉති, මෙසේ (කියනලද නයින්) යාව සබ්බධම්මා, යම්තාක් ඒ සූත්‍රයෙහි ආවාවූ ධර්මයෝ වෙද්ද ඒතාක් සුදුසු පරිද්දෙන් ඒ සියළු ධර්මයන්ගේ ආසන්නකාරණයෝ උද්ධරණය කොට කියයුත්තාහුය (නොහොත්) යාව සබ්බධම්මා, සූත්‍රාගත ධර්මයට යමක් ආසන්නකාරණ වේද ඊට තවත් ධර්මයක් ආසන්නකාරණවේද මෙසේ සම්භව වන පරිද්දෙන් මාර්ගඵල ප්‍රත්‍යවෙක්‍ෂා ඥානයදක්වා (සියළු ධර්මයන්ගේ පදට්ඨාන විචාරණය කටයුතුය යන අර්ථයි) එසො හාරෙ, මේ ආසන්න කාරණයන් සොයන්නාවූ හාරතෙම; පදට්ඨානො, පදට්ඨාන හාරනම්වේ.

## පදට්ඨාන හාරයයි.

(5) එක ධම්මෙ (කුශලාදි යම්කිසි) එක්තරා ධර්මයක්; වුත්තම්හි (ස්වරූපවශයෙන් හෝ නිර්ධාරණවශයෙන් හෝ) කියනලද කල්හි; යෙකෙචි ධම්මා, යම්කිසි ධර්මකොනෙක්; එකලක්ඛණා (කුශලාදිභාව යෙන් හෝ ස්කන්ධාදි භාවයෙන් හෝ ඒ ධර්මය හා) සමාන ලක්‍ෂණ ඇත්තාහුවෙද්ද (හෙවත් එක්ව හැසිරෙන්නාවූ සමාන කෘත්‍ය සමාන හෙතු සමාන ඵල සමාන අරමුණු ඇත්තාහුවෙද්ද) සබ්බෙ (ඒ) සියළු (කුශලාදි) ධර්මයෝ; වුත්තා භවන්ති (සූත්‍රයෙහි නොකියනලද්දාහුද සමාන ලක්‍ෂණත්වයෙන්) කියන ලද්දාහුවෙත්; සොහාරො (මෙසේ සූත්‍ර යෙහි නො ආ ධර්මයන්ද උක්ත ප්‍රකාරයෙන් ආවුන්මෙන් නිර්ධාරණය කොට අර්ථවර්ණනාකිරීම ලක්‍ෂණකොට ඇත්තාවූ ඒ හාරතෙමේ; ලක්ඛණොනාම, ලක්‍ෂණ (හාර) නම්වේ.

## ලක්ඛණ හාරයයි.

(6) බ්‍යජනං (බ්‍යජනෙන) බ්‍යජනය කරණකොටගෙණ (කාර ණාර්ථයෙහි පච්චත්තවචනයි) නෙරුත්තං, නිරුක්තියයි කියනලද පද නිර්වචන සංඛ්‍යාත විග්‍රහයද; අධිප්පායො, (බුද්ධානු බුද්ධාදි ධර්මදෙශකයන්ගේ) අභිප්‍රායද; අථ, නැවත; දෙසනානි දානංච, දෙශනා ප්‍රවෘත්ති නිමිත්තවූ අධ්‍යාත්මික බාහිර නිදානයද; පුබ්බා පරානුසන්ධි (සූත්‍රයාගේ) පූර්වභාගය හා අපරභාගය ගළපා කීමද (යන) එසො හා රෙ (මෙසේ නිර්වචනාදි සතර අර්ථයන් ප්‍රකාශකිරීම ලක්‍ෂණකොට ඇති) මේ හාරතෙමේ; චතුබ්‍යූහො, චතුබ්‍යූහ හාරනම්වෙ.

## චතුබ්‍යූහහාරයයි.

(7) එකම්හි පදට්ඨානෙ (පරක්කම ධාත්වාදීන්ට ආසන්න කාර ණවූ ආරම්භ ධාත්වාදි) එක් ධර්මයක් දෙශනාරූඪකළකල්හි; සෙසකං පදට්ඨානං (ඒ ධර්මයන්ට විසභාගත්වයෙන් නොගැණීම්වශයෙන් හෝ අවශෙෂවූ ප්‍රමාදදීන්ට ආසන්නකාරණහෙයින් පදට්ඨානවූ කෞසජ්ජාදි ධර්මාන්තරයක්, පරියෙසති, ප්‍රඥවෙන් ගවෙසනයකෙරේද (පර්යෙෂණයකොටද සංවර්ණනාවෙහි යොදමින් දෙශනාවට පෙරළාද) පටි පක්ඛෙ (වීර්‍ය්‍යාරම්භාදි මුඛයෙන් ආරබ්ධ සූත්‍රයෙහි කියනලද ක්‍රම යෙන් ප්‍රමාදදින්ගේ වශයෙන් ප්‍රකාශකරමින්) ප්‍රතිපක්‍ෂ ධර්මයන්; ආවට්ටෙති, පෙරළා දෙශනාකෙරේද; සොහාරො (දෙශනාවෙන් ගත්

නාලද ධර්‍ම සභාග විසභාග ධර්‍මයන්ගේ වශයෙන් ආවර්‍තනයකිරීම ලක්‍ෂණකොට ඇත්තාවූ) ඒ හාරතෙමේ; ආවට්ටො නාම, ආවට්ටහාර නම්වේ..........

## ආවට්ටහාරයයි.

(8) සාධාරණෙ (දර්‍ශන ප්‍රහාතව්‍යාදිනම් වශයෙන් හෝ පෘථග් ජන සෝවාන් ආදී වස්තුවශයෙන් හෝ) සාධාරණවශයෙන්ද; අසාධාරණෙච (ඊට විපරීතවූ) අසාධාරණවශයෙන්ද (පඤ්චම්‍යාර්‍ථයෙහි විතීයා බහුවචනයි) ධම්මං, කුශලාදීනන් වැදෑරුම් ස්වභාව ධර්‍මය (වශබ්දයෙන් තවත් "ධම්ම,, ශබ්දයක් සම්පිණ්ඩනයකෙරේ) ධම්මං, ධර්‍මවශයෙන්ද; පදට්ඨානං, ආසන්නකාරණවශයෙන්ද; භූමිඤ්ච (පෘථග්ජන සෝවාන් ආදි) භූමිවශයෙන්ද (පඤ්චම්‍යාර්‍ථයෙහි විතීයා ඒක වචනයි) විභජ්ජතෙ, විභාගකරණුලැබේද; අයං හාරො, මේ හාර තෙමේ; විභත්තිහාරොති, විභත්තිහාරයයි; නෙය්‍යො, දතයුත්තේයි..........

## විභත්තිහාරයයි.

(9) නිද්දිට්ඨෙ, ප්‍රකාශකරණලද්දාවූ (හෙවත් සූත්‍රයෙහි ආවාවූ හෝ සංවර්‍ණනාකරණලද්දාවූ හෝ) භාවිතෙ, වැඩියයුතුවූද; කුසලාකුසලෙ ධම්මෙ, කුශලා කුශල ධර්‍මයන්; පටිපක්ඛෙ පරිවත්තති, කියන ලද ධර්‍මයන්ට ප්‍රතිපක්‍ෂ ධර්‍මයන්ගේ වශයෙන් පරිවර්‍තනය කෙරේද; (පව්‍යාර්‍ථයෙහි විතීයා බහුවචනයි) හාරො, මේ හාරතෙමේ; පරිවත්තනො නාම (නිර්දිෂ්ට ධර්‍මයන්ට ප්‍රතිපක්‍ෂ ධර්‍මයන්ගේ වශයෙන් පෙරළා දෙශනාකිරීම ලක්‍ෂණකොට ඇත්තාවූ) පරිවර්‍තනහාරයයි දත යුතුයි..........

## පරිවත්තනහාරයයි.

(10) යොසුත්තවිදූ, යම් සූත්‍රාර්‍ථවේදී ධර්‍මකථිකයෙක්තෙමේ; එකධම්මස්ස, එක් පදාර්‍ථයක්හුගේ; සුත්තෙවුත්තානිතු, නවාඞ්ග ශාස්තෘ ශාසන සංඛ්‍යාත පිටකත්‍රයෙහි දෙශනාකරණ ලද්දාවූ (අවධාරණයෙහි තුශබ්දය වෙහිද ආවර්‍තනය කෙරේ එයින් සූත්‍රයෙහි නො ආ පර්‍ය්‍යාය ශබ්දයන් බැහැරකෙරේ) බහුනිතු, අනෙක ප්‍රකාරවූ; වෙවචනානි (එකම අර්‍ථයෙහි පවත්නා) විවිධ වචනයෝ (හෙවත් පර්‍ය්‍යාය ශබ්දයෝ) ජානාති, දනීද (හෙවත් "සප්පිස්ස ජානාති,, කීකල්හි "සප්පිනා විචාරෙති,, "සප්පිදෙති,, "සප්පිදෙථ,, "සප්පි ආණාපෙති,, යනාදි සියළු අර්‍ථයන් දනීද) සොහාරො, ඒ හාරතෙමේ; වෙවචනො නාම (එකාර්‍ථයෙහි අනෙක පර්‍ය්‍යාය ශබ්දයන් යෙදීම ලක්‍ෂණකොට ඇත්තාවූ) වෙවචන හාරනමැයි දතයුතුයි..........

## වෙවචනහාරයයි.

(11) භගවා, භාග්‍යවත්තෙමේ; එකං ධම්මං (ස්කන්ධාදි) එක් ධර්‍මයක්; විවිධෙහි, (නිඃක්‍ෂෙප ප්‍රභවාදිවශයෙන්) අනෙක ප්‍රකාරවූ; පණ්ණත්තීහි, ප්‍රඥප්තීන් කරණකොටගෙණ (ප්‍රකාරයෙන් හැඟවීමෙන් හෙවත් අසංකරවශයෙන් තැබීමෙන්) දෙසෙති, දෙශනාකෙරේද; සො ආකාරො, ඒ (එකාර්‍ථයක්හුගේ නිඃක්‍ෂෙප ප්‍රභව ප්‍රඥප්ති ආදි

වශයෙන්) නොයෙක් ප්‍රඥප්තියෙන් හඟවන ආකාර ඇත්තාවූ; සොහාරො, ඒ හාරතෙමේ; පණ්ණත්තිනාම, එකෙකි ධර්‍මයක් නොයෙක් ප්‍රඥප්තියෙන් පැණවියයුතු ආකාර ප්‍රකාශකිරීම ලක්‍ෂණකොට ඇති හෙයින් ප්‍රඥප්ති හාරයයි; නෙය්‍යො, දතයුතුයි

**පඤ්ඤත්තිහාරයයි.**

---

(12) යොච පටිච්චුප්පාදො, යම් ද්වාදශ පදික ප්‍රත්‍යයාකාරයක් වේද; යෙච ඉන්‍ද්‍රිය බද්ධා, යම් දෙවිසි ඉන්‍ද්‍රිය ධර්‍මකෙනෙක් හා පඤ්චස්කන්ධකෙනෙක්වෙද්ද; යාවධාතු ආයතනා, යම් අෂ්ටාරස ධාතුකෙනෙක් හා දොළොස් ආයතනකෙනෙක් වෙද්ද. (චශබ්දය සම්පිණ්ඩනාර්ථයි) එතෙහි (සූත්‍රයෙහි ආවාවූ පදාර්ථ මුඛයෙන් නිර්ධාරණය කරණු ලබන්නාවූ) මේ ධර්‍මයන් කරණකොටගෙණ; යො, යම් අර්ථ වර්ණනා ක්‍රමයක්තෙම, ඔතරති, බැසගන්නේවේද (හෙවත් ප්‍රතීත්‍ය සමුත්පාදාදි ධර්‍මයෙහි ප්‍රවිෂ්ටවේද) සොහාරො, යථොක්ත සංවර්ණනාත්මකවූ හාරතෙමේ; ඔතරණොනාම, ඔතරණ හාරනම්වේ (චශබ්දයෙන් ගාථායෙහි නොකියනලද්දවූ සුඤ්ඤත විමොක්‍ෂමුඛාදීන්ගේ සංග්‍රහයවේ.)

**ඔතරණහාරයයි.**

---

(13) ගාථායං (දෙවතා සංයුත්තාදියෙහි බොහෝසෙයින් ගාථාබන්ධනවශයෙන් විචාළහෙයින්) ගාථාරූඪ කරණලද්දවූ; පඤ්හෙ, දැනගණුකැමති අර්ථයක්; විස්සජ්ජිතම්හි (බුද්ධාදීන් විසින්) විසඳන ලද කල්හි; යංආරබ්භ, යම් අර්ථයක් අරභයා; පුච්ඡිතා (ඒ ගාථාව) විචාරණලද්දීද (තස්ස අත්ථස්ස, ඒ අර්ථයාගේ) සුද්ධා සුද්ධ පරික්ඛා, (පදය සොධනය කරණලද්දේය ආරම්භය සොධනය නොකරණලද්දේය පදයත් සොධනය කරණලද්දේය ආරම්භයත් සොධනය කරණලද්දේයයි මෙසේ පද පදාර්ථ ප්‍රශ්න විසර්ජනා ආරම්භයන පඤ්චාර්ථයන්ගේ) සොධ්‍යා සොධ්‍යභාවය සොයන්නාවූ; සොහාරො, ඒ හාරතෙමේ; සොධනොනාම, සොධනහාරනම්වේ

**සොධනහාරයයි.**

---

(14) යෙධම්මා, යම් ධර්‍මකෙණෙක්; එකත්තතාය (දුඃඛසමුදයාදි) සාමාන්‍යයෙන්ද (මෙහි එක ශබ්දය සමාන ශබ්දපර්‍ය්‍යායයි) වෙමත්තතාය (ජාතිජරාකාම භවතණ්හාදි) විශෙෂවශයෙන්ද; නිද්දිට්ඨා (සූත්‍රයෙහි) දෙශනාකරණලද්දාහුවෙද්ද; තෙ, ඒ ධර්‍මයෝ; නවිකප්පයිතබ්බා (කවරඅර්ථයක් සාමාන්‍යද කවර අර්ථයක් විශෙෂද්‍යයි මෙසේ සාමාන්‍ය විශෙෂවශයෙන්) කල්පනානොකට යුත්තාහුය (කුමක් හෙයින්දයත්? සාමාන්‍ය විශෙෂවශයෙන් ව්‍යවහාරයක් නැතිහෙයින්ද කාලදිශා විශෙෂාදීන්ගේමෙන් අපෙක්‍ෂා සිද්ධිය නොවනහෙයින්දවේ යම්සේ අද ඊයේ පෙරෙය යනාදීන් කියනු ලබන්නාවූ කාලවිශෙෂයෝ දවසක්හුගේ ඉක්මීමෙන් අනවස්ථිත ස්වභාව ඇත්තාහුවෙද්ද පූර්වාදි දිශාවෝත් ඒ ඒ දිගට යාමෙන් අනවස්ථිතවෙද්ද මේ දූකයයි කියනලද්ද ජාත්‍යාදීන්ගේ අපෙක්‍ෂාවෙන් සාමාන්‍යවූයේද සත්‍යා පෙක්‍ෂාවෙන් විශෙෂවේ සමුදය සත්‍යාදියෙහින් මෙසේමැයි) එසොහාරො

(මෙසේ සූත්‍රාගත ධර්මයන්ගේ අවිකල්පනවශයෙන් සාමාන්‍ය විශෙෂය ප්‍රකාශකිරීම ලක්‍ෂණකොට ඇත්තාවූ) මේ හාරතෙමේ; අධිඨානො, අධිඨාන හාරනම්වේ.

### අධිඨාන හාරයයි.

(15) යෙධම්මා, අවිජ්ජාදි යම් ප්‍රත්‍යය ධර්මකෙනෙක්; යංධම්මං, සංස්කාරාදි යම් ප්‍රත්‍යයොත්පන්න ධර්මයක්; පච්චය පරම්පරතො, සහජාත ප්‍රත්‍යය භාවයෙන් හා මතුවත්තෙහි පරම්පරා ප්‍රත්‍යය භාවයෙන්ද (හෙවත් සුදුසු නාමරූප ධර්ම පරම්පරාවන් ඝටනය කිරීම්වශයෙන් උපකාරවී) හෙතුං (ඒ යථොක්ත ප්‍රත්‍යය සංඛ්‍යාතවූ ජනකාදි භෙදභින්න) හෙතුව; ආකඩ්ඪියාන, සූත්‍රයෙන් නිර්ධාරණයකොටගෙණ (හෙවත් ඇදගෙණ) ජනයන්ති, හටගන්වද්ද; එසොහාරො (මෙසේ සූත්‍රයෙහි ආවාවූ ධර්මයන්ගේ පරිෂ්කාර සංඛ්‍යාතවූ සභාග අධ්‍යාත්මික ජනක අසාධාරණ හෙතුධර්මයන් හා විසභාග බාහිර උපස්ථම්භක සාධාරණ ප්‍රත්‍යය ධර්මයන්ද නිර්ධාරණයකොට වර්ණනාකිරීම ලක්‍ෂණකොට ඇත්තාවූ) මේ හාරතෙමේ, පරික්ඛාරො, පරික්ඛාරහාරනම්වේ.

### පරික්ඛාරහාරයයි.

(16) යෙධම්මා, ශීලාදි යම් ධර්මකෙනෙක්; යං (ශමථව්‍යාජීවිත්තියායි) යම් සමාධ්‍යාදි ධර්මකෙනෙකුන්ට; මූලා, මුල්වන්නාහුද; තෙ, ඒධර්මයෝ; තෙසං, ඒ සමාධ්‍යාදි ධර්මයන්ට; ආරොපයිතබ්බා (ආසන්න කාරණභාවයෙන්) ආරොපනය කටයුත්තාහුය; මුනිනා, සම්බුද්ධ මුනීන්ද්‍රයන් වහන්සේ විසින්; යෙ (රාගවිරාග චෙතොවිමුක්තිය ශෛක්‍ෂය ෂට්කාමධාතු සමතික්‍රමනය යනාදි) යම් ධර්මකෙනෙක්; එකත්ථා (අනාගාමි ඵල සංඛ්‍යාත අර්ථයෙන්) එකාර්ථහයි, පරිදීපිතා, ප්‍රකාශකරණලද්දාහුද; තෙසං, ඒ ධර්මයන්ගේ ("අඤ්ඤදඤ්ඤ මඤ්ඤදඤ්ඤ වෙවචනභාවෙන,, යනු පාඨශෙෂයි. අන්‍යොන්‍ය වෛවචන භාවයෙන්) ආරොපයිතබ්බා, ආරොපනය කටයුත්තාහුය (යනු සම්බන්ධයි-මෙහි සමාරොපනයද සූත්‍රයෙහි කියනලද ධර්මයන්ගේ වශයෙන් හෝ නිර්ධාරණවශයෙන් හෝ ගණු ලබන්නාවූ ත්‍රිවිධ ශික්‍ෂා සංඛ්‍යාත ශීලාදිස්කන්ධත්‍රයගේ පර්‍ය්‍යායාන්තරයන් ප්‍රකාශකිරීමෙන් භාවනා පාරිපූරි කථනයද භාවනා පාරිපූරියද ප්‍රහාතව්‍ය ධර්මයාගේ ප්‍රහාණයෙන්වේනුයි ප්‍රහාණ සමාරොපනයයි අර්ථවශයෙන් දක්වන ලද්දේමවේ) එසොහාරො (සූත්‍රයෙහි ආවාවූ ධර්මයන්ගේ පදඨාන වෙවචන භාවනා පහාන සමාරොපනයන් සෙවීම ලක්‍ෂණකොට ඇත්තාවූ) මේ හාරතෙමේ; සමාරොපනො, සමාරොපන හාරනම්වේ.

### සමාරොපනහාරයයි.

(1) තණ්හඤ්ච (සූත්‍රයෙහි ආවාවූහෝ අර්ථවශයෙන් නිර්ධාරණය කිරීම්වශයෙන් ගන්නාලද්දාවූ හෝ) තෘෂ්ණාවද; අවිජ්ජඤ්ච, එසේම ගන්නාලද අවිද්‍යාවද; යො, යම් සංවර්ණනා විශෙෂයක්තෙමේ; නෙති, සංක්ලෙශ පක්‍ෂයට පමුණුවාද (හෙවත් සංක්ලෙශවශයෙන් සූත්‍රාර්ථයෙහි යොදන්නේවේද) සමථෙන, සමාධියෙන්ද; විපස්සනාය, ප්‍රඥාවෙන්ද (යොනෙති, යම්සංවර්ණනා විශෙෂයක් තෙමේ වොදානපක්‍ෂ

සට පමුණුවාද (හෙවත්) වොදානවශයෙන් සූත්‍රාර්ථය යොදන්නේ වේද; සංදෙවගියොපසීහා (එසේ සූත්‍රාර්ථ එලවන්නේද තෘෂ්ණාඅවිද්‍යාවෝ භව මූලක බැවින් සමුදය සත්‍යයයි කියාද සෙසු ත්‍රෛභූමකධර්මයෝ දුඃඛසත්‍යයයි කියාද සමථ විදර්ශනාවෝ මාර්ගසත්‍යයයි කියාද ඒ මාර්ගසත්‍යය කාරණකොටගෙණ පැමිණියයුතුවූ අසංඛත ධාතුතොමෝ නිරොධ සත්‍යයයි කියාද මෙසේ චතුඃසත්‍යයෙන් යොදා අර්ථවර්ණනා කරන්නාවූ) අයංනයො, (මේ න්‍යායතෙමේ, නන්දියාවත්තො) තෘෂ්ණා අවිද්‍යාවන් කාරණකොටගෙණ සංක්ලෙශපක්ෂයෙහි සූත්‍රාර්ථයද සමථවිදර්ශනාවන් කාරණකොටගෙණ වොදාන පක්ෂයෙහි සූත්‍රාර්ථයද චතුස්සත්‍යය හා යොදා අර්ථබෙදීම ලක්ෂණකොට ඇත්තාවූ) නන්ද්‍යාවර්තන්‍යාය නම්වේ.–

## නන්ද්‍යාවර්තන්‍යායයි.

(2) අකුසලෙ, (දොළොස්පදයකින් හා සතරපදයකින් සංග්‍රහ කරණලද්දවූ සියළු අකුශල ධර්මයන්; සමූලෙහි (ලොභ ද්වෙෂ මොහ සංඛ්‍යාත) ස්වකීය මූලයන්ගෙන්ද; කුසලෙ, සියළු චාතුර්භූමක කුශල ධර්මයන්; කුසලමූලෙහි, අලොභ අද්වෙෂ අමොහ සංඛ්‍යාත කුශල මූලයන්ගෙන්; භූතං, (කුසලා කුසලය මායාමරීචි ආදීන්මෙන් අභූත නොවනහෙයින්) භූතවූද; තථං, (සබ්බසටාදීන්මෙන් සම්මුති සත්‍ය නොවනහෙයින්) තථ්‍යවූද; අවිතථං (කුසලා කුසලයන්ගේ ඉෂ්ටානිෂ්ට විපාකදීමෙහි නොවරදනාහෙයින් අවිතථවූද (අර්ථය) යො, යම්න්‍යායක්තෙමේ; නෙති, එළවාද (නොහොත්) සමූලෙහි, ස්වකීය අකුශලමූලයන්ගෙන්; භූතං, සත්‍යවූද; තථං, එසේමවූද; අවිතථං, අවිසංවාදකවූද; අකුසලෙ, අකුශලයන්ද; කුසලමූලෙහි, කුශල මූලයන් විසින්, භූතං, සත්‍යවූද; තථං, එසේමවූද; අවිතථං, අවිසංවාදකවූද; කුසලෙ, කුශලයන්, යො, යම් න්‍යායක්තෙමේ; නෙති, එළවාද; (මේ ත්‍රිවිධපදයන් කුශලා කුශලයන්ට විශෙෂණවනකල්හි කර්මකාරක බහුවචන වශයෙන්ද, පළමුවන යොජනාවෙහි භාවනපුංසකව ශයෙන්ද යෙදිය යුතුයි) තංනයං, ඒ අකුශලමූලයෙන් සංක්ලෙස පක්ෂයාගේද කුශලමූලයෙන් වොදානපක්ෂයාගේද සූත්‍රාර්ථය චතුස්සත්‍යයෙහි යෙදීම්වශයෙන් අර්ථඑළවීම ලක්ෂණකොට ඇත්තාවූ) නය ක්‍රමය; තිපුක්ඛලං, ත්‍රිපුෂ්කලයයි; ආහු, කීහු.–

## තිපුක්ඛලන්‍යායයි.

(3) විපල්ලාසෙහි, අසුභයෙහි සුභයයි යනාදිවශයෙන් පැවති සතර විපල්ලාස ධර්මයන් කාරණකොටගෙණ; සංකිලෙසෙ, සංක්ලෙශ පක්ෂයෙහිද (හෙවත්) කෙලෙස් සහිතවූ ධර්මයෙහිද; ඉන්ද්‍රියෙහි, ශ්‍රද්ධාදිපඤ්චෙන්ද්‍රිය ධර්මයන් කාරණකොටගෙණ; සද්ධම්මෙ, ප්‍රතිපත්ති ප්‍රතිවෙධ සද්ධර්ම සංඛ්‍යාත වොදානපක්ෂයෙහිද; යො, යම් න්‍යායක්‍රමයක්තෙමේ; නෙති, චතුස්සත්‍යයෙහි යෙදීම්වශයෙන් අර්ථඑළවාද; නයවිදූ, යථාර්ථනය දක්ෂ පණ්ඩිතතෙමේ; එතංනයං, මේ නය ක්‍රමය; සීහවික්කීළිතං, සිංහවික්‍රීඩිතයයි, ආහු, කීහු.–

## සිංහවික්‍රීඩිත න්‍යායයි.

(4) තහිං තහිං වෙය්‍යාකරණෙසු, ඒ ඒ අට්ඨනය යොදනපිණිස ඒ ඒ සූත්‍රයාගේ අභිපිසර්ජනාවෙහි; යෙකුසලා කුසලා, වොදාන සංක්ලෙශිකවූ ඒ ඒ න්‍යායගේ දිශාභූතවූ යම් ධර්‍මකෙනෙක්; වුත්තා, සූත්‍රයෙහි නිර්ධාරණය කොට කියනලද්දාහුද; තෙ (යම් යම් පරිද්ද කින් කියනලද්දාවූ) ඒ ධර්‍මයෝ, මනසාඑව, සිතින්ම; ඔලොකයතෙ, (මේ ප්‍රථම දිශාය මේ විතීය දිශායයි යනාදීවශයෙන් ඒ ඒ න්‍යාය ගේ දිශාභාවයෙන්) සොයන්නේවේද; තංතු, ඒ ධර්‍මයාගේ බැලීමට නාහී; දිසාලොචනංආහු; දිසාලොචන න්‍යායයිකිවාහුය.

**දිසාලොචන න්‍යායයි.**

---

(5) දිසලොචනෙන, දිසාලොචන න්‍යාය කරණකොටගෙණ; දිසාවිලොකයිත්වා, ප්‍රථම දිශාදී භාවයෙන් දිශාවන් සොයා; උක්ඛිපිය, (අඞ්කුස්සෙන්මෙන්) උද්ධරණයකොට (හෙවත්) ප්‍රධානධර්‍මයන් සූත්‍රයෙ න් නිර්ධාරණයකොට; යං, යම්න්‍යායක්තෙමේ; සබ්බෙකුසලා කුසලෙ, සියළු කුශලා කුශල ධර්‍මයන්; සමානයති, මනාකොට එළවාද; අයංනයො, මේ න්‍යායතෙමේ; අඞ්කුසොනාම, අඞ්කුසනම්වේ.

**අඞ්කුස න්‍යායයි.**

---

| පිට | පෙල | | අසුබ | සුබ |
|---|---|---|---|---|
| 2 | 18 | — | ත්‍රිවිධ | ත්‍රිවිධ |
| 2 | 26 | — | ත්‍රිවිද | ත්‍රිවිඥ |
| 5 | 6 | — | සමාධියයි | සමාධියයි |
| 6 | 4 | — | නොකලහැකකේ | නොකලහැක්කේ |
| ,, | 7 | — | පටිසම්භිද | පටිසම්භිද |
| 7 | 4 | — | ඥෙයය | ඥෙයය |
| ,, | 5 | — | ප්‍රතවෙධය | ප්‍රතිවෙධය |
| ,, | 9 | — | සෙස්සෙහත් | සෙස්සෙහිත් |
| ,, | 9 | — | නශචය | නිශචය |
| ,, | 20 | — | වියන් | විසින් |
| 8 | 5 | — | ශොධිත | සොධිත |
| 9 | 6 | — | සිවජ්කත | සච්ඡිකත |
| ,, | 29 | — | බිතානං | බිතානං |
| ,, | 31 | — | බොසානං | බොතානං |
| ,, | 28 | — | අලාර | ආලාර |
| 13 | 24 | — | පචධසවිර | පචපිධසවිර |
| 16 | 10 | — | ක්ෂමානොකල | ක්ෂමාකලනොකල |
| 17 | 25 | — | අභිකථ | අභිකථා |
| 18 | 1 | — | රුලගහනා | රුල්හගහනා |
| ,, | 34 | — | ඇභිහෙිය | අභියෙහි |
| 18 | 20 | — | ආදීන | ආදීන |
| 19 | 35 | — | කරියසා | කරියසං |
| 26 | 33 | — | සච්ජිකා | සච්ඡිකා |

| පිට | පෙල | | අසුබ | සුබ |
|---|---|---|---|---|
| 29 | 24 | — | සමාධෙන්ද්‍රය | සමාධෙන්ද්‍රිය |
| 31 | 32 | — | කියන | කියන |
| 32 | 12 | — | ලෞකික | ලෞකික |
| 33 | 11 | — | එලාධි | එලාධි |
| ,, | 16 | — | ආණහී | ආණාගී |
| 36 | 6 | — | පුව්ජීතං | පුවජිතං |
| ,, | 33 | — | පසන්නාමිහි | පසන්නාමිහි |
| 38 | 3 | — | සමෙඑලං | සමංඑලං |
| 40 | 25 | — | තෛම | තෙම |
| ,, | 26 | — | වීභාගය | විභාගය |
| 44 | 22 | — | නිදර්ශීතාව්‍ය | නිදර්ශිතාව්‍ය |
| 45 | 8 | — | කම්තාඵ | කම්මඵ |
| ,, | 21 | — | නිස්සීතං | නිස්සිතං |
| ,, | 31 | — | නීස්සීත චිත්ත | නිස්සිතචිත්ත |
| ,, | 36 | — | වසනාභාගිය | වාසනාභාගිය |
| 46 | 1 | — | වසනාභාගිය | වාසනාභාගිය |
| ,, | 14 | — | චතුබ්‍යූහ | චතුබ්‍යූහ |
| 46 | 15 | — | එකම්හි | එකම්හි |
| 49 | 31 | — | ධම්මවිහත්තියයි | ධම්මවිභත්තියයි |
| ,, | 23 | — | මඳවතෙ | මුච්චතෙ |
| ,, | 26 | — | විසජ්ජීතා | විසජ්ජිතා |
| 52 | 22 | — | ජනයන්තී | ජනයන්ති |
| ,, | 29 | — | අචීකඛතීති | ආචිකඛතීති |
| 53 | 22 | — | යෙවෙකත්තා | යෙවෙකත්ථා |
| ,, | 24 | — | පහාණාය | පහාණාය |
| ,, | 31 | — | සාර | හාර |
| 56 | 9 | — | සබෙබහි | සචෙච්හි |
| 65 | 40 | — | චොදනා | චොදනා |
| 66 | 25 | — | මනීනාලද්දක් | මනිනාලද්දක් |
| 68 | 18 | — | අපවගීය | අපවගීය |
| ,, | 21 | — | අන්‍යාසංඥය | අන්‍යසංඥය |
| ,, | 25 | — | වාක්‍යයාවග් | වාක්‍යයාගේ |
| 69 | 3 | — | දූරසඵානවූද | දූරසඵවූද |
| 70 | 27 | — | සංටණිනා | සංවණිනා |

හ්‍රස්වදීර්ඝාදිය සුදුසු පරිද්දෙන් ශුධකරගතයුතුයි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු